# 2

# ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

## 2.1 සමස්ත නිරීක්ෂණ

*ශ්‍රී ලංකා ආර්ථිකය, කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථික හා සමාජයීය කටයුතුවලට පෙර නොවූ විරූ බාධා ඇති වූ පසුබිමක, පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 3.6කින් පහත වැටුණි. වසංගතය මෙන්ම එය පාලනය කිරීම සඳහා පැන වූ සීමාවන් ද හේතුවෙන් ලොව පුරා ආර්ථිකයන්ගේ වර්ධනය පහත වැටුණු අතර, ශ්‍රී ලංකාවට ද ඉන් අත්මිදීමට නොහැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ ඇතැම් දර්ශක, 2020 වසරේ දී, විශේෂයෙන්ම දෙවන කාර්තුවේ දී, රටපුරා බලපැවැත්වුණු සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීමෙන් ඇති වූ අහිතකර බලපෑම පිළිබිඹු කරමින්, ඒවායේ පහළම අගයන් වාර්තා කරන ලදී. වසංගත තත්ත්වය, සංචාරක කර්මාන්තය වටා ගොඩනැගී ඇති ආර්ථික පද්ධතියට මෙන්ම භෞතික සහභාගිත්වය අවශ්‍ය වන ඉදිකිරීම්, නිෂ්පාදන කර්මාන්ත සහ ප්‍රවාහනය වැනි ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද දැඩි ලෙස බලපාන ලදී. ඒ අනුව, ඉදිකිරීම් සහ නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු පසුබෑම, කර්මාන්ත කටයුතුවල පහත වැටීමට මූලිකවම හේතු වූ අතර, සේවා කටයුතු පහත වැටීම කෙරෙහි ප්‍රවාහනය, වෙනත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයුම් සේවා පහළ යෑම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. මේ අතර, සමාජ හා ආර්ථික කටයුතු සීමා කරන ලද කාලසීමාවල දී පවා පැවති දිරිගන්වනසුළු ප්‍රතිපත්ති හේතුවෙන් බොහෝ කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගිය ද වසර තුළ දී සමස්ත කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීමක් වාර්තා කරන ලදී. වසංගතයෙන් පසු දේශීයව හා ගෝලීය වශයෙන් ආර්ථිකය ප්‍රකෘතිමත් වීමට ගතවන කාලය පිළිබඳ පැවති අවිනිශ්චිතතාවය හමුවේ 2020 වසරේ දී ආයෝජන වියදම් පහත වැටුණු අතර පරිභෝජන වියදමෙහි ද අඩු වර්ධනයක් දක්නට ලැබුණි. වසංගතය සමඟ ලොවපුරා ආර්ථිකයන් දුර්වල වීම හේතුවෙන් විදේශීය ඉල්ලුම ද වසර තුළ දී පහත වැටුණි. එසේ වුවද, වසර තුළ දී අපනයන පහත වැටීම මධ්‍යයේ ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි ඇති වූ පසුබෑම යම්තාක් දුරකට පාලනය කිරීමට අත්‍යවශ්‍ය නොවන ආනයන අධෛර්යමත් කිරීම උපකාරී විය. 2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ දී ජාතික ඉතුරුම්වල දක්නට ලැබුණු සියයට 3.6ක පහත වැටීම හමුවේ වුවද ආයෝජන වියදම සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය අඩු විය. කොවිඩ්-19 වසංගතය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ඇති කළ අහිතකර බලපෑමට සමගාමීව, ව්‍යුහාත්මක ගැටලු සහ අසමානතාවන් තවදුරටත් තීව්‍ර කරමින්, ශ්‍රම වෙළඳපොළ තුළ දිගු කලක් තිස්සේ පවත්නා අස්ථාවරයන් සහ අවිනිශ්චිතතාවන් නිරාවරණය විය. ඒ අනුව, 2020 වසරේ දී කුටුම්භ ආදායම් කෙරෙහි අහිතකර ලෙස බලපාමින්, සේවා වියුක්ති අනුපාතිකය, 2009 වසරින් පසුව වාර්තා වූ ඉහළම අගය වන සියයට 5.5ක් දක්වා ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වයේ පහළ යෑම හේතුවෙන් ශ්‍රම බලකාය සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, අසමානතාවන් තවදුරටත් තීව්‍ර කරමින් 2020 වසරේ දී ස්ත්‍රීන්, තරුණ තරුණියන් සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් පුද්ගලයන් අතර සේවා වියුක්ති අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට අමතරව, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් තියුණු ලෙස පහත වැටුණු අතර, විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් කෙරෙහි ද වසංගතය දැඩි ලෙස බලපාන ලදී.*

## 2.2 දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)[1], දළ ජාතික ආදායම (ද.ජා.ආ.) සහ ඒක පුද්ගල ද.දේ.නි.

2020 වසරේ දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම පෙන්නුම් කරමින් ස්ථාවර වෙළඳපොළ මිල (ස්ථාවර මිල) අනුව ඇස්තමේන්තු කළ ද.දේ.නි., 2019 වසරෙදී වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව රුපියල් බිලියන 9,530.6ක් දක්වා සියයට 3.6කින් පහත වැටුණි. මේ අතර, පවත්නා වෙළඳපොළ මිල (පවත්නා මිල) අනුව ද.දේ.නි. 2020 වසරේ දී රුපියල් බිලියන 14,973.0 (එ.ජ. ඩොලර් බිලියන 80.7) ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 2019 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 15,013.0 (එ.ජ. ඩොලර් බිලියන 84.0) ක අගය හා සැසඳීමේ දී සියයට 0.3ක පහත වැටීමකි. ඒ අනුව, ද.දේ.නි. ගම්‍ය

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) (අ)(ආ)**

| ආර්ථික කටයුතු | වර්ධනය (%) | | ද.දේ.නි. හි වර්ධනයට දායකත්වය (%) | | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **1.0** | **- 2.4** | **0.1** | **- 0.2** | **6.9** | **7.0** |
| ධාන්‍ය වගාව (වී හැර) | - 10.5 | 41.3 | - 0.01 | 0.04 | 0.1 | 0.2 |
| වී වගාව | 5.4 | 5.7 | 0.04 | 0.04 | 0.8 | 0.8 |
| එළවළු වගාව | - 3.6 | 10.1 | - 0.02 | 0.05 | 0.5 | 0.6 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 9.9 | 17.0 | 0.00 | 0.00 | 0.0 | 0.0 |
| පලතුරු වගාව | 8.5 | 6.2 | 0.05 | 0.04 | 0.6 | 0.7 |
| තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, කැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 17.7 | - 10.2 | 0.11 | - 0.07 | 0.7 | 0.6 |
| තේ වගාව | - 1.3 | - 7.1 | - 0.01 | - 0.05 | 0.7 | 0.6 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | - 25.8 | 21.6 | - 0.00 | 0.00 | 0.0 | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | - 1.0 | 3.3 | - 0.01 | 0.02 | 0.7 | 0.7 |
| රබර් වගාව | - 9.5 | 4.6 | - 0.02 | 0.01 | 0.2 | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 0.5 | 1.8 | 0.00 | 0.00 | 0.2 | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 2.1 | - 4.9 | 0.01 | - 0.03 | 0.7 | 0.6 |
| පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | - 9.2 | - 0.5 | - 0.01 | - 0.00 | 0.1 | 0.1 |
| වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | - 0.1 | - 8.1 | - 0.00 | - 0.05 | 0.6 | 0.6 |
| ධීවර කර්මාන්තය | - 4.3 | - 16.6 | - 0.05 | - 0.19 | 1.1 | 1.0 |
| **කර්මාන්ත** | **2.6** | **- 6.9** | **0.7** | **- 1.8** | **26.4** | **25.5** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.8 | - 12.5 | 0.07 | - 0.29 | 2.3 | 2.1 |
| නිෂ්පාදන කර්මාන්ත | 1.8 | - 3.9 | 0.28 | - 0.60 | 15.6 | 15.5 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 4.0 | - 1.6 | 0.04 | - 0.02 | 1.1 | 1.1 |
| ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 5.5 | 4.8 | 0.01 | 0.01 | 0.2 | 0.2 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 7.3 | - 1.0 | 0.02 | - 0.00 | 0.3 | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 4.0 | - 13.2 | 0.27 | - 0.91 | 6.9 | 6.2 |
| **සේවාවන්** | **2.2** | **- 1.5** | **1.3** | **- 0.8** | **57.5** | **58.7** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 1.7 | - 5.0 | 0.40 | - 1.15 | 23.0 | 22.7 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 15.7 | 13.7 | 0.10 | 0.10 | 0.7 | 0.9 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 2.4 | 5.0 | 0.34 | 0.71 | 14.2 | 15.4 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 2.2 | - 5.9 | 0.25 | - 0.67 | 11.4 | 11.1 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 2.3 | 2.0 | 0.19 | 0.17 | 8.1 | 8.6 |
| **මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය** | **2.2** | **- 3.1** | **2.0** | **- 2.8** | **90.8** | **91.2** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 2.4 | - 8.0 | 0.22 | - 0.74 | 9.2 | 8.8 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **2.3** | **- 3.6** | **2.3** | **- 3.6** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | - 6.3 | - 44.2 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **2.1** | **- 5.0** | | | | |


(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


2

**2.1 රූප සටහන**

**2020 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස**




**2.2 රූප සටහන**
**වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.

**2.3 රූප සටහන**
**2020 වසර තුළදී ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගයෙහි ප්‍රතිශතාත්මක දායකත්වය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.

මිල අවධමනකය 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.7ක සිට 2020 වසරේ දී සියයට 3.4ක් දක්වා ඉහළ යන ලදී.

**ද.දේ.නි.ට ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැලපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන ද.ජා.ආ. පවත්නා මිල අනුව 2019 වසරේ දී වාර්තා කළ සියයට 4.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 0.1ක සුළු පහළ යෑමක් වාර්තා කරන ලදී.** ද.ජා.ආ.හි මෙම පහත වැටීම කෙරෙහි ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායමෙහි වර්ධනය හමුවේ වුවද පවත්නා මිල අනුව ද.දේ.නි.හි පහත වැටීම හේතු විය.

**ඒක පුද්ගල ද.දේ.නි., 2019 වසරේ දී පැවති රුපියල් 688,573 (එ.ජ. ඩොලර් 3,852) ක අගය හා සැසඳීමේ දී 2020 වසරේ දී රුපියල් 683,106 (එ.ජ. ඩොලර් 3,682) ක් ලෙස වාර්තා විය.** රුපියල් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි.හි පහත වැටීම කෙරෙහි පවත්නා මිල අනුව ද.දේ.නි.හි පහළ යෑම මූලිකවම බලපාන ලද අතර, එ.ජ. ඩොලර් අගය අනුව ගණනය කළ ඒක පුද්ගල ද.දේ.නි.හි පහත වැටීම සඳහා පවත්නා මිල අනුව ද.දේ.නි.හි පහත වැටීම මෙන්ම වාර්ෂික සාමාන්‍ය පදනම මත එ.ජ. ඩොලරයට සාපේක්ෂව දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම ද බලපාන ලදී. මේ අතර, 2019 වසරේ දී රුපියල් 668,748 (එ.ජ. ඩොලර් 3,741) ක් වූ ඒක පුද්ගල ද.ජා.ආ. 2020 වසරේ දී රුපියල් 664,620 (එ.ජ. ඩොලර් 3,582) ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## 2.3 ආයතනික අංශයන්හි දායකත්වය

**2020 වසරේ දී පවත්නා මිල අනුව ඇස්තමේන්තු කළ ආර්ථිකයේ සමස්ත එකතු කළ අගය සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය තවදුරටත් වැඩිම දායකත්වය දක්වා ඇත.** ඒ අනුව, 2020 වසරේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය සියයට 0.4ක සුළු වර්ධනයක් වාර්තා කරමින් ආර්ථිකයේ සමස්ත එකතු කළ අගය සඳහා සියයට 48.6ක දායකත්වයක් දක්වන ලදී. මේ අතර, මූල්‍ය නොවන ආයතන අංශය සියයට 2.5ක පහත වැටීමක් වාර්තා කළ අතර, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය පිළිවෙළින් සියයට 7.7කින් සහ සියයට 17.7කින් වර්ධනය විය. 2020 වසරේ දී ප්‍රධාන ආර්ථික කටයුතු සඳහා ආයතනික අංශවල දායකත්වය සැලකීමේ දී, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය කෘෂිකාර්මික සහ සේවා කටයුතුවල එකතු කළ අගය සඳහා තවදුරටත් වැඩිම දායකත්වය සපයන ලද අතර මූල්‍ය නොවන ආයතන අංශය කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය සඳහා වැඩිම දායකත්වයක් සපයන ලදී.

## 2.4 නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

### කෘෂිකර්මාන්තය

**ධීවර කටයුතු, තෙල් සහිත පලතුරු භෝග (පොල් ඇතුළුව) වගාව, තේ වගාව, වන වගාව සහ සත්ත්ව නිෂ්පාදන ඇතුළු ඇතැම් ප්‍රධාන කෘෂිකාර්මික කටයුතුවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම හේතුවෙන් කෘෂිකර්මාන්තයේ එකතු කළ අගය 2019 වසරේ දී වාර්තා කළ සියයට 1.0ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 2.4ක පහත වැටීමක් වාර්තා කරන ලදී.** කෘෂිකාර්මික කටයුතුවල මෙම පහත වැටීම කෙරෙහි කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතැම් වගා

කටයුතු සහ ධීවර කටයුතු කෙරෙහි ඇති කළ අවහිරතා බොහෝ දුරට හේතු විය. මෙහිදී වසංගත තත්ත්වය, විශේෂයෙන්ම මාර්තු මාසය තුළ දී එහි පළමු රැල්ල හේතුවෙන් තේ නිෂ්පාදනය කෙරෙහි සහ පළමු රැල්ල තුළ දී මෙන්ම දෙවැනි රැල්ලත් සමග වසරේ අවසාන කාර්තුවේ දී ද ධීවර කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මේ අතරතුර කෘෂිකාර්මික කටයුතුවලට ධනාත්මක දායකත්වයක් සපයමින් එළවළු, වී, ධාන්‍ය වර්ග, පළතුරු සහ කුළුබඩු බෝග වගාවන් වසර තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර දිරිගන්වනසුළු ප්‍රතිපත්ති, රජය විසින් හඳුන්වා දුන් විශේෂිත ක්‍රියාමාර්ග මෙන්ම හිතකර කාලගුණ තත්ත්වය ද වසංගතය නිසා කෘෂිකාර්මික කටයුතුවල ඇති වූ පසුබෑම අවම කිරීමට දායක විය.

## කෘෂිකාර්මික නිෂ්පාදනය

**කෘෂිකාර්මික හා මත්ස්‍ය අංශයේ නිමැවුම පමණක් මනිනු ලබන කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශකය,[2] 2020 වසරේ දී වී, රබර් සහ අනෙකුත් බෝගවලට (වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු) අදාළ උප දර්ශක ඉහළ යෑම හේතුවෙන් සියයට 2.3ක වර්ධනයක් වාර්තා කළේය.** කෙසේ වුව ද, තේ, පොල්, පශු සම්පත් සහ ධීවර කටයුතු උප දර්ශක පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය.

### වී

**යහපත් කාලගුණික තත්ත්වය සහ හිතකර රාජ්‍ය ප්‍රතිපත්ති මගින් ලද සහාය හේතුවෙන් 2020 වසරේ දී වී නිෂ්පාදනයෙහි මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වාර්තා විය.** 2019 වසරේ දී ඉතා ඉහළ අස්වැන්නක් වාර්තා කළ වී නිෂ්පාදනය, 2020 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 5.1ක් දක්වා සියයට 11.5කින් තවදුරටත් ඉහළ ගියේය. සමස්ත වාර්ෂික නිෂ්පාදනයෙන් සියයට 62කට පමණ දායක වූ 2019/2020 මහ කන්නයේ නිෂ්පාදනය සියයට 4.0කින් ඉහළ ගිය අතර, 2020 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 26.6කින් ඉහළ ගියේය. වී වගාව සඳහා නොමිලේ පොහොර සැපයීම සහ වී සඳහා සහතික කළ මිලක් ලබා දීම මගින් රජය විසින් සිදු කරන ලද මැදිහත්වීම 2020 වසරේ වී නිෂ්පාදනයේ මෙම සැලකිය යුතු ඉහළ යෑමට දායක විය. තවද, රජයේ මෙම මැදිහත්වීම් හේතුවෙන් වී වගා කරන ගොවි ප්‍රජාවගේ ගෘහ ඒකකවල ආදායම ඉහළ ගිය අතර, එමගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු විය. 2020 වසරේ වී නිෂ්පාදනය, සහල් මෙට්‍රික් ටොන් මිලියන 3.3කට සමාන වන අතර, එය දළ වශයෙන් මාස 17ක දේශීය සහල් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.[3]

**2.2 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක**
**(2007-2010 = 100)**

| අයිතමය | 2019 (අ) | 2020 (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2018/19 (අ) | 2019/20 (ආ) |
| **කෘෂිකාර්මික සහ මත්ස්‍ය** | **126.0** | **129.0** | **-0.1** | **2.3** |
| 1. කෘෂිකාර්මික | 120.8 | 129.1 | 1.0 | 6.9 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 113.3 | 124.0 | 0.7 | 9.5 |
| වී | 122.8 | 136.9 | 16.9 | 11.5 |
| තේ | 96.3 | 89.5 | -1.3 | -7.1 |
| රබර් | 55.7 | 58.3 | -9.5 | 4.6 |
| පොල් | 108.9 | 98.6 | 17.6 | -9.5 |
| අනෙකුත් බෝග | 136.3 | 167.9 | -10.8 | 23.2 |
| එයින්, එළවළු | 123.0 | 142.7 | -15.3 | 16.0 |
| පලතුරු | 150.1 | 199.6 | -18.4 | 33.0 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 118.9 | 141.1 | -11.4 | 18.6 |
| 1.2 පශු සම්පත් | 180.5 | 169.5 | 2.3 | -6.1 |
| **2. මත්ස්‍ය** | **151.6** | **128.5** | **-4.0** | **-15.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව


**2019 වසරේ දී මෙන්ම, 2020 වසරේ දී ද වී නිෂ්පාදනය ඉහළ යාමක් සිදු වුව ද, පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී විවෘත වෙළඳපොළේ වී මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි.** 2020 වසරේ දී නාඩු වී සඳහා විවෘත වෙළඳපොළ වී මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 47.73ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 11.0කින් ඉහළ ගිය අතර, සම්බා වී සඳහා විවෘත වෙළඳපොළ වී මිලෙහි සාමාන්‍යය ද කිලෝග්‍රෑමයකට රුපියල් 50.56ක් දක්වා සියයට 18.2කින් ඉහළ ගියේය. රජය විසින් වී මිලදී ගැනීම සඳහා සහතික කරන ලද මිල ඉහළ නැංවීම සහ සහතික කළ මිලට වඩා වැඩි මිලට වී තොග මිලදී ගැනීම සඳහා පෞද්ගලික මෝල් හිමියන් අතර ඇති වූ තරගය වී මිල ගණන් මෙසේ ඉහළ යාමට හේතු විය. සම්බා සහ කීරි සම්බා (වියළි) ප්‍රභේද සඳහා වී කිලෝග්‍රෑමයක් මිලදී ගැනීම සඳහා රජයේ සහතික මිල 2019 වසරේ පැවැති රුපියල් 41.00ක සිට 2020 වසරේ දී රුපියල් 50.00ක් දක්වා ඉහළ නංවන ලද අතර, නාඩු (වියළි) වී කිලෝග්‍රෑමයක් සඳහා එම මිල ගණන් 2019 වසරේ දී පැවැති රුපියල් 38.00ක සිට 2020 වසරේ දී රුපියල් 50.00ක් දක්වා වැඩි කරන ලදී. මේ අතර, වැඩි තෙතමනයක් සහිත වී කිලෝග්‍රෑමයක් සඳහා සහතික කරන ලද මිල රුපියල් 44.00ක් විය.

2 කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය මගින් වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන අංශය ආවරණය නොවේ.

3 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය-2016 මත පදනම්ව ගෘහ ඒකකයන්ගේ සාමාන්‍ය සහල් පරිභෝජනය සහ 2020 මධ්‍ය වාර්ෂික ජනගහනය භාවිත කරමින් දේශීය ගෘහස්ත සහල් ඉල්ලුම ගණනය කෙරේ.

2

**2.4 රූප සටහන**
**සහල්: සැපයුම සහ ඉල්ලුම**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

මහා පරිමාණ සහල් මෝල් හිමියන් කිහිප දෙනෙකු සතුව විශාල වෙළඳපොළ බලයක් පැවතීම හේතුවෙන් සහල් සිල්ලර මිල ගණන් රජය විසින් පනවන ලද උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. 2019 වසරේ කිලෝග්‍රෑමයකට රුපියල් 102.29ක් වූ සම්බා සහල්වල සාමාන්‍ය සිල්ලර මිල, 2020 දී කිලෝග්‍රෑමයකට රුපියල් 104.37ක් විය. මේ අතර, 2019 වසරේ කිලෝග්‍රෑමයකට රුපියල් 93.48ක් වූ නාඩු සහල්වල සිල්ලර මිලෙහි සාමාන්‍යය, 2020 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 100.01ක් දක්වා ඉහළ ගියේය. තවද, ඉහළ නිෂ්පාදනයටත්, ආනයන සීමා කිරීමට ගත් ක්‍රියාමාර්ගවලටත් ප්‍රතිචාර වශයෙන් 2020 වසරේ දී සහල් ආනයනය, පෙර වසරට වඩා සියයට 34.8ක පහළ යෑමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 15,770ක් දක්වා පහත වැටුණි.

### තේ

**අහිතකර කාලගුණික තත්ත්වය සහ කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රම සැපයුමට බාධා ඇතිවීම නිසා 2020 වසරේ දී තේ නිෂ්පාදනය සියයට 7.1කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.** තේ නිෂ්පාදනය, වසරේ මුල් භාගයේ දී සියයට 18.0ක සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළ ද, වසරේ දෙවන භාගයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.9ක වර්ධනයක් ද සමඟ යථා තත්ත්වයට පත්විය. සමස්ත තේ නිෂ්පාදනයට, පිළිවෙළින්, සියයට 22කින්, සියයට 17කින් සහ සියයට 61කින් දායක වන උඩරට තේ, මැදරට තේ හා පහතරට තේ නිෂ්පාදනය 2020 වසරේ දී, පිළිවෙළින්, සියයට 1.3කින්, සියයට 0.9කින් සහ සියයට 10.5කින් පහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් තේ වගා කරන ප්‍රදේශවල පැවති නියං තත්ත්වයන් හේතුවෙන් කුඩා තේ වතු හිමියන්ගේ සාමාන්‍ය අස්වැන්න, 2019 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,938ට සාපේක්ෂව 2020 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,765ක් දක්වා අඩු විය.

**2019 වසරේ අනුරූප මිල හා සැසඳීමේ දී කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් වසර පුරා ඉහළ මට්ටමක පැවතිණි.** පෙර වසරේ කිලෝග්‍රෑමයකට රුපියල් 546.67ක් වූ තේ මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 633.85ක් දක්වා සියයට 15.9කින් ඉහළ ගියේය. 2020 වසරේ දී උඩරට තේ, මැදරට තේ සහ පහතරට තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින්, පිළිවෙළින්, සියයට 15.5කින්, සියයට 18.7කින් සහ සියයට 16.0කින් ඉහළ ගියේය. තවද, අමු තේ දළු සඳහා කුඩා වතු හිමියන් ලද මිල ගණන්වල සාමාන්‍යය 2019 වසරේ දී

**2.3 සංඛ්‍යා සටහන**
**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන**

| අයිතමය | ඒකකය | 2019 (අ) | | | 2020 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 748 | 369 | 1,117 | 752 | 456 | 1,208 |
| අස්වැන්න නෙළාගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 724 | 346 | 1,070 | 740 | 451 | 1,191 |
| අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 647 | 310 | 958 | 663 | 403 | 1,066 |
| නිෂ්පාදනය | මෙ. ටො. දහස් | 3,073 | 1,519 | 4,592 | 3,197 | 1,924 | 5,121 |
| | බුසල් දහස් | 147,256 | 72,822 | 220,078 | 153,207 | 92,218 | 245,425 |
| හෙක්ටයාරයකට ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,747 | 4,896 | 4,795 | 4,821 | 4,770 | 4,802 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 4,471 | 2,865 | 7,336 | 4,230 | 2,998 | 7,228 |
| සහල් ආනයනය (ඈ) | මෙ. ටො. දහස් | - | - | 24 | - | - | 16 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය (ඈ) | මෙ. ටො. දහස් | - | - | 35 | - | - | 23 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුළු නිෂ්පාදනය අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයකට ඵලදාව ගණනය කර ඇත.
(ඈ) වාර්ෂික අගය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 80.15ක සිට 2020 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 94.36ක් දක්වා ඉහළ ගියේය. පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 4.60ක් වූ තේ අපනයන මිලෙහි (නැ.වි.ස) සාමාන්‍යය, 2020 වසරේ දී කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 4.67ක් දක්වා සියයට 1.6කින් ඉහළ ගියේය. දේශීය නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් කොළඹ තේ වෙන්දේසිය වෙත සපයනු ලැබූ තේ ප්‍රමාණය පහත වැටීම තේ මිල ගණන් ඉහළ යෑමට යම් දුරකට හේතු වූ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ගෝලීය තරගකරුවන්ගේ තේ අපනයනය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් දේශීය අපනයනකරුවන්ට සාපේක්ෂව ඉහළ මිල ගණන් ලබා ගැනීමට හැකි විය.

### රබර්

**වසරේ දෙවන භාගයේ පැවති ආකර්ෂණීය වෙළඳපොළ මිල ගණන් සහ හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් 2020 වසරේ දී රබර් නිෂ්පාදනය සියයට 4.6ක වර්ධනයක් වාර්තා කළේය.** කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල තුළ දී පනවන ලද සංචරණ සීමා හා රබර් වගා කරන ප්‍රදේශවල පැවති වියළි කාලගුණික තත්ත්ව මධ්‍යයේ කිරි කැපීමේ දින ගණන් අඩු වීම හේතුවෙන් 2020 වසරේ මුල් භාගයේ දී රබර් නිෂ්පාදනය සියයට 10.1කින් පහළ ගිය ද, වසරේ දෙවන භාගයේ දී සාපේක්ෂ වශයෙන් යහපත් කාලගුණික තත්ත්වයක් පැවතීම හේතුවෙන් රබර් නිෂ්පාදනය සියයට 23.2කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රධාන රබර් නිෂ්පාදන කාණ්ඩයන් සැලකීමේ දී සමස්ත නිෂ්පාදනයෙන් සියයට 50කට ආසන්න දායකත්වයක් දක්වන ෂීට් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 39.1ක් දක්වා සියයට 4.6කින් වර්ධනය විය. කෙසේවෙතත්, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 17කට දායක වන ක්‍රේප් රබර් නිෂ්පාදනය 2020 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 13.0ක් දක්වා සියයට 10.2කින් පහළ ගියේය. මේ අතර, සමස්ත නිෂ්පාදනයෙන් ආසන්න වශයෙන් සියයට 33ක් පමණ වන අනෙකුත් කාණ්ඩයන්හි රබර් නිෂ්පාදනය, වසර තුළ දී කිලෝග්‍රෑම් මිලියන 26.1ක් දක්වා සියයට 14.0ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. 2020 වසරේ දී දේශීය කාර්මික අංශයේ රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 112.1ක් දක්වා අඩු වූ අතර, මුළු රබර් අපනයනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, කිලෝග්‍රෑම් මිලියන 15.8ක් දක්වා සියයට 21.3කින් ඉහළ ගියේය.

**විශේෂයෙන්, වසර අවසානය වන විට ගෝලීය වෙළඳපොළවල ස්වාභාවික රබර් මිල ඉහළ යාමේ සහාය ඇතිව කොළඹ රබර් වෙන්දේසියේ රබර් මිල ඉහළ ගියේය.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගෝලීය ඉල්ලුම අඩු වීම නිසා 2020 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ දී දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) අලෙවියක් කොළඹ රබර් වෙන්දේසිය හරහා සිදු නොවුණ ද, 2020 වසරේ දී දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 351.46ක් දක්වා සියයට 21.8කින් ඉහළ ගියේය. 2020 වසරේ දී ක්‍රේප් රබර් මිලෙහි සාමාන්‍යය, කිලෝග්‍රෑමයකට රුපියල් 359.04ක් දක්වා සියයට 18.8කින් ඉහළ ගියේය. මේ අතර, දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) සහ ක්‍රේප් රබර් වෙන්දේසි මිල ගණන්වල සාමාන්‍යය, 2020 දෙසැම්බර් මස දී, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 440.00ක් සහ කිලෝග්‍රෑමයකට රුපියල් 462.17ක් විය. රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, 2019 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.86ට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් 1.91ක් දක්වා සියයට 2.6කින් ඉහළ ගියේය. වසරේ දෙවන භාගයේ දී චීනයේ රබර් ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම, සංචරණ සීමා හේතුවෙන් තායිලන්තයේ රබර් නිෂ්පාදනය අඩු වීම හා ගිනිකොණදිග ආසියාවේ රබර් වගාවන්හි දිලීර රෝගයක් පැතිරීම ගෝලීය වෙළඳපොළවල ස්වාභාවික රබර් මිල ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය.

### පොල්

**පොල් හා පොල් නිෂ්පාදන සැපයුම 2020 වසරේ දී පහළ වැටුණි.** 2019 වසරේ දී ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශවලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබීමේ පසු බලපෑම හේතුවෙන් 2020 වසරේ දී පොල් නිෂ්පාදනය සියයට 9.5ක සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය. පොල් නිෂ්පාදනයේ පහළ යාම සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ සැපයුම් දාමයන්ට බාධා සිදුවීම පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළේය. ඒ අනුව, දිසිඳි පොල් නිෂ්පාදනය 2019 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 44,081ක සිට 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 25,255ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. පොල් තෙල් මෝල් සඳහා පොල් සැපයුම සීමිත වීම හේතුවෙන් පොල්තෙල් නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 19,759ක් දක්වා සියයට 55.7කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, 2020 වසරේ දී නොඉඳුල් පොල්තෙල් (virgin coconut oil) නිෂ්පාදනය සියයට 18.1කින් ඉහළ ගියේය. මේ අතර, පොල්තෙල් ආනයනය 2019

2

2

**2.4 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂි බෝගවල උපනති**

| අයිතමය | ඒකකය | 2019 (අ) | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|---|
| | | | | 2018/19 (අ) | 2019/20 (ආ) |
| 1. තේ | | | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 300.1 | 278.9 | -1.2 | -7.1 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 200 | 200 | - | - |
| 1.3 දලු කැඩීම සිදු කරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 193 | 193 | - | - |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 483.79 | ලැ.නො. | 1.8 | - |
| 1.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 546.67 | 633.85 | -6.0 | 15.9 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 822.25 | 866.70 | 0.2 | 5.4 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 638 | 907 | -37.9 | 42.2 |
| 1.7 අලුතින් වගා කිරීම | හෙක්ටයාර | 296 | 424 | -32.0 | 43.2 |
| 1.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.7 | 0.6 | | |
| 2. රබර් | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 74.8 | 78.2 | -9.4 | 4.5 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 138 | 138 | 0.4 | 0.2 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 114 | 117 | 6.2 | 3.0 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 210.00 | 213.50 | 2.4 | 1.7 |
| 2.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය (RSS 1) | රුපියල්/කි.ග්‍රෑ. | 288.51 | 351.46 | 2.5 | 21.8 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 332.29 | 353.84 | -8.7 | 6.5 |
| 2.6 නැවත වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 1,040 | 955 | 19.5 | -8.2 |
| 2.7 අලුතින් වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 1,103 | 720 | 12.6 | -34.7 |
| 2.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.2 | 0.3 | | |
| 3. පොල් | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 3,086 | 2,792 | 17.6 | -9.5 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 503 | 506 | 0.9 | 0.5 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 18.33 | ලැ.නො. | -2.7 | - |
| 3.4 සාමාන්‍ය මිල | | | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියකට රුපියල් | 47.04 | 63.52 | -22.5 | 35.0 |
| - අපනයන (නැ.වි.ස.) (උ) | ගෙඩියකට රුපියල් | 41.60 | 58.91 | -39.1 | 41.6 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඌ) | හෙක්ටයාර | 5,931 | 5,333 | -21.4 | -10.1 |
| 3.6 අලුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 6,842 | 8,000 | -32.8 | 16.9 |
| 3.7 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.7 | 0.6 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දලු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැල සංඛ්‍යාව අනුව අළුතින් වගා කල බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158ක් සඳහා හෙක්ටයාර එකක් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 4,628ක සිට 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 79,060ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. 2020 වසර තුළ දී, දේශීය පොල්තෙල් කර්මාන්තයට සහාය වීමේ අරමුණින්, රජය විසින් පොල්තෙල්, නොඉඳුල් පොල්තෙල් සහ පාම් තෙල් ආනයනය සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලදී. තවද, දේශීය පොල්තෙල් නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සහ පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා පොල්තෙල් ආනයනය වෙනුවට කැබලි කරන ලද වියළි කොප්පරා ආනයනය කිරීමට පියවර ගන්නා ලදී. 2019 වසරට සාපේක්ෂව, 2020 වසරේ දී කොප්පරා සහ පොල් ගෙඩි අපනයන, පිළිවෙළින්, සියයට 72.4කින් සහ සියයට 25.2කින් පහළ ගියේය. පොල් නිෂ්පාදනය අඩු වුව ද, පොල් ක්‍රීම් සහ පොල් කිරි නිෂ්පාදනය 2020 වසරේ දී වර්ධනය වූ අතර, පිටිකළ පොල් කිරි නිෂ්පාදනය පහත වැටුණි.

**දේශීය පොල් නිෂ්පාදනය අඩු වීම නිසා ගෘහස්ථ පරිභෝජනය හා කර්මාන්තවල භාවිතය සඳහා දැඩි පොල් හිඟයක් ඇතිවීම හේතුවෙන්, 2020 වසරේ දී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ඉහළ ගියේය.** ඒ අනුව, පොල් ගෙඩියක සිල්ලර මිලෙහි සාමාන්‍යය පෙර වසරට සාපේක්ෂව රුපියල් 73.82ක් දක්වා සියයට 45.8කින් ඉහළ ගියේය. කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක වෙන්දේසි මිලෙහි සාමාන්‍යය 2019 වසරේ දී පැවති රුපියල් 27.55ක සිට 2020 වසරේ දී රුපියල් 48.89ක් දක්වා ඉහළ ගියේය. වෙළඳපොළ පොල් මිල ගණන් ඉහළ යෑම පොල් ආශ්‍රිත නිෂ්පාදනවල පිරිවැය වැඩි වීමට හේතු විය. ඒ අනුව, 2020 වසරේ දී පොල්තෙල් මිලි ලීටර් 750 බෝතලයක මිලෙහි සාමාන්‍යය, රුපියල් 343.18ක් දක්වා සියයට 31.9කින් ඉහළ ගිය අතර, දේශීය වෙළඳපොළෙහි දිසිදි පොල් කිලෝග්‍රෑමයක මිලෙහි සාමාන්‍යය, 2019 වසරේ දී වාර්තා වූ රුපියල් 251.03ක සිට 2020 වසරේ දී රුපියල් 447.56ක් දක්වා ඉහළ ගියේය. තවද, වසර තුළ දී දිසිදි පොල් අපනයනෙහි සියයට 36.5ක අඩු වීමක් දක්නට ලැබුණු අතර, දිසිදි පොල් අපනයන මිල සියයට 37.3කින් ඉහළ ගියේය. 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී රජය විසින්, පොල් ගෙඩිවල වට ප්‍රමාණය මත පදනම්ව, ගෙඩියකට රුපියල් 60.00 සිට රුපියල් 70.00ක් දක්වා උපරිම සිල්ලර මිලක් නියම කළ ද, සීමිත සැපයුම හේතුවෙන් පාලිත මිලට වඩා ඉහළ මිලකට දේශීය වෙළඳපොළෙහි පොල් අලෙවි විය.

### සුළු අපනයන බෝග

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ දී සුළු අපනයන බෝගවල ක්‍රියාකාරිත්වය සියයට 23.6ක වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් විය.** වසර තුළ දී ඉඟුරු, කහ, කුරුඳු, ගම්මිරිස්, කොකෝවා, එනසාල් සහ පුවක් නිෂ්පාදනය ඉහළ ගිය අතර, කරාබු නැටි සහ සාදික්කා සහ වසාවාසි නිෂ්පාදනය පහළ ගියේය. ඉඟුරු, ගම්මිරිස් සහ කහ වැනි අපනයන කෘෂිකාර්මික බෝග නිෂ්පාදන සඳහා රජය විසින් පනවා ඇති ආනයන සීමා හේතුවෙන්, ගොවියෝ එවැනි බෝග වගා කිරීමට සැලකිය යුතු උනන්දුවක් දැක්වූහ. ඒ අනුව, 2020 වසරේ දී අමු කහ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25,506ක් දක්වා සියයට 170.9ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, ඉඟුරු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 22,705ක් දක්වා සියයට 64.7කින් ඉහළ ගියේය. වසර තුළ දී ගම්මිරිස් නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 23,970ක් දක්වා සියයට 8.2කින් ඉහළ ගියේය. 2020 වසරේ දී කුරුඳු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 20,866ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර, පුවක් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 20,526ක් දක්වා සියයට 15.7කින් වර්ධනය විය. මේ අතර, 2020 වසරේ දී ප්‍රමාද වූ බෝග චක්‍ර (crop cycles) හේතුවෙන් අස්වනු නෙළීම ප්‍රමාද වීම නිසා කරාබු නැටි සහ සාදික්කා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,512ක් සහ මෙට්‍රික් ටොන් 2,751ක් දක්වා, පිළිවෙළින්, සියයට 26.6කින් සහ සියයට 46.3කින් පහළ ගියේය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

**දේශීය නිෂ්පාදකයාට ඉහළ මිල ගණන් ලබා දෙමින් දේශීය නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගැනීම සඳහා තෝරාගත් වෙනත් ක්ෂේත්‍ර බෝග (OFCs) ආනයනය කිරීම මත පනවා ඇති සීමා හේතු විය.** ඒ අනුව, වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 664,380ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 21.7කින් ඉහළ ගියේය. මෙය 2019/2020 මහ කන්නයේ සියයට 13.8ක වර්ධනයක් සහ 2020 යල කන්නයේ සියයට 38.2ක වර්ධනයක ඒකාබද්ධ ප්‍රතිඵලය විය. පසුගිය වසර හා සසඳන කළ, 2020 වසරේ දී බඩඉරිඟු, කුරක්කන්, ලොකු ළූණු, රතු ළූණු, මුං ඇට, උඳු, රට කජු, ඉදල් ඉරිඟු සහ කව්පි නිෂ්පාදනය ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ දී සියයට 33.7කින් අඩු වූ ලොකු ළූණු නිෂ්පාදනය වසර තුළ දී සියයට 131.2ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් විය. කෙසේ වුවත්, 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 265,863ක් දක්වා සියයට 10.7කින් ලොකු ළූණු ආනයනය ඉහළ ගියේය. තවද, 2020 වසරේ දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,085ක් දක්වා සියයට 36.0කින් පහළ ගිය අතර, අර්තාපල් ආනයනය ද සියයට 10.8කින් පහළ ගියේය. ආනයන සඳහා ඇති ඉල්ලුම අඩු කරමින් වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය සැපයුම ඉහළ යෑමෙන් එවන් නිෂ්පාදන භාවිත කරන දේශීය කර්මාන්තවලට සහායක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, පළිබෝධ කළමනාකරණය, ගබඩා ධාරිතාව පුළුල් කිරීම, දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තයක් සඳහා සුදුසුම භාවිතයන් අනුගමනය කිරීම සහ වඩා හොඳ මිලක් ලබා ගැනීම සඳහා විවිධ වෙළඳපොළ සඳහා ප්‍රවේශය පුළුල් කිරීම මගින් සියලුම වෙනත් ක්ෂේත්‍ර බෝග සැපයුම වැඩි කිරීම සඳහා තවදුරටත් ප්‍රයත්න දැරිය යුතුය.

## එළවළු

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, කොවිඩ්-19 සම්බන්ධ සැපයුම් දාම අවහිරතා මධ්‍යයේ වුවද, 2020 වසරේ දී එළවළු නිෂ්පාදනය, මෙට්‍රික් ටොන් මිලියන 1.7ක් දක්වා සියයට 13.0කින් වර්ධනය විය.** මෙම වැඩි වීම, 2019/2020 මහ කන්නයේ නිෂ්පාදනය සියයට 7.0ක වැඩි වීම සහ 2020 යල කන්නයේ නිෂ්පාදනය සියයට 20.7ක වර්ධනය නිසා සිදු විය. කෙසේ වුවද, කොවිඩ්-19 හේතුවෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම හා සංචරණ සීමා පැනවීම හේතුවෙන් සැපයුම් දාමවලට ඇති වූ අවහිරතා නිසා වසර පුරාම එළවළු මිල ගණන්වල විශාල උච්චාවචනයක් පැවතිණි. එම නිසා, කෘෂි නිෂ්පාදන ආර්ථික මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය ප්‍රමාද වූ අතර, ඒ හේතුවෙන් සිල්ලර වෙළඳපොළේ නිරන්තර මිල උච්චාවචනයන් ඇති කරමින් ගොවිපළ තුළ දී සහ ආර්ථික මධ්‍යස්ථානවල දී සිදුවන පසු අස්වනු හානිවීම් සාපේක්ෂව ඉහළ ගියේය. 2020 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 36.6ක් වටිනා එළවළු මෙට්‍රික් ටොන් 33,206ක් අපනයනය කළ අතර එ.ජ. ඩොලර් මිලියන 352.9ක් වටිනා එළවළු මෙට්‍රික් ටොන් 716,494ක් ආනයනය කරන ලදී. මේ අතර, ගොවියන්ගේ ආදායම ඉහළ නැංවීම, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම හා මෙම අංශයේ තිරසාර බව වැඩි කිරීම සඳහා ගබඩාකරණ හා බෙදාහැරීම වැඩිදියුණු කිරීම, පොහොර හා පළිබෝධනාශක වැනි කෘෂිකාර්මික යෙදවුම්වල ප්‍රශස්ත භාවිතය, දේශගුණික වශයෙන් සුහුරු සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් යොදා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

## පලතුරු

**අඹ, කෙසෙල්, ගස්ලබු, පේර හා කොමඩු නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ, පෙර වර්ෂයේ දී වාර්තා වූ සියයට 3.1ක අඩුවීම හා සසඳන විට, 2020 වසරේ දී පලතුරු නිෂ්පාදනය සියයට 3.1කින් වැඩි විය.** නිරීක්ෂණය කරන ලද වසර තුළ දී, එ.ජ. ඩොලර් මිලියන 33.1ක් වටිනා පලතුරු මෙට්‍රික් ටොන් 38,725ක් අපනයනය කරන ලද අතර, එ.ජ. ඩොලර් මිලියන 58.1ක් වටිනා ඇපල්, මැන්ඩරින්, දොඩම් සහ මිදි ඇතුළු පලතුරු මෙට්‍රික් ටොන් 52,778ක් ආනයනය කරන ලදී. දේශීය පලතුරු සහ එළවළු සඳහා හිතකර අපනයන ඉල්ලුමක් පැවතුණත්, අඛණ්ඩව විශාල ප්‍රමාණවලින් හොඳ තත්ත්වයේ පලතුරු සැපයීමට දේශීය නිෂ්පාදකයන්ට නොහැකි වීම පලතුරු අපනයන අංශයේ සංවර්ධනය සඳහා ප්‍රධාන බාධාවක්ව පවතී. පලතුරු අපනයන වෙළඳපොළ වැඩිදියුණු කිරීම සඳහා, විශේෂයෙන්ම, කෘෂිකාර්මික යෙදවුම් භාවිතය සහ අස්වනු නෙළීම සම්බන්ධයෙන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය, නිෂ්පාදකයන් හා අපනයනකරුවන් අතර ඍජු සම්බන්ධතා ඇති කිරීම සහ ගිවිසුම්ගත වගා ක්‍රමය තවදුරටත් වැඩිදියුණු කිරීම වැදගත් වේ.

## සීනි

**උක් වගා කරන ලද භූමි ප්‍රමාණය සහ අඹරන ලද උක් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, 2020 වසරේ දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 59,869ක් දක්වා සියයට 14.5කින් ඉහළ ගියේය.** ගල්ඔය සහ සෙවනගල සීනි කර්මාන්තශාලාවන්හි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 20,173ක් සහ මෙට්‍රික් ටොන් 16,114ක් දක්වා, පිළිවෙළින්, සියයට 81.3කින් සහ සියයට 0.6කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, වියළි කාලගුණික තත්ත්වයන්ගේ බලපෑමෙන් උක් අස්වැන්න පහළ යෑම සහ සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය[4] අඩු වීම හේතුවෙන්, සමස්ත දේශීය සීනි නිෂ්පාදනයෙන් සියයට 39කට පමණ දායකත්වයක් සපයන පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ නිෂ්පාදනය, 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 23,582ක් දක්වා සියයට 6.3කින් පහළ ගියේය. කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සහ උක් වගා කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ සාකච්ඡා වසර තුළ දී තව දුරටත් සිදු කෙරිණි. මේ අතර, නුදුරු අනාගතයේ දී නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමේ අරමුණින්, සීමාසහිත ඇතිමලේ (පුද්ගලික) සමාගම යටතේ නව සීනි කර්මාන්තශාලාවක් උක් වගා කටයුතු ආරම්භ කළේය. සමස්තයක් වශයෙන් ගත් විට, පෙර වසරේ සියයට 7.2ක් වූ සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය, 2020 වසරේ දී සියයට 6.8ක් දක්වා පහළ ගිය අතර, 2020 වසරේ දී දේශීය සීනි නිෂ්පාදනය රටේ සමස්ත සීනි ඉල්ලුමෙන් සියයට 9ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් විය. විශේෂයෙන් 2020 ඔක්තෝම්බර් මාසයේ දී සීනි ආනයනය සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කිරීමෙන් පසුව, 2020 වසරේ සීනි ආනයනය මෙට්‍රික් ටොන් 682,553ක් දක්වා සියයට 22.7කින් ඉහළ ගියේය. දේශීය සීනි නිෂ්පාදනය පුළුල් කිරීමේ හැකියාව සහ සීනි ආනයනය කිරීමේ දී සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැයවීම සැලකිල්ලට ගනිමින්, නවීන තාක්ෂණය භාවිතය, ඉහළ අස්වැන්නක් ලබා දෙන උක් ප්‍රභේද භාවිතය සහ වඩා යහපත් බෝග කළමනාකරණ ක්‍රමෝපාය සමඟ සීනි කර්මාන්තයට පුනර්ජීවනයක් ලබා දීම ඉතා වැදගත් වේ.

---

4 සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{සීනි නිෂ්පාදනය}}{\text{අඹරන ලද උක් ප්‍රමාණය}} \times 100$

### පශු සම්පත්

**2020 වසරේ දී කිරි නිෂ්පාදනය හැරුණු විට, දේශීය පශු සම්පත් අංශයේ නිෂ්පාදනය පහළ ගියේය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ දී සමස්ත කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 492ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින්, සියයට 9.8ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. දියර කිරි සඳහා ගොවීන්ට ආකර්ෂණීය මිල ගණන් ලැබීම, කිරි එකතුකරන්නන්ගෙන් දියර කිරි සඳහා ඇති ඉල්ලුම වැඩි වීම සහ වසංගත කාලපරිච්ඡේදය තුළ දී අර්ධ කාලීන ගොවීන් විසින් සත්ව පාලනය සඳහා සක්‍රීයව සම්බන්ධ වීම, කිරි නිෂ්පාදනය වැඩි වීමට හේතු විය. 2019 වසරේ රුපියල් 48.32ක් වූ කිරි ලීටරයක් නිෂ්පාදනය කිරීම සඳහා දැරීමට සිදුවන සාමාන්‍ය පිරිවැය, 2020 වසරේ දී රුපියල් 49.28ක් දක්වා ඉහළ ගියේය. කුකුළු මස් හා බිත්තර කර්මාන්තය සම්බන්ධයෙන් ගත් කල, බිත්තර නිපදවීම සඳහා වාණිජමය වශයෙන් ඇති කරන ලද සතුන් නිසි කලට පෙර මැරීම සහ සතුන්ට ලබා දෙන ආහාර ද්‍රව්‍යවල සීමිත බව නිසා ඇති වූ නිෂ්පාදන අලාභ හේතුවෙන් 2020 වසරේ දී බිත්තර නිෂ්පාදනය සියයට 10.3කින් පහළ ගියේය. තවද, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාවකාලික දත්තවලට අනුව, කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 216,160ක් දක්වා සියයට 3.5කින් පහළ ගියේය. බ්‍රොයිලර් මාපිය සත්වයින් දේශීය වශයෙන් බිහි කිරීම ඉහළ ගිය අතර, සජීවී සතුන් ආනයනය සඳහා පනවා ඇති සීමා නිසා 2020 වසරේ දී බ්‍රොයිලර් මාපිය සතුන් ආනයනය අඩු වූයේ වෙළඳපොළේ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් සීමිත කරමිනි. කෙසේ වුවද, බිත්තර නිෂ්පාදනයට යොදා ගන්නා කුකුළු පැටවුන් සඳහා ඉල්ලුම වැඩි වීම නිසා, එම සතුන් ජනනය කිරීමට අවශ්‍ය මාපිය සතුන් ආනයනය ඉහළ ගොස් තිබේ. මේ අතර, 2020 වසරේ දී හරක් මස්, ඌරු මස් හා එළු මස් නිෂ්පාදනය, පිළිවෙළින්, මෙට්‍රික් ටොන් 13,580ක්, මෙට්‍රික් ටොන් 8,580ක් හා මෙට්‍රික් ටොන් 1,610ක් දක්වා, පිළිවෙළින්, සියයට 54.5කින්, සියයට 4.7කින් සහ සියයට 11.0කින් අඩු වී ඇත. වසංගතය ආරම්භයත් සමඟ විවේකය සඳහා පහසුකම් සපයන අංශයෙන් ඇති ඉල්ලුම අඩු වීම සහ සමාජ ක්‍රියාකාරකම් සීමා කිරීම, දේශීය පශු සම්පත් අංශයේ වර්ධනය සඳහා අහිතකර ලෙස බලපෑවේය.

**2.5 සංඛ්‍යා සටහන**
**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන**

| උප අංශය | 2019 (අ) | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) 2018/19 (අ) | 2019/20 (ආ) |
|---|---|---|---|---|
| 1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.4 | 1.4 | -2.5 | 3.0 |
| එළ ගවයන් | 1.1 | 1.1 | -2.2 | 1.6 |
| මීගවයන් | 0.3 | 0.3 | -3.4 | 8.2 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 447.6 | 491.5 | -6.3 | 9.8 |
| එළ කිරි | 374.0 | 413.6 | -4.5 | 10.6 |
| මී කිරි | 73.6 | 77.9 | -3.4 | 5.9 |
| 3. කිරි නිෂ්පාදන (ලීටර් මිලියන) (ඇ) | 220.3 | ලැ.නො. | - | - |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 69.96 | 74.62 | 4.6 | 6.7 |
| 5. බිත්තර නිෂ්පාදනය (මිලියන) | 2,084.2 | 1,869.7 | 5.7 | -10.3 |
| 6. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 224.0 | 216.2 | 4.6 | -3.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ධීවර

**2020 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදන අංශය පසුබෑමක් පෙන්නුම් කළේය.** මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 76කට දායක වන මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය පහත වැටීම 2020 වසරේ දී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සියයට 15.2කින් පහළ යෑමට මූලික වශයෙන් හේතු විය. විශේෂයෙන්ම, මත්ස්‍ය සැපයුම් ජාලය තුළ කොවිඩ්-19 පොකුරක් බිහිවීමත් සමඟ වසංගත කාලය තුළ දී මසුන් ඇල්ලීමේ කටයුතු හා අනෙකුත් සැපයුම් දාම ක්‍රියාකාරකම් මත පනවා ඇති සීමා සහ නිතර නිතර මතු වූ කාලගුණික බාධා, ගැඹුරු මුහුදු සහ වෙරළ ආශ්‍රිත මසුන් ඇල්ලීමේ කටයුතුවලට සැලකිය යුතු බලපෑමක් කළේය. ඊට හාත්පසින්ම වෙනස්ව, මිරිදිය ජලාශ ආශ්‍රිත මත්ස්‍ය සහ කුනිස්සන් වගා අංශයේ නිෂ්පාදනය හේතුවෙන් සමස්ත මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයෙහි සියයට 12.7ක වර්ධනයක් වාර්තා විය.

**2.6 සංඛ්‍යා සටහන**
**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙ.ටො.දහස්

| උප අංශය | 2019 | 2020 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2018/19 | 2019/20 (අ) |
|---|---|---|---|---|
| **මුහුදු මත්ස්‍ය** | 415 | 327 | -5.4 | -21.3 |
| වෙරළ හා කලපු ආශ්‍රිත | 243 | 183 | -2.6 | -24.7 |
| ගැඹුරු මුහුදු මත්ස්‍ය | 173 | 144 | -9.2 | -16.5 |
| **මිරිදිය මත්ස්‍ය** | 90 | 102 | 3.0 | 12.7 |
| මිරිදිය ජලාශ | 73 | 84 | 3.1 | 15.1 |
| ජලජීවී වගාව | 11 | 10 | 26.1 | -5.3 |
| ඉස්සන් වගාව | 6 | 7 | -21.8 | 15.0 |
| **එකතුව** | **506** | **429** | **-4.0** | **-15.2** |

(අ) තාවකාලික

මූලය: ධීවර අමාත්‍යාංශය

2

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වීම සඳහා මිරිදිය ජලාශවලට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම සහ එලෙස මුදා හැරීමේ පිළිවෙත් ක්‍රමානුකූලව සිදු කිරීම දායක විය. මේ අතර, දේශීය සහ ගෝලීය වශයෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමේ පියවර හේතුවෙන් බලපෑමට ලක් වූ ගෘහ ඒකකවල හා හෝටල් අංශවල දේශීය මත්ස්‍ය පරිභෝජනය සහ මත්ස්‍යයන් වෛරස් වාහකයෙකු වෙතැයි මතු වූ බිය වසර පුරාම මිල ගණන් උච්චාවචනය වීමට හේතු විය. මිල ගණන් සැලකීමේ දී, වසර තුළ සාමාන්‍යයක් වශයෙන්, කුඩා මත්ස්‍ය ප්‍රභේදවල මිල සියයට 19.2ක වැඩි වීමක් වාර්තා කළ අතර, විශාල මත්ස්‍ය ප්‍රභේදවල මිල සියයට 0.4ක සුළු අඩු වීමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන අපනයන ගමනාන්තයන්ගේ ඉල්ලුම අඩු වීම සහ ගෝලීය සැපයුම් දාමවල ඇති වූ අවහිරතාවල ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ දී මුහුදු ආහාර අපනයනය සියයට 29.5කින් අඩු විය.

### කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**වී නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ වී මිල ස්ථාවර කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, පොහොර සහනාධාර වැඩසටහන යටතේ, 2019/2020 මහ කන්නයේ දී පොහොර කිලෝග්‍රෑම් 50ක බෑගයක් රුපියල් 500.00ක් වැනි සහන මිලකට ගොවීන්ට ලබා දෙන ලදී. එම සඳහන් කරන ලද කන්නයේ දී ගොවීන්ට පොහොර මෙට්‍රික් ටොන් 193,322ක් පමණ නිකුත් කර ඇත. තවද, 2020 යල කන්නයේ සිට කුඹුරු හෙක්ටයාර් දෙකක උපරිම භූමි ප්‍රමාණයක් සඳහා ගොවීන්ට නොමිලේ පොහොර ලබා දීමට රජය විසින් තීරණය කරන ලද අතර, 2020 යල කන්නයේ දී පොහොර මෙට්‍රික් ටොන් 131,309ක් නිකුත් කරන ලදී. ගොවීන් සඳහා සහතික මිලක් ලැබීම තහවුරු කිරීම සහ වෙළඳපොළ තුළ වී මිල ස්ථාවර කිරීම සඳහා සහතික මිලට වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගත්තේය. වී අලෙවි මණ්ඩලය විසින් 2019/2020 මහ කන්නයේ අස්වැන්නෙන් වී තොග මෙට්‍රික් ටොන් 26,000ක් පමණ මිලදී ගත් නමුත්, වෙළඳපොළේ පවතින මිල ගණන් වී අලෙවි මණ්ඩලය විසින් ලබා දුන් සහතික කරන ලද මිල ගණන්වලට වඩා වැඩි බැවින් 2020 යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 4,000ක් පමණ මිලදී ගෙන ඇත. මේ අතර, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් නියඟයට ඔරොත්තු දීම සඳහා වැඩිදියුණු කරන ලද, කෙටි කාලයක් තුළ අස්වැන්න ලැබෙන නව දෙමුහුන් සහල් ප්‍රභේද නිපදවන ලදී. තවද, කෘෂිකර්ම අමාත්‍යාංශය දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්‍රමවේදයන් ප්‍රචලිත කරමින් විශේෂ මැදි කන්නයේ වගා වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතරතුර, බෝග ව්‍යාප්ති සේවා, බෝග රක්ෂණය සහ පළිබෝධ කළමනාකරණය ඇතුළු ආධාරක සේවා ද අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.

**2.7 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ සුලභතාවය**

| | ඒකකය | 2010 | | | 2019 | | | 2020 (අ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) |
| සහල් (ආ) | මෙ.ටො.දහස් | 3,011 | 126 | 152 | 3,214 | 24 | 149 | 3,585 | 16 | 164 |
| ඉරිඟු | මෙ.ටො.දහස් | 162 | 16 | 9 | 246 | 118 | 17 | 314 | 44 | 16 |
| තිරිඟු | මෙ.ටො.දහස් | - | 1,051 | 51 | - | 1,159 | 53 | - | 1,404 | 64 |
| ලොකු ළූණු | මෙ.ටො.දහස් | 59 | 158 | 10 | 19 | 240 | 12 | 43 | 266 | 14 |
| සීනි | මෙ.ටො.දහස් | 31 | 548 | 28 | 52 | 556 | 28 | 60 | 683 | 34 |
| අර්තාපල් | මෙ.ටො.දහස් | 52 | 130 | 9 | 102 | 142 | 11 | 65 | 127 | 9 |
| මාළු | මෙ.ටො.දහස් | 385 | 14 | 19 | 506 | 19 | 24 | 429 | 13 | 20 |
| එළකිරි | ලීටර් මිලියන | 192 | - | 9 (ඇ) | 374 | - | 17 (ඇ) | 414 | - | 19 (ඇ) |
| පොල්තෙල් | මෙ.ටො.දහස් | 65 | 3 | 3 | 45 | 5 | 2 | 20 | 79 | 5 |

(අ) තාවකාලික
(ආ) වී මෙට්‍රික් ටොන් 1ක්, සහල් මෙට්‍රික් ටොන් 0.7 කට සමාන වේ.
(ඇ) වසරකට ලීටර්

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවනගල ඒකකය
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය
සීමාසහිත ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනය
ධීවර අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණ ආයතනය ඵලදායිතාව සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් අරමුණු කරගත් සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කළේය.** වසංගත කාලපරිච්ඡේදය තුළ දී තේ වෙන්දේසි කිරීම සාම්ප්‍රදායික භෞතික ක්‍රමවේදයෙන් බැහැරව විද්‍යුත් වෙන්දේසි ක්‍රමයක් බවට පරිවර්තනය වූ අතර, එහි දී ගැනුම්කරුවන්ට දුරස්ථ ප්‍රදේශවල සිට ලංසු තැබීමට හැකි විය. ඒ අනුව, සලකා බැලීමට ලක් කරන ලද කාලපරිච්ඡේදය තුළ දී තේ කිලෝග්‍රෑම් මිලියන 200කට වැඩි ප්‍රමාණයක් විද්‍යුත් වෙන්දේසි ක්‍රම මගින් අලෙවි කරන ලදී. මේ අතර, වැවිලි ක්ෂේත්‍රයේ පවතින දීර්ඝ කාලීන වැටුප් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා පඩි පාලක සභා හරහා වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000.00ක් දක්වා වැඩි කිරීමට රජය තීරණය කළේය. මධ්‍යම ප්‍රමාණයේ තේ වතු සඳහා ආදර්ශ තේ වතු අක්කරයකට රුපියල් මිලියනයක් බැගින් ලබා දෙමින් ආදර්ශ තේ වතු වගා ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. 2020 වසරේ දී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අංශය පුනර්ජීවනය හා නවීකරණ කිරීමේ වැඩසටහන යටතේ, තේ කර්මාන්තශාලා 56ක් සඳහා රුපියල් මිලියන 168ක් ලබා දී ඇත. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තේ පැළ නැවත සිටුවීමේ හා නව වගා වැඩසටහන් මෙන්ම බෝග වගා නැවත නගා සිටුවීමේ සහනාධාර වැඩසටහන් සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී. 2020 වසරේ දී, තේ ඉඩම් හෙක්ටයාර් 648ක් පමණ නැවත වගා කර නව ඉඩම් හෙක්ටයාර් 424ක් තේ ඉඩම් බවට පරිවර්තනය කරන ලද අතර, තේ ඉඩම්වල පාළු සිටුවීම (refilling) සඳහා තේ පැළ මිලියන 2.1ක් භාවිත කරන ලදී.

**ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ රබර් වගා කරන භූමි ප්‍රමාණය පුළුල් කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය විසින් පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, 2020 වසරේ දී නව වගා වැඩසටහන යටතේ, නව ඉඩම් හෙක්ටයාර් 720ක රබර් වගා කටයුතු සිදු කරන ලදී. මේ අතර, වසර තුළ දී, ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ, හෙක්ටයාර් 815ක භූමි ප්‍රමාණයක් වැඩිදියුණු කරන ලද අතර, හෙක්ටයාර් 955ක භූමි ප්‍රදේශයක රබර් නැවත වගා කරන ලදී. 2020 වසරේ දී, කිරි කැපීමේ කටයුතු සිදු නොකළ ඉඩම් හෙක්ටයාර 300ක් කිරි කැපීමේ මට්ටමට ගෙන එන ලදී. මේ අතර, 2020 වසරේ දී කුඩා වතු හිමියන් සහ ආයතනික යන දෙ අංශයම සඳහා රබර් වගාවන්හි වැසි ආවරණ සවි කිරීම සඳහා ලබා දෙන සහනාධාරය වැඩි කරන ලදී. රබර් වගා කිරීම, සැකසුම් කටයුතු සහ නිෂ්පාදන සංවර්ධනය යන සියලුම අංශ පිළිබඳව රබර් පර්යේෂණ ආයතනය සිය පර්යේෂණ හා සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කළේය. ඒ අනුව, කුඩා පරිමාණ වගාකරුවන්, මධ්‍යම පරිමාණ වගාකරුවන්, ප්‍රාදේශීය වතු සමාගම්/වතු සහ කිරි කැපීම අතහැර දමා ඇති වගාකරුවන් යන කාණ්ඩ හතර යටතේ රබර් වගාකරුවන් සඳහා විශේෂ සංවර්ධන වැඩසටහන් රබර් පර්යේෂණ ආයතනය විසින් ආරම්භ කරන ලදී. රබර් තාක්ෂණික විද්‍යාගාර වැඩිදියුණු කිරීම හා ප්‍රතීතනය කිරීම, පොහොර අඩු වේගයකින් පසට එක් වීම හා සම්බන්ධ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික වශයෙන් තිරසාර කර්මාන්තයක් ලෙස රබර් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වැනි ක්‍රියාකාරකම් රබර් පර්යේෂණ ආයතනය විසින් සිදු කරන ලදී.

**පොල් නිෂ්පාදන හා පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා සහාය දැක්වීම පිණිස රජය විසින් පොල් නිෂ්පාදන අංශය තුළ පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** වියළි කාලගුණික තත්ත්ව සහ වෙළඳපොළවල් වසා තැබීම් නිසා අපතේ යාම ඉහළ යෑම, ශ්‍රම හිඟය සහ සැපයුම් දුෂ්කරතා වැනි සංචරණ සීමා හේතුවෙන් මතු වූ සැපයුම් දාම බාධා, 2020 වසරේ දී පොල් කර්මාන්ත අංශයට අහිතකර ලෙස බලපෑවේය. එබැවින්, පොල් සංවර්ධන අධිකාරිය කොවිඩ්-19 වසංගතය මගින් පොල් නිෂ්පාදන කර්මාන්තයට සිදු කරන ලද බලපෑම අවම කරන අතරතුර, වසංගතය පාලනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග මධ්‍යයේ නිෂ්පාදන කටයුතු සිදු කිරීමට පියවර ගත්තේය. අලෙවිකරණ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට සහාය දීම සහ සාධාරණ මිල ගණන් පවත්වා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් විද්‍යුත් වෙන්දේසි පහසුකම් ආරම්භ කරන ලදී. තිරසාර පොල් වගා ක්‍රමෝපායන් ස්ථාපිත කිරීමේ අරමුණින්, පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් ක්‍රමානුකූල වගා කටයුතු සහ ගෙවතු වගාව සඳහා බීජ පොල් ලබා දීමට සහන මිලක් (පැළයක් රුපියල් 100.00කට) හඳුන්වා දීම, ක්‍රමානුකූල වාරිමාර්ග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ රෝග හා පළිබෝධ පාලනය සඳහා මූල්‍ය ආධාර සැපයීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් සිදු කරන ලදී. මේ අතර, පොල් පර්යේෂණ ආයතනය විසින් ඉහළ අස්වැන්නක් සහිත 'කප්සුවය' දෙමුහුන් පොල් වගා ප්‍රභේදය වගා කිරීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඒකාබද්ධව නව බීජ පොල් නිෂ්පාදන උද්‍යානයක් පිහිටුවීමට පියවර ගනිමින්, වැඩි අස්වැන්නක් සහ ඉක්මණින් මල් හටගන්නා ලක්ෂණ සහිත 'CRISL 2020' නව දෙමුහුන් පොල් ප්‍රභේදය 2020 වසරේ දී හඳුන්වා දෙන ලදී.

2

**කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය හමුවේ වගාකරුවන්, තොග එකතුකරන්නන්, පිරිසැකසුම්කරුවන් සහ අපනයනකරුවන් ඇතුළු අපනයන කෘෂිකාර්මික අංශයේ පාර්ශ්වකරුවන්ට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහයෝගය ලබා දෙන ලදී.** ඒ අනුව, දැනට පවතින වගාවල අස්වැන්න වැඩි දියුණු කරන අතරතුර, නව වගා කටයුතු පුළුල් කරමින් අපනයන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගම්මිරිස් ගොවීන් දිරිගැන්වීම සඳහා බෝගවලට වැඩි අගයක් එකතු කිරීමේ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, 2021 වසර වන විට කහවලින් ස්වයංපෝෂිත භාවය ළඟා කර ගැනීමේ අරමුණින් 'වේගවත් කහ වගා සංවර්ධන වැඩසටහනක්' ආරම්භ කරන ලදී.

**2020-2022 කාලපරිච්ඡේදය සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මගින් බෝග විවිධාංගීකරණය හා ඵලදායිතාව ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග තුළින් බඩ ඉරිඟු, ළූණු සහ අර්තාපල් වැනි බෝගවලින් රට ස්වයංපෝෂිත කිරීම ඇතුළු ඉලක්ක කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර ඇත.** ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් යහපත් කෘෂිකාර්මික පුරුදු ප්‍රචලිත කිරීම, වෙනත් ක්ෂේත්‍ර බෝග වගා යටතේ ඇති වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීම, පස සංරක්ෂණය තහවුරු කිරීම, කාර්යක්ෂම බෝග කළමනාකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම, ඉහළ අස්වැන්නක් සහිත බීජ භාවිතය තහවුරු කිරීම සහ ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. එපමණක් නොව, වෙනත් ක්ෂේත්‍ර බෝග වගා නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ පෝෂණය පිළිබඳ සංවේදී ගෘහ ගෙවතු වගා වැඩසටහන සහ පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන අඛණ්ඩව සිදු කරන ලදී. කෙසේවෙතත්, වගා කරන භූමි ප්‍රමාණය වැඩි කිරීම තුළින් පමණක් ආහාර ස්වයංපෝෂිත බව ළඟා කර ගැනීම සඳහා උත්සාහ කිරීම වෙනුවට, කාර්යක්ෂම කෘෂිකාර්මික යෙදවුම් භාවිතය, දේශගුණික සුහුරු ක්‍රමවේද සහ පසු අස්වනු ක්‍රමවේද තුළින් සියලුම ආහාර කාණ්ඩ සම්බන්ධයෙන් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රට තුළ මනා සම්බන්ධීකරණයකින් යුතුව පුළුල් ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

**දේශීය සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් පර්යේෂණ කටයුතු සහ ව්‍යාප්ති සේවා කිහිපයක් උක් පර්යේෂණ ආයතනය විසින් වසර තුළ දී ක්‍රියාවට නංවන ලදී.** ඒ අනුව, වාණිජ වගාව සඳහා, සීනි වැඩි ප්‍රමාණයක් නිපදවිය හැකි ආනයනික උක් ප්‍රභේද හඳුන්වා දීමේ වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනය විසින් ආරම්භ කරන ලදී. තවද, මූලික වශයෙන් හකුරු හා පැණි නිෂ්පාදනය සඳහා කිලිනොච්චි ප්‍රදේශයෙහි උක් වගාව ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේ. වවුනියා සහ වැලිඔය ප්‍රදේශවල නව සීනි කර්මාන්තශාලා පිහිටුවීම සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් නව ආයෝජකයින්ට තාක්ෂණික තොරතුරු සහ සහාය ලබා දෙන ලදී.

**ජාතික පශු සම්පත් ගහණය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** පශු සම්පත් (කිරි) අභිජනන ව්‍යාපෘතිය යටතේ, දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පවතින ගව ගහණය වැඩිදියුණු කිරීම පිණිස කෘත්‍රිම සිංචන සේවා ක්‍රියාත්මක කිරීම, කෘතිම සිංචන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම, ස්වාභාවික අභිජනනය සඳහා වසු පැටවුන් තෝරා ගැනීම සහ තෘණ බිම් සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව, 2020 වසරේ දී ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල හරහා එළ ගවයන් හා මී ගවයන් සඳහා කෘත්‍රිම සිංචන 202,516ක් සිදු කර ඇත. ක්ෂේත්‍ර මට්ටමින් පශු වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ වැඩසටහන තුළින් පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා ආයතනික සහයෝගය අඛණ්ඩව ලබා දෙන ලදී. ස්පර්ශයෙන් බෝවන රෝග හා සංක්‍රාමී රෝග පාලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, 2020 වසරේ දී කුර හා මුඛ රෝගය සඳහා සතුන් 410,459ක් ද, කාල ගාත්‍ර රෝගය සඳහා සතුන් 178,243ක් ද, රක්තපාත වසංගතය සඳහා සතුන් 279,407ක් ද ප්‍රතිශක්තිකරණය සඳහා එන්නත් කර ඇත.

**ධීවර අංශය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිමය පියවර මගින් ඉස්මතු වෙමින් පවතින අභියෝග හමුවේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි.** ජල මූලාශ්‍ර නිසි ලෙස කළමනාකරණය කිරීම සහ මත්ස්‍ය තොග වැඩිදියුණු කිරීම තුළින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් ගන්නා ලද ප්‍රයත්න අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. උසස් තත්ත්වයේ මව් මත්ස්‍ය තොග නිෂ්පාදනය කිරීම, මත්ස්‍ය පැටවුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ දේශීය විශේෂවල නව ප්‍රභේද සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ඉදි කෙරුණු දඹුල්ල මත්ස්‍ය ජාන සංවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු 2020 වසරේ දී අවසන් කරන ලදී. සලකා බැලීමට ලක් කරන ලද කාලපරිච්ඡේදය තුළ දී ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් මිරිදිය ඉස්සන් පැටවුන් මිලියන 77.7ක් සහ මත්ස්‍ය පැටවුන් මිලියන 92.9ක් ජලාශවලට මුදා හරින ලදී.

එපමණක් නොව, පොළොන්නරුවේ විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම, හම්බන්තොට කකුළු අභිජනන නගර දෙකක් පිහිටුවීම, ත්‍රිකුණාමලයෙහි මෝදා මසුන් (sea bass) ඇති කිරීම සඳහා මහා පරිමාණ අභිජනනාගාරයක් ආරම්භ කිරීම සහ කිලිනොච්චිය සහ යාපනය ප්‍රදේශවල මුහුදු කැකිරි අභිජනනාගාර ගම්මාන පිහිටුවීම ඇතුළු පියවර කිහිපයක් අපනයන ධීවර අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, පුත්තලම ප්‍රදේශයෙහි වෙක්ක මාළු (Milkfish) අභිජනනාගාරයක් ඉදිකිරීම ආරම්භ කරන ලදී. ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රමයක් හඳුන්වාදීම සහ ධීවර ප්‍රදේශවල ජෛව සුරක්ෂිතතාව ඉහළ නැංවීම තුළින් වයඹ පළාතේ කුනිස්සන් වගා කටයුතු වැඩිදියුණු කිරීමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පියවර ගත්තේය. කෙසේවෙතත්, ආයෝජන නොමැතිකම, ධීවර කටයුතු සඳහා නවීන තාක්ෂණය අඩුවෙන් භාවිත කිරීම, ජලජීවී වගා ව්‍යාපෘති සඳහා භූමි ප්‍රදේශ සහ මුහුදු ප්‍රදේශ බදු වශයෙන් ලබා ගැනීමට ප්‍රමාද වීම් සහ අපනයනවල එකතු කළ අගය මත වටිනාකම අඩු වීම යනාදිය ධීවර ක්ෂේත්‍රයේ ව්‍යාප්තියට බාධක ලෙස පවතී.

## කර්මාන්ත

**ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, නිෂ්පාදන කර්මාන්ත සහ පතල් හා කැණීම් කටයුතු කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් පිළිබිඹු කරමින් කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.6ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 6.9කින් පහත වැටුණි.** මෙහිදී වසංගතයේ අහිතකර තත්ත්වයන් හේතුවෙන් ප්‍රධාන අපනයන වෙළඳපොළවල ඉල්ලුම පහත වැටීම ශ්‍රී ලංකාවට බලපාන ලද අතර මෙම තත්ත්වය විශේෂයෙන්ම රෙදිපිළි සහ නිමි ඇඳුම් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත කෙරෙහි බලපාන ලදී. මේ අතරතුර විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු සහ මලාපවහන කටයුතු, කසල කළමනාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය ආශ්‍රිත කටයුතු වසර තුළ දී සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වුවද, ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීමේ කටයුතු 2020 වසරේ දී කර්මාන්ත කටයුතු කෙරෙහි ධනාත්මකව දායක විය. කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු මෙම පහත වැටීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය පදනමෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි කර්මාන්ත කටයුතුවලට අදාළ ඉල්ලුම හා නිෂ්පාදනය උප දර්ශක වසර තුළ සමස්තයක් ලෙස පහත වැටුණි.


### නිෂ්පාදන කර්මාන්ත

**2019 වසරේ දී සියයට 1.8ක වර්ධනයක් වාර්තා කළ නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය වසංගතය නිසා පැනනැගුණු අවහිරතා හේතුවෙන් 2020 වසරේ දී සියයට 3.9කින් පහත වැටුණි.** 2020 වසරේ මාර්තු මාසයේ මැද භාගයේ දී පමණ ශ්‍රී ලංකාව තුළ පැතිර යාමට පටන්ගත් කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ එය මැඩලීම සඳහා පනවනු ලැබූ දැඩි සීමා, විශේෂයෙන්ම වසරේ මුල් භාගයේ දී නිෂ්පාදන කර්මාන්ත කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මෙයට අමතරව වසංගතයේ ගෝලීය බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ පාර්ශ්වකාර රටවල ඇති වූ අහිතකර තත්ත්වයන් ද ශ්‍රී ලංකාවට බලපාන ලදී. මෙහිදී, දූර්වල විදේශීය ඉල්ලුම මෙන්ම යෙදවුම්වල ගෝලීය සැපයුම් ජාල කෙරෙහි බලපෑ අවහිරතා ද සමස්තයක් ලෙස නිෂ්පාදන කර්මාන්ත ආයතනවල ධාරිතා උපයෝජනය සහ නිෂ්පාදන පරිමාව තවදුරටත් පහළ යෑම කෙරෙහි බලපාන ලදී. ඒ අනුව, නිෂ්පාදන කර්මාන්තවල දෙවැනි විශාලතම කාණ්ඩය වන රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන කාණ්ඩයෙහි, විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුව තුළ දී සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, 2020 වසරේ දී නිෂ්පාදන කර්මාන්තවල සමස්ත පසුබෑම කෙරෙහි එහි අනෙකුත් බොහෝ උපකාණ්ඩවල පහත වැටීම ද හේතු විය. කෙසේ වුවද, නිෂ්පාදන කර්මාන්තවල විශාලතම උපකාණ්ඩය වන ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය 2020 වසරේ දී වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත දර්ශක සලකා බැලීමේ දී, ජනලේඛන

2

**2.5 රූප සටහන**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වර්ධනීය තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.


හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය 2020 වසරේ දී පහළ යෑමක් වාර්තා කරන ලදී. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය නිෂ්පාදන කර්මාන්ත කෙරෙහි ඇති කළ අහිතකර බලපෑම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව සම්පාදනය කරනු ලබන නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 වසරේ අප්‍රේල් මාසයේ දී අඩුම දර්ශක අගය වාර්තා කරන ලද අතර, එය තෙවන කාර්තුවේ සිට නැවත යථා තත්ත්වයට පත් වනු දක්නට ලැබුණි.

2

## කාර්මික නිෂ්පාදක දර්ශකය


**කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ප්‍රධාන නිෂ්පාදන අංශ වරින් වර වසා දැමීමට සිදු වූ බැවින් කාර්මික නිෂ්පාදන දර්ශකයේ සමස්ත වාර්ෂික ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස පහත වැටුණ ද, වසරේ දෙවන භාගයේ දී එහි සැලකිය යුතු ආකාරයේ යථා තත්ත්වයට පත්වීමක් නිරීක්ෂණය විය.** කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් පිළිබිඹු වන පරිදි, නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරකම්, 2019 වසරේ දී වාර්තා වූ සියයට 1.3ක වර්ධනයට සාපේක්ෂව, 2020 දී සියයට 10.2කින් අඩු විය. 2020 වසරේ දී ඇතැම් ප්‍රධාන උප අංශවල නිෂ්පාදන කටයුතු අඩාල වූ නමුත්, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන, මූලික ඖෂධ නිෂ්පාදන සහ ඖෂධ සම්බන්ධ සැකසීම් නිෂ්පාදන, සහ මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය කිරීම යන උප අංශවල ක්‍රියාකාරකම් වර්ධනය වීමක් වාර්තා විය. ආහාර නිෂ්පාදන සහ මූලික ඖෂධ නිෂ්පාදන කාණ්ඩවල වාර්තා වී ඇති වර්ධනයට හේතු වී ඇත්තේ කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ මෙම අංශවල පැවති අත්‍යවශ්‍ය ස්වභාවයයි. කොවිඩ්-19 වසංගත

**2.6 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**
**(2015 = 100)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2.7 රූප සටහන**
**ධාරිතා උපයෝජනය**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා දීප ව්‍යාප්තව සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම සහ වෙනත් සංචරණ සීමා පැනවීම හේතුවෙන්, 2020 වසරේ දෙවන කාර්තුවේ දී නිෂ්පාදන කටයුතු සැලකිය යුතු ලෙස අඩාල වූ නමුත්, සංචරණ සීමා ලිහිල් කිරීමත්, ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2020 වසරේ ජූලි මාසය වනවිට නිෂ්පාදන කටයුතු පූර්ව වසංගත මට්ටමට ළඟා වී තිබුණි. කර්මාන්තශාලා ආශ්‍රිතව කොවිඩ්-19 වසංගතය පැතිරීම ඇතුළු බාධා රැසක බලපෑමට ලක් වූ ඇඟලුම් අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය, තෙවන හා සිව්වන කාර්තුවල දී කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්තා වූ සුළු අඩු වීමට බොහෝ දුරට හේතු විය. මෙම බාධා මධ්‍යයේ, 2020 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී නිෂ්පාදන ක්‍රියාකාරකම් දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ ද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2020 දෙසැම්බර් මාසයේ දී ධනාත්මක කාර්ය සාධනයක් වාර්තා කළේය.

**නිෂ්පාදනවල අත්‍යවශ්‍ය ස්වභාවය නිසා, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධා මගින් ආහාර නිෂ්පාදන අංශයට අඩු බලපෑමක් ඇති කළ ද, 2020 වසරේ දී බීම වර්ග නිෂ්පාදන කටයුතු පසුබෑමකට ලක් විය.** කාර්මික නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය, 2020 වසරේ දී සියයට 3.3ක වර්ධනයක් වාර්තා කළ අතර, ආහාර නිෂ්පාදනවල අත්‍යවශ්‍ය ස්වභාවය සහ වසංගත තත්ත්වය අතරතුර පාරිභෝගිකයින් ආහාර තොග ගබඩා කිරීම හේතුවෙන් ඉල්ලුම වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කිරි පිටි, තිරිඟු පිටි, යෝගට් සහ බිස්කට් වර්ග නිෂ්පාදනය වැඩි වීම මෙම

**2.8 රූප සටහන**
**2020 වර්ෂයේ දී කාර්මික නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික වෙනස්වීමට දායකත්වය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අංශයේ ධනාත්මක ක්‍රියාකාරිත්වයට මුල් විය. මෙයට වඩා වෙනස් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින්, බීර, අරක්කු සහ සිසිල් බීම නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් බීම වර්ග නිෂ්පාදන උප අංශය වසර තුළ දී සියයට 6.7ක අඩු වීමක් වාර්තා කළේය. අවන්හල් සහ මත්පැන් අලෙවිසැල් වසා දැමීම, හෝටල් අංශයෙන් පැවති ඉල්ලුම අඩු වීම සහ විනෝදාස්වාද කටයුතු අඩු වීම බීම වර්ග නිෂ්පාදනයට අහිතකර බලපෑම් එල්ල කර ඇත. කෙසේවෙතත්, ආර්ථික ක්‍රියාකාරකම් යළි වර්ධනය වීමත් සමඟ බීම වර්ග නිෂ්පාදන ක්‍රියාකාරකම්වල, 2020 වසරේ පළමු භාගයේ දී දක්නට ලැබුණු සියයට 23.9ක අඩු වීමට සාපේක්ෂව, 2020 වසරේ දෙවන භාගයේ දී, සියයට 11.5ක සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. වසරේ දෙවන අර්ධ භාගය තුළ දී මෙම අංශය යථා තත්ත්වයට පත් වීම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 1.8ක සුළු වර්ධනය හා සැසඳීමේ දී, සැලකිය යුතු වර්ධනයක් ලෙස දැක්විය හැකිය.

**ගෝලීය සැපයුම් දාම අඩාල වීම, රට තුළ සංචරණ සීමා පැනවීම හේතුවෙන් ශ්‍රමිකයින් සීමිත වීම මෙන්ම, දේශීය වශයෙන් අමුද්‍රව්‍ය සුලභව නොපැවතීම 2020 වසරේ දී ඇඟලුම් හා රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයට අහිතකර බලපෑම් එල්ල කළේය.** කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් පිළිබිඹු වන පරිදි ඇඟලුම් නිෂ්පාදන අංශය, පසුගිය වසරේ වාර්තා කළ සියයට 1.9ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 30.8ක පහළ යැමක් වාර්තා කළ අතර, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය පාලනය කිරීමට අනුගමනය කළ පියවර සහ අපනයන ගමනාන්තවලින් ලද ඇණවුම් පහත

**2.8 සංඛ්‍යා සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**
**2015 = 100**

| කාණ්ඩය (අ) | 2019 | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම % | |
|---|---|---|---|---|
| | | | 2018/19 | 2019/20 (ආ) |
| 1. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය (35.2%) | 105.6 | 109.1 | -0.4 | 3.3 |
| 2. බීම වර්ග නිෂ්පාදනය (3.8%) | 103.4 | 96.5 | 3.6 | -6.7 |
| 3. දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය (1.7%) | 81.0 | 72.1 | -12.6 | -11.0 |
| 4. රෙදි නිෂ්පාදනය (3.3%) | 108.3 | 102.2 | -1.7 | -5.6 |
| 5. ඇඟලුම් නිෂ්පාදනය (19.8%) | 117.2 | 81.2 | 1.9 | -30.8 |
| 6. සම් සහ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදනය (0.3%) | 116.7 | 77.6 | -0.2 | -33.5 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරුවලින් හා ගොතන ලද ද්‍රව්‍ය නිෂ්පාදනය (0.2%) | 101.9 | 71.8 | 3.3 | -29.5 |
| 8. කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය (1.7%) | 96.7 | 81.8 | 11.4 | -15.5 |
| 9. මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය (1.4%) | 102.9 | 112.6 | -3.4 | 9.4 |
| 10. අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය (7.4%) | 106.8 | 97.2 | 9.6 | -9.0 |
| 11. රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය (4.1%) | 102.2 | 94.2 | 10.3 | -7.8 |
| 12. මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදනය (0.1%) | 98.2 | 104.7 | -2.0 | 6.6 |
| 13. රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය (5.7%) | 106.4 | 75.8 | -5.0 | -28.7 |
| 14. වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය (7.8%) | 117.8 | 111.7 | 8.2 | -5.2 |
| 15. මූලික ලෝහ වර්ග නිෂ්පාදනය (2.4%) | 124.2 | 110.7 | -3.2 | -10.9 |
| 16. පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හැර) (1.3%) | 110.7 | 100.9 | -11.7 | -8.9 |
| 17. විදුලි උපකරණ නිෂ්පාදනය (2.0%) | 86.9 | 67.5 | 6.3 | -22.3 |
| 18. යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (වෙනත් තැනක සඳහන් නොවන) (0.7%) | 99.3 | 102.9 | -2.6 | 3.6 |
| 19. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (0.8%) | 90.3 | 77.0 | -0.4 | -14.8 |
| 20. අනෙකුත් නිෂ්පාදන (0.3%) | 66.0 | 65.7 | -30.7 | -0.5 |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **108.1** | **97.1** | **1.3** | **-10.2** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) එක් එක් අංශයට අදාළ වන බරතැබීම් වරහන් තුළ දක්වා ඇත.
(ආ) තාවකාලික

වැටීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. අප්‍රේල් මාසය තුළ දී දිවයින පුරා පනවා තිබූ සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් එම මාසය තුළ දී මෙම අංශය තියුණු පසුබෑමකට ලක්විය. කෙසේ වෙතත්, මැයි මාසයේ අග භාගයේ සිට කර්මාන්ත ශාලා ක්‍රමයෙන් සාමාන්‍ය මෙහෙයුම් මට්ටම් කරා නැවත ළඟාවීමත් සමඟ මෙම නිෂ්පාදන අංශය තුළ

2

2

වේගවත් යථා තත්ත්වයට පත්වීමක් නිරීක්ෂණය විය. නමුත් දෙවන ආසාදන රැල්ල හේතුවෙන් මෙම අංශය තුළ ක්‍රියාත්මක වූ කෙටි කාලීන වසා දැමීම් කිහිපයක ප්‍රතිඵලයක් ලෙස කාර්මික නිෂ්පාදනයෙහි කඩින් කඩ පහත වැටීම් දක්නට ලැබුණි. එක්සත් ජනපදය සහ යුරෝපීය වෙළඳපොළ ඉලක්ක කරමින් ප්‍රධාන ඇඟලුම් නිෂ්පාදකයින් කිහිප දෙනෙකු පුද්ගලික ආරක්ෂක උපකරණ (Personal Protective Equipment) නිෂ්පාදනයට යොමුවීම හේතුවෙන් ඇඟලුම් නිෂ්පාදන අංශයේ පහත වැටීම යම් ප්‍රමාණයකට සීමා විය. රෙදිපිළි නිෂ්පාදන අංශය සමස්තයක් ලෙස වසර තුළ දී සංකෝචනය වීමක් වාර්තා කළ ද, 2020 වසරේ දෙවන භාගයේ දී මෙම අංශය සියයට 11.9ක වර්ධනයක් වාර්තා කර ඇත්තේ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත් වීම සහ විශේෂයෙන්ම පුද්ගලික ආරක්ෂක උපකරණ වැනි සෞඛ්‍ය අංශය වෙතින් පැන නැගුණු නව අවශ්‍යතා සැපිරීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය වීම පෙන්නුම් කරමිනි. නිමි රෙදිපිළි හා කොහු කෙඳි නිෂ්පාදනය සහ රෙදි මුද්‍රණ කටයුතු වැඩි වීම 2020 වසරේ දෙවන භාගයේ දී පෙන්නුම් කරන ලද වර්ධනය සඳහා බොහෝ දුරට දායක විය.

**වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශ 2020 වසරේ දී සමස්තයක් ලෙස අඩු වීමක් වාර්තා කළ ද, වසරේ දෙවන භාගයේ දී යථා තත්ත්වයට පත් වීමේ ස්වභාවයක් නිරීක්ෂණය කළ හැකි විය.** පිඟන් ගඩොල් (floor tiles), පෝසිලේන් පිඟන් භාණ්ඩ සහ වීදුරු බෝතල් නිෂ්පාදනය අඩු වීම වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන උප අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වයට බොහෝ දුරට දායක විය. දේශීය ඉදිකිරීම් අංශයෙන් සහ ගෝලීය වෙළඳපොළෙන් පැවති ඉල්ලුම අඩු වීම මෙන්ම, ආනයන සීමා පැනවීම ද වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය අඩු වීමට දායක විය. ඉල්ලුම අඩු වීම හේතුවෙන්, ඊයම් සහ ඇලුමිනියම් දඬු නිෂ්පාදනය අඩු වීම, මූලික ලෝහ වර්ග සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල සමස්ත ක්‍රියාකාරිත්වය අඩු වීමට දායක විය.

**අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2020 වසරේ මුල් භාගයේ දී සියයට 20.3ක අඩු වීමක් වාර්තා කළ නමුත් වසරේ දෙවන භාගයේ දී සියයට 1.6ක වර්ධනයක් වාර්තා කළේය.** මුල් කාලයේ දී දක්නට ලැබුණු මෙම මන්දගාමී ක්‍රියාකාරිත්වය සඳහා දේශීය වෙළඳපොළේ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන වෙත ඇති ඉල්ලුම අඩු වීම නිසා පෙට්‍රල්, සුදු ඩීසල්, දැවි තෙල් සහ තාර නිෂ්පාදනය අඩු වීම සහ 2020 වසරේ පෙබරවාරි මස 15 වන දින සිට දින 45ක කාලයක් සඳහා සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව අර්ධ වශයෙන් වසා දැමීම හේතු විය.

**2020 වසරේ දී දුම්කොළ නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතුණි.** ඒ අනුව, දුම්කොළ නිෂ්පාදන උප අංශයේ 2018 සහ 2019 වසරවල දී දක්නට ලැබුණු අඩු වීමේ ප්‍රවණතාව අනුගමනය කරමින් 2020 වසරේ දී ද සියයට 11.0ක අඩුවීමක් වාර්තා කළේය. දුම්කොළ නිෂ්පාදන මත පනවා ඇති ඉහළ බදු සහ කොවිඩ්-19 වසංගත තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික ඉල්ලුම අඩු වීම 2020 වසරේ දී දුම්කොළ නිෂ්පාදනය අඩු වීමට හේතුවිය.

**රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන, සම් සහ ඒ හා සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන, සහ රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශවල ක්‍රියාකාරිත්වය 2020 වසරේ දී පහළ ගියේය.** ජාත්‍යන්තර වෙළඳපොළ අවශ්‍යතා සපුරාලන රබර් ෂීට්, ප්ලාස්ටික් බෝතල්, ටයර්, රබර් බෝතල් සහ සිපර (zippers) නිෂ්පාදනය පහත වැටීම රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වයට හේතු විය. නිමි සම්, සම් බෑග්, පාසල් සපත්තු සහ සම් කබා නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් සම් සහ ඒ හා සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2020 වසරේ දී සියයට 33.5ක අඩු වීමක් වාර්තා කළේය. තීන්ත, පොහොර සහ ආස්තරණ මලු නිෂ්පාදනය අඩු වීම හේතුවෙන්, 2020 වසරේ මුල් භාගයේ දී රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ සියයට 23.2ක අඩු වීමක් දක්නට ලැබුණ ද, රට පුරා ආර්ථික හා සමාජ කටයුතුවලට පනවා තිබූ සීමා ලිහිල් කිරීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2020 වසරේ දෙවන භාගයේ දී මෙම අංශය සියයට 6.7ක වර්ධනයක් වාර්තා කර ඇත.

**මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2020 වසරේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.** කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමඟ ඖෂධ සහ සෞඛ්‍ය ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුමෙහි වැඩි වීමට ප්‍රතිචාර වශයෙන් කැප්සියුල සහ ආයුර්වේද බාම් නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් නිරීක්ෂණය විය. 2024 වසර වනවිට දේශීය ඖෂධ ඉල්ලුමෙන් අඩක් සපුරාලීමේ රජයේ ඉලක්කය හේතුවෙන් මෙම උප අංශයේ වර්ධන වේගය

අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය ඖෂධ අංශයට, දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනයට සහ හම්බන්තොට, අනුරාධපුර සහ හොරණ යන ප්‍රදේශවල නව ඖෂධ නිෂ්පාදන කලාප පිහිටුවීමට රජය දක්වන කැපවීම තුළින් ඉදිරි කාල සීමාව තුළ දී මෙම කර්මාන්තයට සහායක් ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.

**කාර්මික නිෂ්පාදන දර්ශකයේ කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය, දැව නිෂ්පාදන (ගෘහ භාණ්ඩ හැර), විදුලි උපකරණ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය යන ක්ෂේත්‍රවලට අදාළ උප අංශ 2020 වසරේ දී මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කර ඇත.** රැළි සහිත කඩදාසි (corrugated paper), කාඩ්බෝඩ් පෙට්ටි, කඩදාසි බෑග් සහ අභ්‍යාස පොත් නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් 2020 වසරේ දී කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය දුර්වල විය. වර්ධනය වෙමින් පවතින පාරිභෝගික පදනම සහ කල් පවතින පාරිභෝගික භාණ්ඩ අංශය තුළ දේශීයව නිපදවන විද්‍යුත් උපකරණවල වෙළඳපොළ කොටස ඉහළ යෑම මධ්‍යයේ වුව ද, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විදුලි උපකරණ සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන අංශවල වර්ධන වේගය වසර තුළ දී අඩාල විය.

### කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**2020 වසරේ දී කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හමුවේ මන්දගාමී වුව ද, කාර්මික කටයුතු අධීක්ෂණය කරන රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක විය.** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ යෙදී සිටියේය. ඛනිජ උපයෝගී කරගන්නා කර්මාන්තවලට ඔවුන්ගේ නිෂ්පාදනවල අගය එකතු කිරීමේ පරාසය පුළුල් කළ හැකි පරිසරයක් මෙම ප්‍රතිපත්ති රාමුව මගින් නිර්මාණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින්, විදේශ රැකියා අමාත්‍යාංශයේ සහාය ද ඇතිව, දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළවල වෙනස්වන අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට ද පියවර ගෙන තිබේ. තවද, අමාත්‍යාංශය විසින් 2020 වසරේ මාර්තු මාසයේ දී 'Inno Tech 2020' තාක්ෂණ හා නවෝත්පාදන ජාතික ප්‍රදර්ශනය හෝමාගම දී සාර්ථකව පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය මගින් සියලු සමාජ කොටස් අතර විද්‍යා සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කෙරිණ. රාජ්‍ය අංශයේ රැකියා ලබා දී ඇති අඩු ආදායම්ලාභී පවුල්වල නුපුහුණු පුද්ගලයන් 100,000ක් සඳහා, රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය හරහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා පුහුණු වැඩසටහන ආරම්භ කරන ලදී. මේ අතර, කර්මාන්ත අමාත්‍යාංශය විසින්, අදාළ රාජ්‍ය නියෝජිතායතන, ප්‍රමුඛ පෙළේ කර්මාන්තකරුවන් සහ ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ ද සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන, එකලස් කිරීම සහ අමතර කොටස් නිෂ්පාදන කර්මාන්ත සඳහා සම්මත මෙහෙයුම් පටිපාටි මාර්ගෝපදේශ සැකසීම සිදු කරන ලදී. එම ලේඛනයේ දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වසර ආරම්භයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිවිය.

**නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීමේ අරමුණින්, වෙනත් රජයේ ආයතන කිහිපයක් ද දේශීය කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම සඳහා පියවර ගත්තේය.** ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වෙළඳපොළ ප්‍රවේශය පහසු කිරීම සඳහා 2020 වසරේ දී ඊ-වාණිජ වෙළඳ පිවිසුමක් (E-Commerce Trade Portal) ස්ථාපනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුළින් විසිරුණු හා තනි තනිව ක්‍රියාත්මක වන ව්‍යවසායකයින්ගේ වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීමත්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මංගත වේදිකාවක් තුළ ඒකාබද්ධ කිරීම තුළින් එම ව්‍යවසායයන් නවීකරණය කිරීමත් අපේක්ෂා කෙරේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් කෙටිකාලීන ධාරිතා සංවර්ධන පුහුණු, මූල්‍ය උපදේශන, වෙළඳපොළ පහසුකම් සැපයීමේ සහ තවත් ව්‍යවසාය සංවර්ධන සේවා සැපයීමේ වැඩසටහන් කිහිපයක් ද මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී. 2020 වසරේ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින් 4,855ක් පුහුණු කළ අතර, තෝරාගත් කර්මාන්ත පොකුරු කිහිපයක් සඳහා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ද අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. තවද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දේශීය නිෂ්පාදනවල සම්භවය සහ අව්‍යාජබව තහවුරු කිරීමට 'Made in Sri Lanka' සන්නාමය එළිදක්වන ලද අතර, සෑම පළාතකම තාක්ෂණික පෙරවැඩුම මධ්‍යස්ථාන (Incubation and Technology Transfer Centres-ITTC)

2

පිහිටුවීමට පියවර ගන්නා ලදී. මේ අතර, අපනයනය, ආනයන ආදේශනය, දේශීය අගය එකතු කිරීම සහ රැකියා උත්පාදනය සඳහා ඉහළ විභවයක් සහිත දේශීය කර්මාන්ත සඳහා ආධාර කිරීම අරමුණු කරගත්, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව කාර්මික සංවර්ධන මණ්ඩලය විසින්, කර්මාන්ත අමාත්‍යාංශයේ සහ රාජ්‍ය බැංකුවක ද සහාය ඇතිව, 'Made in Sri Lanka' ණය යෝජනාක්‍රමය දියත් කරන ලදී. දේශීය නිෂ්පාදනවල ගුණාත්මකබව දියුණු කරන අතරම, අපනයන අරමුණු කරගත් සහ ආනයන ආදේශක නිපදවන දේශීය ව්‍යවසායයන්හි සංවර්ධනයට මෙම ණය වැඩසටහන ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම ව්‍යාපාරවල තිරසාර බව තහවුරු කිරීම පිණිස රාජ්‍ය බැංකුව මගින් විශේෂිත මූල්‍ය සහායක් ලබා දෙන අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ඊට අවශ්‍ය තාක්ෂණික හා කළමනාකරණ සහාය ලබා දෙනු ඇතැයි අපේක්ෂිතය. 2020 වසර අවසන් වන විට මෙම විශේෂ ණය යෝජනා ක්‍රමය සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 600ක් පමණ ලියාපදිංචි වී ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ දේශීය ආහාර නිෂ්පාදකයින් දිරිගැන්වීම පිණිස, නව නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින්, කර්මාන්ත අමාත්‍යාංශයේ සහාය ඇතිව, කටුබැද්ද ප්‍රදේශයේ දී ප්‍රතීතනය කරන ලද ආහාර රසායනාගාරයක් ද පිහිටුවන ලදී. මෙම ව්‍යාපෘතිය තුළින් ආහාර නිෂ්පාදන සාම්පල 246ක් සඳහා රසායනාගාර වාර්තා ලබා දී ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 112කට පමණ සේවා සපයා ඇත. මේ අතර, කාර්මික තාක්ෂණ ආයතනය විසින් කොවිඩ්-19 වසංගතය තුළින් හඳුනාගත් නව අවශ්‍යතා සපුරාලීම පිණිස වර්ෂය තුළ දී ශාකසාර නිෂ්පාදන වර්ග විස්සක් සහ ආහාර නිෂ්පාදන වර්ග දහයක් නිපදවන ලදී. දෑත් පිරිසිදු කිරීමට යොදාගන්නා විෂබීජනාශක දියර නිෂ්පාදනයට අදාළ තාක්ෂණය, කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් වෙත ලබාදෙන ලදී. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය මේ දක්වා පේටන්ට් බලපත්‍ර පහළොවක් සඳහා අයදුම් කර ඇති අතර, 2020/21 වසර සඳහා මේ වනවිට පේටන්ට් බලපත්‍ර හතකට අදාළ කටයුතු සිදුවෙමින් පවතී. ආදායම් උත්පාදනය කරන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින්, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් 2020 වසරේ දී පර්යේෂණ ව්‍යාපෘති 100කට අධික ප්‍රමාණයක් ඇගයීමට ලක් කරන ලදී.

**කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය නිසා ඇති වූ බාධා මධ්‍යයේ දේශීය කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්ත මණ්ඩල සහ වෙනත් අදාළ ආයතන විසින් පියවර රැසක් ගන්නා ලදී.** ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් 2020 වසරේ දී පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුම්වත් කිරීමට හා නගා සිටුවීමට අඛණ්ඩව උත්සාහ කරන ලදී. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලාංකික අපනයනකරුවන් ගෝලීය වෙළඳපොළ සමග සම්බන්ධ කෙරෙන ව්‍යාපාර-ව්‍යාපාර අතර කටයුතු සිදුකෙරෙන වේදිකාවක් (business-to-business (B2B) platform) හඳුන්වා දීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළේය. මූල්‍ය පහසුකම් වෙළඳපොළ හා තාක්ෂණය සඳහා ප්‍රවේශය සම්බන්ධ ගැටලු ඇතුළු ව්‍යවසායකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවලට විසඳුම් ලබාදෙමින්, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය අඛණ්ඩව කටයුතු කළේය. එකිනෙකට වෙනස් විවිධ ව්‍යාපාරික අංශ අතර සහයෝගීතාව වැඩිදියුණු කිරීම පිණිස, කර්මාන්ත සංගම් සහ ප්‍රාදේශීය මණ්ඩල සමග ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය අවබෝධතා ගිවිසුම් කිහිපයකට එළඹුණි. මේ අතර, ආර්ථිකය යළි නගාසිටුවීම වේගවත් කිරීම පිළිබඳ යෝජනා කිහිපයක් රජයට ඉදිරිපත් කරන අතරම, වෙළඳ හා ආයෝජන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳාම ආශ්‍රිත පුහුණු වැඩසටහන්, අන්තර්ජාල සම්මන්ත්‍රණ සහ වෙළඳ කතිකාවත් සඳහා පහසුකම් සැලසීමට ලංකා වාණිජ මණ්ඩලය අඛණ්ඩව කටයුතු කළේය. කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සහ ව්‍යවසායකයින් දැනුම්වත් කිරීම, බලගැන්වීම සහ විශ්වාසය ඉහළ නැංවීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් අන්තර්ජාල සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රධාන රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන වෙළඳ සේවා පිළිබඳව පුද්ගලික අංශය යාවත්කාලීන කිරීම සඳහාම සැකසූ 'Trade Watch' වෙබ් අඩවිය ලංකා වාණිජ මණ්ඩලය විසින් දියත් කරන ලදී.

**සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම මධ්‍යයේ ව්‍යවසායවල ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුවීම සහතික කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය එක්ව විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය.** සමාජ ආර්ථික කටයුතු සීමා කරන ලද කාල සීමාව තුළ දී මෙහෙයුම්

කටයුතුවලට අදාළ විමසීම් සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක උපකාරක කවුළුවක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලදී. අදාළ බලධාරීන් හා ඒකාබද්ධව සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමේ කාල සීමාව තුළ දී භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීමට අපනයන සංවර්ධන මණ්ඩලය මැදිහත් විය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන් සමඟ නව අවස්ථා පිළිබඳ ක්ෂණික තොරතුරු වාර්තා බෙදා ගැනීම පිණිස, විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සතිපතා මංගත රැස්වීම් සංවිධානය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් විදෙස් රටවල සිටින ශ්‍රී ලාංකික දූත මණ්ඩල සමඟ සක්‍රීයව සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මංගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම තුළින්, සහතික කරන ලද අපනයන ඇණවුම් සඳහා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට ද අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු කළේය. සන්නාමකරණය, අලෙවිකරණය සහ මූල්‍ය ගැටලු පිළිබඳව අපනයනකරුවන් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් දැනුම්වත් කිරීම සඳහා මංගත ව්‍යාපාර-ව්‍යාපාර අතර සිදු කෙරෙන (B2B) ප්‍රවර්ධන වැඩසටහන් සහ නිරන්තර අන්තර්ජාල සම්මන්ත්‍රණ පැවැත්වීමට අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු කළේය. මේ අතර, රට තුළට පැමිණෙන සහ රටෙන් පිටතට ගමන් කරන ප්‍රවර්ධන දූත මෙහෙයුම් සඳහා සෘජු බලපෑම් ඇති කරමින් සංචරණ සීමා පැනවීමත් සමඟ, ආයෝජන මණ්ඩලය සිය ප්‍රවර්ධන උපායමාර්ගය සඳහා අතථ්‍ය මාධ්‍ය යොදාගන්නා ලදී. කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් නිෂ්පාදන සඳහා වෙනස්වන සහ ඉහළ යන ඉල්ලුම සපුරාලීම පිණිස අතිරේක නිෂ්පාදනවල නිරත වීමට ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාර සඳහා අවසර ලබා දෙන ලදී. 2020 වසරේ දී ආයෝජන මණ්ඩලය විසින් සමාගම් 50ක් සඳහා අතිරේක ක්‍රියාකාරකමක් ලෙස පුද්ගලික ආරක්ෂණ උපකරණ නිෂ්පාදනයේ නියැලීමට අනුමැතිය ලබා දෙන ලදී. කලාපීය ව්‍යවසායයන් සඳහා පහසුකම් සපයන්නා ලෙස, ආර්ථික හා සමාජ කටයුතු සීමා කරන ලද කාලය තුළ දී ව්‍යාපාර මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට සහාය වීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ශ්‍රී ලංකා රේගුවේ උපදෙස් ඇතිව, ආයෝජන මණ්ඩලය යටතේ සිටින අපනයනකරුවන් සඳහා නිර්ලේඛන ආනයන හා අපනයන ලියවිලි සකස් කිරීමේ ක්‍රමවේදයක් ආයෝජන මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලදී. රබර් භාවිතයෙන් සකස් කෙරෙන නිෂ්පාදනවල දේශීය අගය එකතු කිරීම වර්ධනය කිරීම පිණිස, එ.ජ. ඩොලර් මිලියන 550ක සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරෙන ප්‍රධාන ව්‍යාපෘති දෙකකට ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සපයන ලදී. එ.ජ. ඩොලර් මිලියන 100ක උපලබ්ධි ආයෝජන වටිනාකමක් ඇති මෝටර් රථ රේඩියල් ටයර් (Passenger Car Radial (PCR) tyres) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක පළමු අදියර 2020 වසරේ දී නිම කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 2021 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතියේ දෙවන අදියර 2022 වසරේ මාර්තු මාසයේ මැද භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරෙයි. මේ අතර, හම්බන්තොට ජාත්‍යන්තර වරාය තුළ අක්කර 121ක භූමි ප්‍රමාණයක විහිදුනු, ටයර් නිෂ්පාදන කම්හලක් ඉදිකිරීම සඳහා 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් එ.ජ. ඩොලර් මිලියන 300ක සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරෙයි.

**රජය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයෝගය ද ඇතිව, කොවිඩ්-19 වසංගතයෙන් දැඩි බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ස්වයං රැකියාවල නියුතු අයට සහ පුද්ගලයින්ට ණය සහන, ණය වාරික ගෙවීම පමා කිරීමේ සහනය සහ කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ඇතුළු පුළුල් සහන පැකේජයක් හඳුන්වා දුන්නේය.** කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත බාධාවලින් දැඩිලෙස බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම පිණිස මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම අදියර තුනක් යටතේ හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම යටතේ සහභාගී වන බැංකුවලට මහ බැංකුව විසින් සහනදායී පොලී අනුපාතයකට අරමුදල් සපයන අතර, එම වාණිජ බැංකු විසින් මෙම අරමුදල් මාස 6ක සහන කාලයක් ද සහිතව ආපසු ගෙවීමේ කාලය මාස 24ක් වන පරිදි සියයට 4.0ක වාර්ෂික පොලී අනුපාතයකට යටත්ව ණය ලබා දීමට යොදා ගත යුතුය. ඒ අනුව වසර අවසාන වන විට, කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලින් ලද ණය අයදුම්පත් 59,854ක් සඳහා රුපියල් බිලියන 173.9ක ණය මුදල් ප්‍රමාණයක් අනුමත කර ඇත. තවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන, කුඩා හා මධ්‍ය පරිමාණ

ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය සහ පියැසි මත සූර්ය බලශක්ති උත්පාදනය කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය 2020 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2020 වසර අවසානය වනවිට මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ රුපියල් බිලියන 32.8ක ණය ලබා දී ඇත. තවද, 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' ණය වැඩසටහන සඳහා 2020 වසරේ දී රජයේ සමස්ත සහනාධාර ගෙවීම රුපියල් බිලියන 6.0ක් විය.

### ඉදිකිරීම් සහ පතල් හා කැණීම්

**2019 වසරේ දී පිළිවෙළින් සියයට 4.0කින් සහ සියයට 2.8කින් වර්ධනය වූ ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු 2020 වසරේ දී වසංගත තත්ත්වය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු මත ඇති වූ අහිතකර බලපෑම් හේතුවෙන් පිළිවෙළින් සියයට 13.2කින් සහ සියයට 12.5කින් පහළ යන ලදී.** මෙහිදී, ප්‍රධාන වශයෙන් වැලි කැණීම් ඇතුළු ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයන කැණීම් කටයුතුවලට අමතරව මැණික් කැණීම් සහ වෙනත් කැණීම් කටයුතුවලින් පතල් හා කැණීම් කටයුතු සමන්විත වේ. කොවිඩ්-19 වසංගතය සහ ඒ ආශ්‍රිතව පැන වූ සංචරණ සීමා හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවලට වූ අහිතකර බලපෑම පතල් හා කැණීම් කටයුතුවල පසුබෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. 2020 වසරේ දී ඉදිකිරීම් කටයුතුවල ඇති වූ මෙම පසුබෑම, රටෙහි සමස්ත සිමෙන්ති උපයෝජ්‍යතාව සියයට 11.5කින් සැලකිය යුතු ලෙස පහළ යෑම තුළින් පිළිබිඹු විය. තවද, ආනයන ආදේශන කර්මාන්ත දිරිගැන්වීම සඳහා අනුගමනය කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ද පහළ යන ලදී. කෙසේ වුවද, එමගින් ඉදිකිරීම් ආශ්‍රිත දේශීය නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම ඉහළ යන ලදී. මේ අතර, වසරේ අවසාන භාගයේ දී ඉදිකිරීම් කටයුතුවල ද ඒ ආශ්‍රිත පතල් හා කැණීම් කටයුතුවල ද ක්‍රමික වර්ධනයක් පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පුද්ගලික නිවාස ඉදිකිරීම් කටයුතු ද ඇතුළත් ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ලද ණය ප්‍රමාණය 2020 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ කෙරෙහි අඩු පොලී අනුපාතික ද හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන ඉදිකිරීම් අංශය හා සම්බන්ධ ව්‍යාපාර සමීක්ෂණවලින් ද අනාවරණය වූ පරිදි වසංගතයත් සමඟම ඇති වූ සෞඛ්‍යය හා සම්බන්ධ ගැටලු හේතුවෙන් ඉදිකිරීම් ආයතන බහුතරයක ක්‍රියාකාරකම්, විශේෂයෙන් වසරේ දෙවන කාර්තුවේ දී අඩු මට්ටමක පැවතුණි.


### විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

**විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල එකතු කළ අගය 2019 වසරේ දී වාර්තා කළ සියයට 4.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී ආර්ථිකයේ පැවති අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් සියයට 0.8ක සුළු පහළ යෑමක් වාර්තා කරන ලදී.** මෙහි විශාලතම උප කාණ්ඩය වන විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු 2019 වසරේ දී වාර්තා කළ සියයට 4.0ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 1.6ක පහළ යෑමක් වාර්තා කරන ලදී. විදුලිය උත්පාදනයට අදාළ දත්ත සලකා බැලීමේ දී, විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුව තුළ දී ආර්ථික ක්‍රියාකාරකම් අඩු මට්ටමක පැවතීම හේතුවෙන් කර්මාන්ත අංශයෙන් විදුලිය සඳහා පැවති ඉල්ලුම අඩු වූ බැවින් 2020 වසරේ දී සමස්ත විදුලි උත්පාදනය සුළු වශයෙන් පහත වැටුණි. මෙම කාණ්ඩයෙහි අනෙකුත් උප ආර්ථික කටයුතු සැලකීමේ දී, 2020 වසරේ දී ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීමේ කටයුතුවල එකතු කළ අගය සියයට 4.8ක වර්ධනයක් වාර්තා කළ අතර, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතුවල එකතු කළ අගය සියයට 1.0ක පහළ යෑමක් වාර්තා කරන ලදී.

### සේවා

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විශේෂයෙන් තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ ආශ්‍රිත සේවා ඇතුළු ඇතැම් සේවා කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණ ද සංචරණය හා බැඳුණු සේවා කටයුතු මෙන්ම සංචාරක කර්මාන්තය කෙරෙහි ද ඇති වූ දැඩි බාධා හමුවේ සමස්ත සේවා කටයුතු 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.2ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 1.5කින් පහත වැටුණි.** වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ මාර්තු මාසයේ මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ සංචරණ සීමා හමුවේ සංචාරකයන්ගේ පැමිණීම දැඩි ලෙස පහත වැටීම සංචාරක කර්මාන්තය ආශ්‍රිත සේවාවන් කෙරෙහි විශාල ලෙස බලපෑම් ඇති කරන ලදී. ඒ අනුව, පනවන ලද සංචරණ සීමා මධ්‍යයේ ප්‍රවාහන සේවා, වෙනත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා දැඩිලෙස පීඩාවට පත්වීම, සමස්ත සේවා කටයුතුවල මෙම පසුබෑම සඳහා විශාල වශයෙන් හේතු විය. එසේ වුවද, වසංගතය හමුවේ ඩිජිටල් සේවා හා සන්නිවේදන පහසුකම් සඳහා වූ ඉල්ලුම ඉහළ යෑමත් සමඟ

**2.9 රූප සටහන**
**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වර්ධනීය තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන සේවා වර්ධනය විය. එසේම, මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම, සෞඛ්‍ය සේවා සහ රාජ්‍ය පරිපාලන කටයුතු ද වසර තුළ දී වර්ධනය විය. වසංගතය හේතුවෙන් සේවා කටයුතුවල දක්නට ලැබුණු සමස්ත පසුබෑම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය කොවිඩ්-19 වසංගතය රටට දැඩි ලෙස බලපෑම් ඇති කළ මාසවල දී මාසික පදනමින් පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. තවද, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි, සේවා කටයුතුවලට අදාළ ඉල්ලුම සහ විකුණුම් සම්බන්ධ උප දර්ශක වසර තුළ කඩඉම් මට්ටමට වඩා පහළ අගයක් වාර්තා කරන ලදී. එසේම, ප්‍රජා සංචරණය පිළිබඳ ගූගල් සමාගමේ වාර්තා (Google Mobility Reports) මගින් ද 2020 වසරේ දී ඇතැම් ප්‍රධාන සේවා කටයුතුවල සිදු වූ පසුබෑම පිළිබිඹු කරන ලදී.

### තොග සහ සිල්ලර වෙළඳාම

**අඩු මට්ටමක පැවති ඉල්ලුම සහ සංචරණ සීමා කිරීම් හමුවේ 2020 වසරේ දී තොග සහ සිල්ලර වෙළඳාමේ එකතු කළ අගය, 2019 වසරේ වාර්තා කළ සියයට 3.0ක වර්ධනයට සාපේක්ෂව සියයට 1.4ක අඩු වර්ධනයක් පමණක් වාර්තා කරන ලදී.** ඉල්ලුමේ ඇති වූ අඩු වර්ධනයට අමතරව අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ විශේෂයෙන්ම උත්සව සමයන්හි දී කොවිඩ්-19 වසංගතය පාලනය සඳහා පනවනු ලැබූ සංචරණ සීමා කිරීම් 2020 වසරේ වෙළඳ කටයුතුවල මෙම අඩු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වෙළඳ කටයුතු සඳහා ඇති අවකාශය සීමා කරමින්, පෙර වසරේ ද පහළ යෑමක් වාර්තා කළ සමස්ත ආනයන පරිමා දර්ශකය මෙම වසරේ දී තවදුරටත් පහළ යන ලදී. ආනයන පරිමා දර්ශකයෙහි උප දර්ශක සැලකීමේ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය තවදුරටත් පහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයේ සිදු වූ පහත වැටීම හේතු විය. මේ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පරිමා ද 2020 වසරේ දී පහළ ගියේය.

2

### ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

**මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල එකතු කළ අගය 2019 වසරේ දී වාර්තා කළ සියයට 1.4ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 6.7කින් පහත වැටුණු අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන වූ සංචරණ සීමා සහ සංචාරක කර්මාන්තයේ ඇති වූ පසුබෑම හේතු විය.** ප්‍රවාහන කටයුතු සඳහා ඇති වූ මෙම බාධාවන් ඒ ආශ්‍රිත දර්ශක මගින් ද තහවුරු විය. ගොඩබිම් ප්‍රවාහන කටයුතු සැලකීමේ දී බස් රථ මගින් සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සැලකිය යුතු තරම් අඩු විය. ගූගල් සමාගම විසින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනයට අදාළ ප්‍රජා සංචරණය පිළිබඳ වාර්තා මගින් ද මෙම පහළ යෑම පිළිබිඹු විය. මේ අතර, ගුවන් ප්‍රවාහන කටයුතු ද මෙම වසරේ දී සැලකිය යුතු ලෙස අඩු වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් වසංගතය පාලනය උදෙසා 2020 වසරේ මාර්තු මැද භාගයේ සිට ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළවල මෙහෙයුම් කටයුතු සීමා කිරීම හේතු විය. ඒ අනුව, වසර තුළ දී ශ්‍රී ලංකන් ගුවන් සේවය මගින් මෙහෙයවනු ලැබූ මගී කිලෝමීටර් ප්‍රමාණයෙහි සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. ජලය ආශ්‍රිත ප්‍රවාහන කටයුතු හා සම්බන්ධ දර්ශක සැලකීමේ දී, ශ්‍රී ලංකා වරායයන් මගින් හසුරුවනු ලැබූ බහාලුම් ප්‍රමාණය (අඩි 20ට සමාන බහාලුම් ඒකකවලින්) මෙන්ම නැව් බඩු ප්‍රමාණය ද 2019 වසරට සාපේක්ෂව මෙම වසරේ දී පහළ යන ලදී.

## නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන්

**2019 වසරේ දී සියයට 4.6කින් පහළ ගිය නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවල එකතු කළ අගය සංචාරක පැමිණීම්වල දක්නට ලැබුණු පහත වැටීමත් සමග 2020 වසරේ දී සියයට 39.4කින් සැලකිය යුතු ලෙස තවදුරටත් පහත වැටුණි.** පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් 2019 වසරේ දී බලපෑමට ලක් වූ සංචාරක පැමිණීම් 2020 වසරේ දී වසංගත තත්ත්වය පාලනය සඳහා පනවන ලද සංචාරක පැමිණීම් සීමා කිරීම හේතුවෙන් සියයට 73.5කින් තවදුරටත් අඩු විය. ඒ අනුව, සංචාරක ඉපැයීම් මෙන්ම සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත ශ්‍රේණිගත හෝටල්වල කාමර උපයෝජන අනුපාතයේ සාමාන්‍යය පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, සංචරණය සහ ජන එක්රැස්වීම්වලට බලපැවැත්වෙන ලද සීමාකිරීම් හේතුවෙන් දේශීය වශයෙන් ද හෝටල් හා ආපනශාලා ආශ්‍රිත සේවා සඳහා වූ ඉල්ලුම තවදුරටත් පහළ යන ලදී.

## මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

**මූල්‍ය, රක්ෂණය, නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.4ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 5.0කින් වර්ධනය වූ අතර, මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් වසර පුරා පවත්වාගෙන යනු ලැබූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යටතේ මූල්‍ය සේවාවල සිදු වූ සැලකිය යුතු වර්ධනය හේතු විය.** ඒ අනුව, 2019 වසරේ දී සියයට 2.0ක වර්ධනයක් වාර්තා කළ මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවා 2020 වසරේ දී සියයට 10.9කින් වර්ධනය විය. මූල්‍ය සේවා හා සම්බන්ධ දර්ශක සැලකීමේ දී, 2020 වසරේ දී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල දළ ණය සහ අත්තිකාරම්වල එකතුව පෙර වසරට සාපේක්ෂව වර්ධනය විය. මෙම වර්ධනය ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි බැංකු ණය සඳහා වූ ඉල්ලුම උප දර්ශකයේ ඉහළ යෑම මගින් ද පිළිබිඹු විය. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය පදනමෙන් පවත්වනු ලබන ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයෙන් ද ණය දීම සඳහා බැංකුවල ඇති කැමැත්ත 2020 වසර තුළ දී ඉහළ යනු දක්නට ලැබුණි. තවද, පවතින අඩු පොලී අනුපාතික වාතාවරණය යටතේ වුවද බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල සමස්ත තැන්පතු ප්‍රමාණය ද 2020 වසරේ දී වර්ධනය විය. මේ අතරතුර රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය ආශ්‍රිත කටයුතු 2020 වසරේ දී සියයට 0.6කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම ආශ්‍රිත කටයුතු මෙම වසරේ දී සියයට 1.2ක පහළ යෑමක් වාර්තා කරන ලදී.

## තොරතුරු සහ සන්නිවේදනය

**සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හමුවේ විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සේවා සඳහා පැවති ඉල්ලුම වසර පුරා වර්ධනය වීමේ ප්‍රතිලාභ ලබමින් එම සේවා 2019 වසරේ දී වාර්තා කළ සියයට 16.2ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 14.1කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය පාලනය සඳහා සංචරණ සීමා කිරීමේ සහ භෞතික දුරස්ථභාවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන්, බොහෝ සේවා ස්ථාන සහ අධ්‍යාපන ආයතන මගින් නිවසේ සිට රාජකාරී කිරීමේ කටයුතු සහ ඉගෙනීම් කටයුතු කිරීමට අනුගත වීමත් සමග සන්නිවේදන සේවා විසින් පුළුල් කාර්යභාරයක් ඉටු කිරීම හේතුවෙන්, විදුලි සංදේශ සේවා 2019 වසරේ වාර්තා කළ සියයට 17.2ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී තවදුරටත් සියයට 15.4ක වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, ව්‍යාපාර, රාජ්‍ය හා සමාජ අංශවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය හා සහසම්බන්ධතාව පවත්වාගෙන යෑම තහවුරු කිරීමෙහිලා අන්තර්ජාලය ආශ්‍රිත වාණිජ සේවා හා ඩිජිටල් සේවා වැනි තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුම පිළිබිඹු කරමින් පරිගණක වැඩසටහන් සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා ද, 2019 වසරේ වාර්තා කර තිබූ සියයට 13.1ක වර්ධනයට සාපේක්ෂව තවදුරටත් 2020 වසරේ දී ද සියයට 10.0ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

## අනෙකුත් සේවා කටයුතු

**අනෙකුත් සේවා කටයුතු සැලකීමේ දී, වසංගතයේ අහිතකර බලපෑම හේතුවෙන් වෙනත් පෞද්ගලික සේවා සහ වෘත්තීයමය සේවාවල පහළ යාමක් දක්නට ලැබුණු අතර, රාජ්‍ය පරිපාලනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය ආශ්‍රිත සේවා 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී වර්ධනය විය.** මහජන සෞඛ්‍ය සම්බන්ධ ගැටලු, සංචරණ හා සමාජ දුරස්ථභාවය සම්බන්ධ සීමා හේතුවෙන් විනෝදාස්වාද කටයුතු හා රූපලාවන්‍ය කටයුතු වැනි වෙනත් පෞද්ගලික සේවා සඳහා ඇති ඉල්ලුම වසර තුළ දී අඩු විය. එමෙන්ම, සංචාරක කටයුතුවල පහළ යෑම හේතුවෙන්

හෝටල් හා ආපනශාලා ආශ්‍රිත පෞද්ගලික සේවා සඳහා පැවති ඉල්ලුම ද පහළ යන ලදී. ඒ අනුව, 2019 වසරේ දී සියයට 2.1ක වර්ධනයක් වාර්තා කළ වෙනත් පෞද්ගලික සේවා 2020 වසරේ දී සියයට 6.5කින් පහත වැටුණි. මේ අතර, වෘත්තීයමය සේවා ද වසර තුළ දී සියයට 2.7කින් පහළ ගියේය. එසේ වුවද, විශේෂයෙන් වසංගතය මැඩපැවැත්වීම පිණිස වසර පුරා රාජ්‍ය අංශයෙහි වූ මැදිහත්වීම දායක කොටගෙන රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය ආශ්‍රිත කටයුතු 2020 වසරේ දී සියයට 1.6කින් ද සෞඛ්‍ය ආශ්‍රිත සේවා සියයට 4.3කින් ද වර්ධනය විය. තවද, අධ්‍යාපන කටයුතු 2020 වසරේ දී සියයට 0.9කින් වර්ධනය විය.

## 2.5 වියදම

**පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.) පවත්නා මිල අනුව 2019 වසරේ දී වාර්තා කළ සියයට 3.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී තවදුරටත් වර්ධනයක් වාර්තා නොකරන ලදී.** මෙහිදී, 2019 වසරට සාපේක්ෂව පවත්නා මිල අනුව ආයෝජන වියදම සියයට 6.2කින් පහත වැටුණු අතර පරිභෝජන වියදම සියයට 2.1ක මන්දගාමී වේගයකින් වර්ධනය විය. විදේශීය අංශය සැලකූ විට, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සැලකිය යුතු ලෙස අහිතකර බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාවේ අපනයන ගමනාන්තවල තිබූ අඩු ඉල්ලුම පිළිබිඹු කරමින්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී භාණ්ඩ හා සේවා අපනයන සියයට 28.5කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතරතුර දී, අත්‍යවශ්‍ය නොවන ආනයන තාර්කිකරණය කිරීම සහ ආනයන ආදේශක කර්මාන්ත දිරිගැන්වීමට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 වසරට සාපේක්ෂව භාණ්ඩ හා සේවා ආනයන සියයට 21.8කින් පහත වැටීම ශුද්ධ විදේශීය ඉල්ලුම කෙරෙහි යහපත් ලෙස දායක විය. ඒ අනුව, පවත්නා මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම 2019 වසරේ දී වාර්තා කළ සියයට 13.4ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 3.5කින් පහත වැටුණි. මෙහි සමස්ත ප්‍රතිඵලයක් ලෙස ද.දේ.වි. හා ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සැදුම්ලත් ද.දේ.නි. 2019 වසරේ දී පවත්නා මිල අනුව වාර්තා කළ සියයට 5.1ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 0.3කින් සුළු වශයෙන් පහත වැටුණි. මේ අතර ස්ථාවර මිල අනුව සැලකීමේ දී ද ද.දේ.වි. 2019 වසරේ දී වාර්තා කළ සියයට 0.7ක සුළු පහත වැටීමට සාපේක්ෂව 2020 වසරේ දී පරිභෝජන මෙන්ම ආයෝජන වියදම් ද පහත වැටීම හේතුවෙන් සියයට 4.6ක වැඩි වේගයකින් පහළ ගියේය. අපනයනවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම හමුවේ වුවද, ආනයන සීමා කිරීමේ

**2.9 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම (අ)**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළඳපොළ මිල අනුව | | | 2010 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2018 (ආ) | 2019 (ආ)(ඇ) | 2020 (ඇ) | 2018 (ආ) | 2019 (ආ)(ඇ) | 2020 (ඇ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 11,086,732 | 11,902,168 | 12,146,234 | 7,453,373 | 7,739,402 | 7,556,276 |
| (% වෙනස) | 10.0 | 7.4 | 2.1 | 3.2 | 3.8 | -2.4 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 4,266,053 | 4,030,195 | 3,778,482 | 3,487,278 | 3,122,105 | 2,806,894 |
| (% වෙනස) | 1.3 | -5.5 | -6.2 | 3.6 | -10.5 | -10.1 |
| **මුළු දේශීය ඉල්ලුම** | **15,352,785** | **15,932,363** | **15,924,716** | **10,940,651** | **10,861,507** | **10,363,170** |
| **(% වෙනස)** | **7.4** | **3.8** | **0.0** | **3.3** | **-0.7** | **-4.6** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 3,292,414 | 3,472,337 | 2,483,056 | 1,722,275 | 1,845,686 | 1,668,855 |
| (% වෙනස) | 13.2 | 5.5 | -28.5 | 0.5 | 7.2 | -9.6 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 4,354,292 | 4,391,746 | 3,434,777 | 2,997,547 | 2,823,843 | 2,501,420 |
| (% වෙනස) | 12.4 | 0.9 | -21.8 | 1.8 | -5.8 | -11.4 |
| **ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-1,061,878** | **-919,410** | **-951,721** | **-1,275,272** | **-978,157** | **-832,565** |
| **(% වෙනස)** | **-10.3** | **13.4** | **-3.5** | **-3.5** | **23.3** | **14.9** |
| 3. මුළු ඉල්ලුම | **14,290,907** | **15,012,953** | **14,972,995** | **9,665,379** | **9,883,350** | **9,530,606** |
| **(% වෙනස)** | **7.2** | **5.1** | **-0.3** | **3.3** | **2.3** | **-3.6** |

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ක්‍රියාමාර්ග තුළින් ලද ධනාත්මක දායකත්වය හේතුවෙන් ස්ථාවර මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම සියයට 14.9කින් වර්ධනය විය. මෙම තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර මිල අනුව ද.දේ.නි. 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 3.6කින් පහත වැටුණි.

2

### පරිභෝජනය

**2020 වසරේ දී පවත්නා මිල අනුව ආර්ථිකයේ සමස්ත වියදමෙන් සියයට 81.1ක් වූ පරිභෝජන වියදම, 2019 වසරේ දී වාර්තා කළ සියයට 7.4ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 2.1ක අඩු වර්ධනයක් වාර්තා කරන ලද අතර, මේ සඳහා කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම සහ ආදායම් මාර්ග අවිනිශ්චිත වීම නිසා පාරිභෝගිකයින් සිය වියදම් පිළිබඳව වඩා සැලකිලිමත් වීම හේතු විය.** මෙම අඩු වර්ධනය කෙරෙහි ප්‍රධාන පරිභෝජන වියදම් කාණ්ඩය වන පෞද්ගලික පරිභෝජන වියදමේ දක්නට ලැබුණු සැලකිය යුතු අඩු වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, වසර තුළ දී බොහෝ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ද ඉහළ මට්ටමක පැවතුණි. මේ අතරතුර දී, රජයේ පරිභෝජන වියදම පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 9.8ක ඉහළ වේගයකින් වර්ධනය විය.

**2019 වසරේ දී සියයට 7.3කින් වර්ධනය වූ සමස්ත පෞද්ගලික පරිභෝජන වියදම 2020 වසරේ දී, කොවිඩ්-19 වසංගතය පාරිභෝගික හැසිරීම කෙරෙහි ඇති කළ අහිතකර බලපෑම පිළිබිඹු කරමින් සියයට 1.0ක සුළු වර්ධනයක් පමණක් වාර්තා කළේය.** වසංගතය හේතුවෙන් සංචරණ සීමා පැනවීම, නිවාසවල සිට සේවයන්හි නියුක්ත වීමට කටයුතු කිරීම සහ අනෙකුත් සෞඛ්‍යාරක්ෂිත පියවර ගැනීම හේතුවෙන් බොහෝ වෙළඳපොළ කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් පාරිභෝගිකයන් වෙළඳසැල් කරා යොමු වීම අඩු වූ අතර එහෙයින් ප්‍රවාහනය, හෝටල් හා ආපනශාලා සහ ඇඳුම් පැළඳුම් හා පාවහන් වැනි බොහෝ පෞද්ගලික පරිභෝජන වියදම් කාණ්ඩවල පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, වසංගත තත්ත්වයක් යටතේ වුවද අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා වන ආහාර හා මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය, නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් බලශක්ති, සෞඛ්‍යය සහ සන්නිවේදනය වැනි කාණ්ඩවලට අයත් පෞද්ගලික පරිභෝජන වියදම් වසර තුළ දී වර්ධනය විය.

**පවත්නා මිල අනුව රජයේ පරිභෝජන වියදම 2019 වසරේ දී වාර්තා කළ සියයට 8.1ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 9.8ක ඉහළ වේගයකින් වර්ධනය විය.** අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා වියදම් අඩංගු වන රජයේ පුද්ගල පරිභෝජන වියදම 2019 වසරේ දී වාර්තා කළ සියයට 28.0ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී තවදුරටත් සියයට 17.8ක

**2.10 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)**

| කාණ්ඩය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|
| | 2018 (ආ) | 2019 (ආ)(ඇ) | 2020 (ඇ) | 2019 (ආ)(ඇ) | 2020 (ඇ) |
| 1. ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය | 29.2 | 28.0 | 30.9 | 2.6 | 11.5 |
| 2. මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය | 3.5 | 3.6 | 3.4 | 9.9 | - 4.0 |
| 3. ඇඳුම්-පැළඳුම් සහ පාවහන් | 4.1 | 4.2 | 3.6 | 10.1 | - 13.2 |
| 4. නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් | 10.3 | 10.2 | 10.4 | 6.4 | 3.5 |
| 5. ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන් | 1.1 | 1.0 | 1.0 | 2.8 | - 2.1 |
| 6. සෞඛ්‍යය | 2.7 | 2.8 | 2.9 | 14.0 | 2.1 |
| 7. ප්‍රවාහනය | 23.8 | 24.2 | 20.2 | 9.3 | - 15.9 |
| 8. සන්නිවේදනය | 0.9 | 0.7 | 0.8 | - 11.3 | 2.5 |
| 9. ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු | 1.7 | 1.7 | 1.8 | 4.9 | 5.3 |
| 10. අධ්‍යාපනය | 1.2 | 1.2 | 1.4 | 9.8 | 9.8 |
| 11. හෝටල් සහ ආපනශාලා පහසුකම් | 4.2 | 4.0 | 2.6 | 0.1 | - 34.2 |
| 12. වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම | 21.8 | 21.6 | 21.5 | 6.4 | 0.5 |
| 13. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 2.9 | 2.9 | 1.4 | 9.0 | - 52.3 |
| 14. අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 7.3 | 6.2 | 1.7 | - 9.4 | - 72.5 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **7.3** | **1.0** |

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රජයේ සමස්ත පරිභෝජන වියදමෙහි වර්ධනයට දායක විය. තවද, රජයේ ප්‍රධාන පරිභෝජන වියදම් කාණ්ඩය වන ආරක්ෂාව, පොදු මහජන සේවා හා සමාජ ආරක්ෂණය වැනි ප්‍රජාවක් ලෙස සමස්තයටම ප්‍රතිලාභ ගෙන දෙන රජයේ සමූහ පරිභෝජන වියදම 2019 වසරේ දී වාර්තා කළ සියයට 0.2ක සුළු වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 5.8කින් වර්ධනය විය. කොවිඩ්-19 වසංගතය මැඩපැවැත්වීම සඳහා වූ රජයේ මැදිහත්වීම, විශේෂයෙන්ම සෞඛ්‍යය, නීතිය හා සාමය සහ ආරක්ෂාව වැනි කාණ්ඩ සඳහා වූ රජයේ පරිභෝජන වියදම ඉහළ යෑම කෙරෙහි දායක විය.

### ආයෝජන

**වසංගත තත්ත්වය නිසා දේශීය මෙන්ම ගෝලීය වශයෙන් ද ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීමට ගතවන කාලය පිළිබඳව පැවති අවිනිශ්චිත තත්ත්වය හේතුවෙන් පවත්නා මිල අනුව ආයෝජන වියදම 2019 වසරේ දී වාර්තා කළ සියයට 5.5ක පහත වැටීමට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 6.2කින් තවදුරටත් පහත වැටුණි.** මේ කෙරෙහි, 2019 වසරේ දී සියයට 8.1කින් වර්ධනය වූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 2020 වසරේ දී සියයට 6.4කින් සැලකිය යුතු ලෙස පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2019 වසරේ දී ධනාත්මක දායකත්වයන් දක්වන ලද ඉදිකිරීම්, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර වැනි ප්‍රධාන දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදක කාණ්ඩවල වර්ධනය 2020 වසරේ දී පහත වැටුණි. මෙහිදී, ප්‍රධානතම ආයෝජන වියදම් කාණ්ඩය වන ඉදිකිරීම් කටයුතු, වසංගත තත්ත්වය ආශ්‍රිතව ඇති වූ විවිධ අවහිරතා හේතුවෙන් දැඩි පසුබෑමකට ලක් වූ අතර එය ආයෝජන කටයුතුවල පහළ යෑම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන ලදී. කෙසේ වුවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ සහ බුද්ධිමය දේපළ සඳහා වූ ආයෝජන වියදම්වල පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් දක්නට ලැබුණි. තවද, වසර තුළ දී තොග/පරිලේඛන වෙනස්වීම්හි අඩු වීමක් වාර්තා විය.

**ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම්වලට ලැබුණු, ණය ද ඇතුළත්, විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය, 2019 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,188.7 හා සැසඳීමේ දී 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 687.0ක්[5] දක්වා සියයට 42.2කින් අඩු විය.** විදේශීය ආයෝජනවල අඩු වීම සෑම අංශයකම දක්නට ලැබුණි. මේ අතර, 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වගන්ති යටතේ, 2020 වසරේ දී ආයෝජන මණ්ඩලය විසින් අනුමත

5 මෙයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු, ණය ද ඇතුළත් වූ, ලැබීම් අයත් වන අතර, මෙම ඇස්තමේන්තු 5වන පරිච්ඡේදයේ දක්වා ඇති විදේශ සෘජු ආයෝජන ඇස්තමේන්තුවලට සමාන නොවේ. 5වන පරිච්ඡේදයේ සඳහන් පරිදි 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 670ක් වූ සමස්ත විදේශ සෘජු ආයෝජන ඇස්තමේන්තුවට ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම්වලට ලැබුණු සෘජු ආයෝජන ද ඇතුළත් වීම මෙම වෙනසට හේතුවයි.

**2.11 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායවල ආයෝජන සහ සේවා නියුක්තිය**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | | | | ඇස්තමේන්තුගත සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 (අ) | 2020 (ආ) | 2019 (අ) | | | 2020 (ආ) | | | 2019 (අ) | 2020 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ) | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 160 | 155 | 4,586,993 | 145,675 | 4,732,667 | 283,800 | 122,527 | 406,327 | 32,654 | 14,221 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 150 | 154 | 4,583,193 | 145,444 | 4,728,638 | 282,427 | 122,527 | 404,954 | 32,348 | 14,101 |
| 16 වන වගන්තිය යටතේ | 10 | 1 | 3,800 | 230 | 4,030 | 1,373 | - | 1,373 | 306 | 120 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 107 | 122 | 4,518,594 | 118,278 | 4,636,872 | 131,342 | 165,858 | 297,201 | 24,485 | 15,856 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ) | 2,004 | 1,979 | 2,223,472 | 1,608,440 | 3,831,912 | 2,224,159 | 1,738,639 | 3,962,798 | 521,428 | ලැ.නො. |
| වාණිජ කටයුතුවල නිරතවූ ව්‍යාපෘති (ඈ) | 2,610 | 2,651 | 549,087 | 851,050 | 1,400,137 | 606,527 | 975,024 | 1,581,551 | 425,154 | 441,936 |
| 17 වන වගන්තිය යටතේ (ඈ) | 2,061 | 2,116 | 523,067 | 842,023 | 1,365,090 | 580,734 | 966,286 | 1,547,021 | 395,760 | 413,280 |
| 16 වන වගන්තිය යටතේ | 549 | 535 | 26,020 | 9,027 | 35,048 | 25,793 | 8,738 | 34,530 | 29,394 | 28,656 |
| කර්මාන්ත අමාත්‍යාංශය | | | | | | | | | | |
| ලියාපදිංචි වූ සමාගම් (ඈ) | 2,876 | 3,020 | - | - | 207,996 | - | - | 208,934 | ලැ.නො. | ලැ.නො. |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත.
සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධානවලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත අමාත්‍යාංශය

### විශේෂ සටහන 2
## ආයෝජක ආකර්ෂණය උදෙසා ගෝලීය ශ්‍රේණිගත කිරීම්


ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සහ පුද්ගලික අංශයේ ව්‍යාපාරවලට අදාළ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය ආයෝජකයන්ගේ සහභාගිත්වය පසුගිය දශකය තුළ විශේෂයෙන්ම කැපී පෙනුණි. එසේ වුවද, ඉතිරිකිරීම් සහ ආයෝජන අතර කාලයක් මුළුල්ලේ පවතින පරතරය හමුවේ, ප්‍රමාණවත් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා, රටේ සංවර්ධන වේගය අඩාල කරන ප්‍රධාන බාධකයක් බවට පත්ව ඇත. එම දුෂ්කරතා රටේ ආර්ථික වර්ධනය, සේවා නියුක්තිය සහ ආදායම් බෙදීයාම කෙරෙහි බහුවිධ බලපෑම් ඇතිකර තිබේ. වත්මන් තත්ත්වය සලකා බැලීමේ දී, විශේෂයෙන්ම, ගෝලීය වසංගතයත් සමඟ බැඳුණු අනාගතය පිළිබඳ අවිනිශ්චිතතා හේතුකොටගෙන මැදි හා දිගු කාලීන ආර්ථික වර්ධනය සහ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා, අධික ලෙස විදේශ ණය මත යැපීම අවම කරගැනීම ඇතුළු දැඩි අභියෝග රැසකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදුව තිබේ. මෙවැනි පසුබිමක් තුළ, ණය නොවන විදේශ විනිමය ගලා ඒමේ ප්‍රධාන ප්‍රභවයක් වශයෙන් සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාව දරන උත්සාහය දෙගුණ කොට තිබේ. එහිදී, ශ්‍රී ලංකාවේ ගෝලීය ශ්‍රේණිගත කිරීම් (සංඛ්‍යා සටහන වි.ස. 2.1) වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කොට විවිධ සමාජ ආර්ථික පැතිකඩ ඔස්සේ විදේශ ආයෝජකයින්ට වඩාත් ආකර්ෂණීය වන අයුරින් ශ්‍රී ලංකවේ ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වේ.

**සංඛ්‍යා සටහන වි.ස. 2.1**
**ආයෝජකයන් සඳහා වැදගත් වන දර්ශක කිහිපයක්**

| දර්ශකය | ශ්‍රී ලංකාව (නවතම ශ්‍රේණිගත කිරීම) | ප්‍රශස්තම |
|---|---|---|
| ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය (Ease of Doing Business Index) - 2020 | 99/190 | නවසීලන්තය 1/190 |
| ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකය (Global Competitiveness Index) - 2019 | 84/141 | සිංගප්පූරුව 1/141 |
| දූෂණ සංජානන දර්ශකය (Corruption Perception Index) - 2020 | 94/180 | ඩෙන්මාර්කය 1/180 නවසීලන්තය |

ලෝක බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකයෙහි[1] රටවල් 190ක් අතරින් 99 වන ස්ථානය ලබා ගැනීමට 2020 වසරේ දී ශ්‍රී ලංකාව සමත් වූ අතර, එය 2019 වසර හා සැසඳීමේ දී එක් ස්ථානයකින් ඉදිරියට පැමිණීමකි. ක්ෂේත්‍ර 10ක් කේන්ද්‍ර කරගත් මෙම දර්ශකයේ ශ්‍රී ලංකාවට අදළ සමස්ත අගය 61.8ක් ලෙස වාර්තා විය. එමෙන්ම, ලෝක ආර්ථික සමුළුව විසින් සම්පාදනය කරනු ලබන ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයෙහි[2] රටවල් 141ක් අතරින් 84 වැනි ස්ථානය ලබා ගැනීමට ශ්‍රී ලංකාව 2019 වසරේ දී සමත් වූ අතර, එය ද පෙර වසර හා සැසඳීමේ දී එක් ස්ථානයකින් ඉදිරියට පැමිණීමකි. ඉහත දර්ශක දෙකටම අදළ වාර්තා මගින් ආයෝජක විශ්වසනීයත්වයට හා තරගකාරිත්වයට බාධා එල්ල කෙරෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳව කරුණු ඉස්මතු කොට ඇත. ඒ අනුව, විදේශ ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම මෙන්ම දේශීය ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා අවධානයට යොමු විය යුතු සහ කාලීන ප්‍රතිව්‍යුහගත කිරීම්වලට ලක් විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර පහත පරිදි දැක්විය හැකිය. (රූප සටහන වි.ස. 2.1)

**රූප සටහන වි.ස. 2.1**
**ආයෝජක ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර**




### සාර්ව ආර්ථික ස්ථායීතාව

අඩු සහ ස්ථාවර උද්ධමනය ඇතුළු සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවකි. අස්ථාවර ආර්ථික වාතාවරණයක් තුළ ව්‍යාපාරයක අනාගත කාර්යසාධනය සහ ලාභදායිත්වය පිළිබඳව නිවැරදි පුරෝකථන සැකසීම දුෂ්කරය. විදේශීය හා රාජ්‍ය මූල්‍ය අංශවල ක්‍රියාකාරිත්වය අනුව සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් පවත්වා ගැනීම අභියෝගාත්මක වුවද, පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද විචක්ෂණශීලී මූල්‍ය ප්‍රතිපත්තියේ සහාය ඇතිව උද්ධමනය මැද

1 ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය ලෝක බැංකුව විසින් සම්පාදනය කරනු ලබයි. එහි නවතව වාර්තාව https://www.doingbusiness.org/en/reports/global-reports/doing-business-2020 යොමුව හරහා ලබා ගත හැකිය.

2 ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකය ලෝක ආර්ථික සමුළුව විසින් සම්පාදනය කරනු ලබයි. එහි නවතම වාර්තාව https://www.weforum.org/reports/global-competitiveness-report-2019 යොමුව හරහා ලබා ගත හැකිය.

තනි අගය මට්ටමේ පවත්වාගෙන යාමට හැකි විය. කෙසේ වුවද, ණය ගතිකයන් සඳහා ලද අවම ලකුණු ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, 2019 වසරේ දී ශ්‍රී ලංකාව ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ 'සාර්ව ආර්ථික ස්ථායීතාව' යටතේ 118 වන ස්ථානයට පත් විය. මෙවැනි ගෝලීය ශ්‍රේණිගත කිරීම් තුළ ශ්‍රී ලංකාවට ඉහළ ස්ථානයක් හිමි කර ගැනීමේ දී ජාතික ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ අපේක්ෂා කරන පරිදි දැඩි රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වාගෙන යාමට කැපවීම අත්‍යවශ්‍ය වේ.

**ශ්‍රම වෙළඳපොළ**

ශ්‍රම වෙළඳපොළෙහි පවත්නා කුසලතා සහ රැකියා අතර නොගැලපීම, ඉහළ යන ශ්‍රම පිරිවැය, වෘත්තීය සමිතිකරණය සහ කම්කරු නීති අනුව ඉහළ වන්දි ගෙවීමට සිදුවීම වැනි ශ්‍රම වෙළඳපොළ අනම්‍යතා විදේශීය ආයෝජකයින්ගේ දැඩි අවධානය යොමු වන තවත් කරුණකි. ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ 'ශ්‍රම වෙළඳපොළ' අනුව ශ්‍රී ලංකාව මේ වනවිට රැඳී සිටින්නේ 118 වන ස්ථානයේය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විදේශීය ශ්‍රමිකයින් බඳවා ගැනීමේ පහසුව, අභ්‍යන්තර ශ්‍රම සංචලතාව සහ සේවය අත්හිටුවීමේ දී අදාල වන පිරිවැය සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් හිමිකර ගැනීමයි. පවත්නා කම්කරු නීති යටතේ, බලාත්මකව පවත්නා ගිවිසුම් අවසන් කිරීමේ දී, විදේශ ආයෝජකයන්ට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන අතර, අභ්‍යන්තර ශ්‍රම සංචලතාව නාගරික හා උපනාගරික ප්‍රදේශවලට පමණක් සීමා වී තිබීම හේතුවෙන් ශ්‍රම සැපයුමේ හිඟතාවක් ද පවතී. ශ්‍රම බලකාය සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය වන අතරම, විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ දේශීය ආයෝජන වැඩිදියුණු කිරීම තුළින් රැකියා උත්පාදනය කිරීම ද ඒ හා සමානව වැදගත් වේ. විශේෂයෙන්ම, ඉදිරියේ දී ශ්‍රී ලංකාව ඉහළ ආර්ථික වර්ධන මාවතකට පිවිසීමට ඇති සූදානමත් සමඟ කුසලතා කල්තියා හඳුනා ගැනීම සහ විවිධ වෘත්තීය පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය දැනටමත් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් වඩාත් ඵලදායී වනු ඇත. එමෙන්ම, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ ද කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීම සහ ඒ ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති ඇරඹීම සමඟ රටට ප්‍රතිලාභ අත්කර දීමට දායක වනු ඇත.

**රාජ්‍ය ප්‍රතිපත්ති**

රටක ආර්ථික හා විදේශ ප්‍රතිපත්ති, එම රට සම්බන්ධයෙන් ආයෝජකයින්ගේ මතය තීරණය වීමට ඍජුවම බලපාන සාධකයකි. එමෙන්ම, ආයෝජක සබඳතා සඳහා ශක්තිමත් පදනමක් ඇති කිරීමට ස්ථිර ප්‍රතිපත්ති සහිත ස්ථාවර හා ශක්තිමත් රජයක් පැවතීම සැමවිටම ප්‍රයෝජනවත් වේ. පවත්නා ව්‍යාපෘති හා ගිවිසුම් අවලංගු කිරීම් මගින් විදේශ ආයෝජන පිළිබඳ ස්ථාවරය නිතර වෙනස් කිරීම, විදේශ ආයෝජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි පමුණුවනු ඇත. මීට අමතරව, ලොව පුරා බොහෝ රජයන්ට පොදු විවේචනයක් වන දූෂණය සම්බන්ධයෙන් ගත් කල, 2020 වසරේ දී රටවල් 180ක් අතරින් ඩෙන්මාර්කය සහ නවසීලන්තය අවම දූෂණ සහිත රටවල් ලෙස නම් කර ඇති දූෂණ සංජානන දර්ශකය තුළ ශ්‍රී ලංකාව ලබා ඇත්තේ 94 වන ස්ථානයයි. එබැවින්, ආයෝජක හිතකාමී පරිසරයක් ඇති කිරීමේ දී දූෂණය මැඩපැවැත්වීම සඳහා දරන අඛණ්ඩ උත්සාහය ශක්තිමත් කිරීම ද තීරණාත්මක සාධකයක් බවට පත් වේ.

**බදු ව්‍යුහය**

සරල හා ඵලදායී බදු ක්‍රමයක් පැවතීම, ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා රටකට ඇති ආකර්ෂණය ඉහළ නැංවීමට ඉවහල් වේ. ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය නිරන්තර වෙනස්වීම්වලට බඳුන්වීම, දිගුකාලීන ව්‍යාපාර සැලසුම්කරණයේ දී ආයෝජකයන් මුහුණ දෙන තීරණාත්මක ගැටලුවකි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් විසින් වාර්ෂිකව සිදු කරන බදු ගෙවීම් සංඛ්‍යාව 36ක් වන අතර, බදු ගෙවීම සඳහා වැය කරනු ලබන වාර්ෂික සාමාන්‍ය කාලය පැය 129කි. ඒ අනුව, 2020 වසරේ දී ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ පහසුව පිළිබඳ දර්ශකයේ 'බදු ගෙවීම්' යටතේ ශ්‍රී ලංකාව 142 වන ස්ථානයට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය මෑතක දී වඩාත් සරල ව්‍යුහයක් සහිතව යාවත්කාලීන කරන ලද අතර, ව්‍යාපාර වර්ධනයට ඉවහල් වන පරිදි වත්මන් බදු ප්‍රතිපත්තිය මැදිකාලීනව සංශෝධනවලින් තොරව පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා රජය උනන්දු වේ. බදු වාර්තා ගොනු කිරීම සහ අනෙකුත් සේවා නවීකරණය කිරීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම, බදු ක්‍රම සරල කිරීමට උපකාරී වනවා මෙන්ම පැහැර හැරීමකින් තොරව නිසි කලට ගෙවීම් කිරීමට බදු ගෙවන්නන් පෙළඹවීමට ද අනුබලයක් වේ. තවද, ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) මගින් බදු ගෙවීමේ දී තාක්ෂණය භාවිත කිරීම ඉහළ නැංවීම සඳහා දරන අඛණ්ඩ උත්සාහයන් ද ආයෝජක ආකර්ෂණය සඳහා වාසිදයක වනු ඇත. මෙසේ, බදු ක්‍රමය හැකි තරම් සරල කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒමට බලධාරීන් දැනටමත් ක්‍රියාත්මක වී ඇති නමුදු සැලකිය යුතු වැඩ කොටසක් නිම කිරීමට නියමිතව පවතී.

**වෙළඳ විවෘතභාවය**

තීරුබදු ව්‍යුහයේ සංකීර්ණත්වය, තීරුබදු නොවන බාධක පැවතීම සහ දේශසීමා නිෂ්කාශන කටයුතුවල පවත්නා අඩු කාර්යක්ෂමතාව හේතුවෙන්, ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ රටවල් 141ක් අතරින්, ඉතා අඩු වෙළඳ විවෘතභාවයක් ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව 140 වන ස්ථානයට පත්ව ඇත. කලාපීය වෙළඳ සබඳතා ඇති කරගැනීමේ දී ශ්‍රී ලංකාවේ පවත්නා පසුගාමී ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන, ගෝලීය සැපයුම් දම ජාලයන් හා සම්බන්ධ වීමේ දී අවාසිදායක තත්ත්වයක් ඇති වී තිබේ. රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සියලු විදේශ වෙළඳ ගිවිසුම් මේ වනවිට නැවත සලකා බලමින් තිබෙන අතර, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ පාර්ශ්වකරුවන් සමඟ ද්විපාර්ශ්වික වෙළඳ ශේෂයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට අපේක්ෂිතය.

2

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුගත වීම**

ශ්‍රී ලංකාව, නවීන සන්නිවේදන තාක්ෂණයට අනුගත වීම අඛණ්ඩව සිදු කරන නමුත්, කර්මාන්ත අංශයේ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම ප්‍රශංසනීය මට්ටමක නොපවතී. කොවිඩ්-19 වසංගත කාලයේ දී රාජ්‍ය අංශය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයේ සැලකිය යුතු දියුණුවක් සිදු වුවද, එය තවමත් පුද්ගලික අංශය හා සමාන තත්ත්වයක නොපවතී. ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ, 'තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුගත වීම' සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව 107 වන ස්ථානයට පත් වී ඇති අතර, බ්‍රෝඩ්බෑන්ඩ්, ෆයිබර් සහ අන්තර්ජාල තාක්ෂණයන් භාවිතය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම මේ සඳහා හේතු වී ඇත. ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර තලයේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් මෙන්ම ජාත්‍යන්තර ව්‍යාපෘතිවල නිරත වන සමාගම් බිහි කර ඇත. එබැවින්, සන්නිවේදන තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම දේශීය වශයෙන් සිදු කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතී. එමගින් දේශීය වෘත්තිකයන්ට ඉඩප්‍රස්ථා සැලසෙන අතර බුද්ධි ගලනය ද වැළැක්වෙනු ඇත. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් මගින් මෑතකාලීනව ස්ථාපිත කරන ලද තොරතුරු තාක්ෂණ කර්මාන්ත කලාප (තොරතුරු තාක්ෂණ උද්‍යාන) සහ අනෙකුත් ඉලක්කගත ව්‍යාපෘති, තොරතුරු තාක්ෂණ භාවිතයේ සමස්ත මට්ටම වැඩිදියුණු කිරීම සඳහා දයක වී ඇති අතර, මෙවැනි උත්සාහයන් වඩාත් ශක්තිමත් කිරීම ආයෝජන ආකර්ෂණය සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

**නීතිමය ක්‍රියාදාමයන්**

නීතිමය කරුණක් විසඳීම සඳහා දින 1,318ක සාමාන්‍ය කාලයක් සහිතව ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳ දර්ශකයේ 'නෛතික ගිවිසුම් බලාත්මක කිරීම' යටතේ ශ්‍රී ලංකාව 164 වන ස්ථානයට පත් වී ඇත. අධිකරණ ක්‍රියාදාමයන් කඩිනම් කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීමට මෑතකාලීනව පියවර ගෙන තිබේ. ඊ-උසාවි (e-courts) හඳුන්වා දීමටත්, දිගු කලක් තිස්සේ පවත්නා නඩු නිශ්චිත කාලරාමුවක් තුළ විභාග කිරීම කඩිනම් කිරීමටත් අවශ්‍ය මූලික කටයුතු සිදුකෙරෙමින් පවතී. එසේ වුවද, නීතිමය ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු වැඩ කොටසක් තවදුරටත් කළ යුතුව පවතී. ඉඩම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ පවත්නා අනම්‍ය ස්වභාවය සහ ඉඩම් හිමිකාරිත්වයට අදාළ යල්පැනගිය නීති හේතුවෙන් විවිධ ව්‍යාපෘති සඳහා ඉඩම් නිදහස් කර ගැනීමේ දී ආයෝජකයින්ට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වේ. එබැවින් ආයෝජන සඳහා පහසුකම් සැලසීමට නීති පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වේ. ව්‍යාපාරිකයන්ගේ සහ ආයෝජකයන්ගේ ක්ෂණික විසඳුම් ලබා දිය යුතු නඩු විසඳීම සඳහා බේරුම්කරණ මධ්‍යස්ථානයක් සහ අතිරේක වාණිජ අධිකරණ පිහිටුවීම ද සමස්ත නීති පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ප්‍රයෝජනවත් වනු ඇත.


**යටිතල පහසුකම් ජාලය**

යටිතල පහසුකම් යනු ආයෝජනයට පහසුකම් සලසන අනෙකුත් සියලුම අංග එකට බැඳ තබන ඉතා වැදගත් අංගයකි. ඒ අනුව, මාර්ග ජාලයන් හා අනෙකුත් නවීන මගී ප්‍රවාහන ක්‍රම, අති නවීන වරාය හා ගුවන්තොටුපළ, ප්‍රමාදයන් හා බාධාවන්ගෙන් තොරව උපයෝගීතා පහසුකම් සැපයීම ආයෝජන ආකර්ෂණය සඳහා ඉතා වැදගත් වේ. පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාව යටිතල පහසුකම් ජාලය වැඩිදියුණු කිරීම වේගවත් කළ අතර, එමගින් ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ 'යටිතල පහසුකම්' සම්බන්ධයෙන් 61 වන ස්ථානය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. එසේ වුවද, මාර්ග සම්බන්ධතාව, ප්‍රවාහන සේවාවල කාර්යක්ෂමතාව සහ උපයෝගීතා පහසුකම් ලබා ගැනීමේ පහසුව පිළිබඳව තවදුරටත් ගැටලු පවතී. මෙම ගැටලු නිරාකරණය කිරීම, අනාගතයේ දී ආයෝජකයින් මෙරටට වඩාත් ආකර්ෂණය කර ගැනීමට හේතු වනු ඇත.

**ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා බලධාරීන් විසින් සිදු කරන ලද ආයෝජක සමුළු සහ අනෙකුත් බොහෝ ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල දී ගෝලීය ආයෝජක ප්‍රජාවෙන් ලැබුණු ධනාත්මක ප්‍රතිචාර අනුව පෙනී යන්නේ, භූගෝලීය පිහිටීම අනුව හිමිව ඇති සුවිශේෂී වාසිදයක තත්ත්වයත් සමග වඩාත් ආකර්ෂණීය ආයෝජන පරිශ්‍රයක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇති බවයි. එලෙස ආයෝජක ප්‍රජාවෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබුණ ද, ඉහත සාකච්ඡා කළ දුර්වලතා හේතුවෙන් ප්‍රමාණවත් තරම් විදේශ ආයෝජන ගලාඒම් සිදු වී නොමැත. ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකයේ ශ්‍රී ලංකාවට අදළ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් දැනටමත් ආරම්භ කර ඇති අතර, ශ්‍රී ලංකාවට අදළ අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමට ද එය උපකාරී වනු ඇත. එමෙන්ම, ආයෝජන සඳහා අදළ සියලු පහසුකම් සැලසීමේ තනි ස්ථානයක් (One-Stop Shop) ස්ථාපනය කිරීම ද අනාගත ආයෝජකයන් දිරිගැන්වීම සඳහා වූ රජයේ උත්සාහයට අනුබලයක් වනු ඇත. මේ අතර, කොළඹ වරාය නගර කොමිෂන් සභාව පිහිටුවීම ඔස්සේ ලොව අනෙකුත් ආයෝජන මර්මස්ථාන හා සමාන වූ ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරයක් නිර්මාණය වීමෙන් ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ගලාඒම ප්‍රශස්ත මට්ටමකට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අනුව, කොවිඩ්-19 වසංගතයත් සමග ඇති වූ සංකීර්ණ අභියෝග ජය ගන්නා අතරම, උපායමාර්ගික ආයෝජන හවුල්කරුවන් සමග තිරසාර ආයෝජන සබඳතා ඇති කරගැනීම උදෙසා, ඉහත හඳුනාගත් දුර්වලතා මගහරවා ගැනීම ඉලක්ක කරගත් ක්‍රමවේදයක් ඔස්සේ අඛණ්ඩ උත්සාහයක නිරත විය යුතුය.

**2.10 රූප සටහන**
**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (අ)**
**(එ.ජ.ඩොලර් මිලියන)**




(අ) ණය ද ඇතුළත්ව

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම, රුපියල් බිලියන 406.3ක් වූ අතර, එය 2019 වසරට සාපේක්ෂව සියයට 91.4ක අඩුවීමකි. ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වගන්ති යටතේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම, පිළිවෙළින්, රුපියල් බිලියන 1,547.0ක් සහ රුපියල් බිලියන 34.5ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 13.0ක සමස්ත අඩු වීමකි.

## පවත්නා සම්පත් සහ උපයෝජනය

ආර්ථිකයේ පවතින සමස්ත සම්පත් ප්‍රමාණය පවත්නා මිල අනුව 2019 වසරේ දී වාර්තා කළ සියයට 4.1ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 5.1කින් පහළ යන ලදී. මේ සඳහා දේශීය සම්පත් වන දළ දේශීය නිෂ්පාදිතය මෙන්ම විදේශීය සම්පත් වන ආනයන ද 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී පහත වැටීම හේතු විය. ස්ථාවර මිල අනුව ද, දේශීය මෙන්ම විදේශීය සම්පත්වල පහළ යෑමක් දක්නට ලැබුණි. පවත්නා මිල අනුව සම්පත්වල උපයෝජනය සලකා බැලීමේ දී ඉන් වැඩි ප්‍රමාණයක් 2020 වසරේ දී පරිභෝජනය සඳහා උපයෝජනය කරන ලද අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 66.0ක් විය. කෙසේ වුවද, ආයෝජන සඳහා උපයෝජනය කරන ලද සම්පත් ප්‍රමාණය 2020 වසරේ දී සමස්ත සම්පත් උපයෝජනයෙන් සියයට 20.5ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. තවද, අපනයන කටයුතු සඳහා උපයෝජනය කරන ලද සම්පත් ප්‍රමාණයෙහි ද පහළ යෑමක් දක්නට ලැබුණි. මේ අතරතුර දී, ප්‍රධාන


**2.12 සංඛ්‍යා සටහන**
**සම්පත් සංයුතිය සහ උපයෝජනය**
**(පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය (%) | | වර්ධනය (%) | |
|---|---|---|---|---|
| | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 |
| **1. සම්පත්** | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 77.4 | 81.3 | 5.1 | -0.3 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 22.6 | 18.7 | 0.9 | -21.8 |
| **එකතුව** | **100.0** | **100.0** | **4.1** | **-5.1** |
| **2. උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 61.3 | 66.0 | 7.4 | 2.1 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 21.0 | 20.7 | 8.1 | -6.4 |
| තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම | -0.2 | -0.2 | -108.0 | -22.2 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 17.9 | 13.5 | 5.5 | -28.5 |
| **එකතුව** | **100.0** | **100.0** | **4.1** | **-5.1** |

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.11 රූප සටහන**
**2020 වසරේ ආර්ථිකය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.

වශයෙන්ම පරිභෝජන මෙන්ම ආයෝජනවල දක්නට ලැබුණු පහත වැටීම හේතුවෙන් ස්ථාවර මිල අනුව සම්පත් උපයෝජනය ද පහළ යන ලදී.

### ඉතුරුම්

**ආර්ථිකයේ දේශීය ඉතුරුම් මෙන්ම ජාතික ඉතුරුම් ද 2020 වසරේ දී පවත්නා මිල අනුව තවදුරටත් පහළ යන ලදී.** පෞද්ගලික ඉතුරුම්වල දක්නට ලැබුණු සුළු වර්ධනය මෙන්ම, ප්‍රධාන වශයෙන් බදු අඩු කිරීම සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ආර්ථික කටයුතුවල දක්නට ලැබුණු පසුබෑමත් සමඟ රාජ්‍ය ආදායමෙහි පහළ යෑම තුළින් රජයේ නිර්-ඉතුරුම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ද හේතුවෙන් දේශීය ඉතුරුම් 2020 වසරේ දී සියයට 9.1කින් පහළ යන ලදී. ඒ අනුව, දේශීය ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී වාර්තා කළ සියයට 20.7හි සිට 2020 වසරේ දී සියයට 18.9ක් දක්වා පහළ යන ලදී. මේ අතර, රුපියල් වටිනාකම අනුව ශුද්ධ ප්‍රාථමික ආදායම සහ ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම වසර තුළ දී වර්ධනයක් වාර්තා කළ ද, දේශීය ඉතුරුම්වල පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී ජාතික ඉතුරුම් සියයට 3.6කින් පහළ යන ලදී. මේ අනුව, 2020 වසරේ දී ජාතික ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 23.9ක් දක්වා පහළ යන ලදී. මෙලෙස, ජාතික ඉතුරුම්වල පහත වැටීමක් දක්නට ලැබුණ ද, ආයෝජනවල දක්නට ලැබුණු සැලකිය යුතු පහළ යෑම හේතුවෙන්, 2019 වසරේ දී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 2.1ක් වූ ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය, 2020 වසරේ දී සියයට 1.4ක් දක්වා අඩු විය.

## 2.6 ආදායම

**දළ මෙහෙයුම් අතිරික්තය ආර්ථිකයේ ආදායම් ජනනය කරනු ලබන ප්‍රධාන සංරචකය ලෙස 2020 වසරේ දී ද පැවති අතර සේවක ආදායම් සහ නිෂ්පාදනය මත වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) ආදායම් ජනනය කරනු ලැබූ අනෙක් සංරචක විය.** දළ මෙහෙයුම් අතිරික්තය 2020 වසරේ දී පවත්නා මිල අනුව ද.දේ.නි. සඳහා සියයට 63.4ක දායකත්වයක් දක්වමින් සියයට 0.7කින් සුළු වශයෙන් වර්ධනය විය. මෙම අඩු වර්ධනය කෙරෙහි වසර තුළ දී ශුද්ධ මෙහෙයුම් අතිරික්තයෙහි දක්නට ලැබුණු මන්දගාමී වර්ධනය ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ආදායම් ජනනය කරනු ලබන අනෙකුත් ප්‍රධාන සංරචක සැලකීමේ දී වසර තුළ දී සේවක ආදායම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර නිෂ්පාදනය මත වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) පහළ ගියේය. ආයතනික අංශ අනුව ආදායම් ජනනය කිරීම සැලකීමේ දී, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය, මූල්‍ය නොවන ආයතන අංශය, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය පිළිවෙළින් සමස්ත ආදායම සඳහා වැඩිම දායකත්වයන් සපයන ලදී.

**2.13 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| කාණ්ඩය | රුපියල් මිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 |
| 1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | 15,012,953 | 14,972,995 | 5.1 | -0.3 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 11,902,168 | 12,146,234 | 7.4 | 2.1 | 79.3 | 81.1 |
| පෞද්ගලික | 10,485,180 | 10,589,745 | 7.3 | 1.0 | 69.8 | 70.7 |
| රජය | 1,416,989 | 1,556,489 | 8.1 | 9.8 | 9.4 | 10.4 |
| 3. ආයෝජන | 4,030,195 | 3,778,482 | -5.5 | -6.2 | 26.8 | 25.2 |
| 4. දේශීය ඉතුරුම් | 3,110,785 | 2,826,761 | -2.9 | -9.1 | 20.7 | 18.9 |
| පෞද්ගලික | 3,001,308 | 3,238,268 | 18.2 | 7.9 | 20.0 | 21.6 |
| රජය (ඈ) | -96,162 | -169,740 | -34.1 | -76.5 | -0.6 | -1.1 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -919,410 | -951,721 | 13.4 | -3.5 | -6.1 | -6.4 |
| 6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඉ) | -432,250 | -405,184 | -10.9 | 6.3 | -2.9 | -2.7 |
| 7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඉ) | 1,030,690 | 1,154,429 | 3.1 | 12.0 | 6.9 | 7.7 |
| 8. ජාතික ඉතුරුම් | 3,709,225 | 3,576,005 | -2.7 | -3.6 | 24.7 | 23.9 |

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මුදල් අමාත්‍යාංශයෙන් ලද දත්තවලට අනුව, රාජ්‍ය ආදායම, වියදම සහ රාජ්‍ය මූල්‍ය ශේෂවල තක්සේරු අගයන්වලට හිඟ ගෙවීම් සඳහා සිදුකල ගැලපීම ඇතුළත් කර ඇත.
(ඉ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයවලින් වෙනස් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

**2.14 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2019 (ඇ) | | | | 2020 | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.නො.ගෘ.සේ.ආ.* අංශය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.නො.ගෘ.සේ.ආ.* අංශය |
| **සේවක ආදායම්** | **34.2** | **6.6** | **27.9** | **31.3** | **32.5** | **7.9** | **30.4** | **29.2** |
| **දළ මෙහෙයුම් අතිරික්තය** | **35.5** | **4.9** | **1.9** | **57.6** | **34.7** | **5.7** | **1.5** | **58.1** |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 39.0 | 5.6 | 0.6 | 54.8 | 37.7 | 6.4 | 0.7 | 55.2 |
| මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | - | - | - | 100.0 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 41.4 | 4.0 | 12.5 | 42.1 | 43.3 | 5.5 | 8.7 | 42.5 |
| **නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර)** | **83.7** | **15.8** | **-** | **0.4** | **85.5** | **14.2** | **-** | **0.3** |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **35.3** | **5.5** | **10.2** | **48.9** | **34.1** | **6.4** | **10.9** | **48.6** |

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
* ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.7 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 21.919ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** ඒ අනුව, 2019 වසර තුළ දී සියයට 0.6ක් ලෙස වාර්තා වූ ජනගහන වර්ධන වේගය, 2020 වසර තුළ දී සියයට 0.5ක් දක්වා තවදුරටත් පහත වැටුණි. සමස්ත ජනගහන වර්ධනයට වැඩිම දායකත්වයක් ලබා දෙන ලද්දේ පිළිවෙළින් නැගෙනහිර සහ බස්නාහිර පළාත් වන අතර, අඩුම දායකත්වය වාර්තා වූයේ උතුරු සහ උතුරු මැද පළාත්වලිනි. පෙර පැවති ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2020 වසරේ දී ද බස්නාහිර පළාත මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් ඉහළම කොටස වූ සියයට 28.1කට හිමිකම් කියන ලද අතර, පිළිවෙළින් මධ්‍යම සහ දකුණු පළාත් මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 12.7කට සහ සියයට 12.2කට හිමිකම් කියන ලදී. මේ අතර, උතුරු පළාත මෙම වසරේ දී ද, මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් අඩුම කොටස වූ සියයට 5.3කට හිමිකම් කියන ලදී.

**2.15 සංඛ්‍යා සටහන**

**පළාත් මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| පළාත | 2019 | | 2020 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය |
| බස්නාහිර | 6,149 | 1,711 | 6,165 | 1,716 |
| මධ්‍යම | 2,766 | 496 | 2,781 | 499 |
| දකුණ | 2,654 | 493 | 2,669 | 496 |
| උතුර | 1,143 | 138 | 1,152 | 139 |
| නැගෙනහිර | 1,729 | 185 | 1,746 | 187 |
| වයඹ | 2,551 | 340 | 2,563 | 341 |
| උතුරු මැද | 1,377 | 141 | 1,386 | 142 |
| ඌව | 1,376 | 165 | 1,387 | 166 |
| සබරගමුව | 2,058 | 418 | 2,070 | 421 |
| **මුළු එකතුව** | **21,803** | **348** | **21,919** | **350** |

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ශ්‍රම බලකාය

**ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය වන ශ්‍රම බලකාය,[6] 2019 වසරේ වාර්තා වූ මිලියන 8.592 සිට, 2020 වසරේ දී මිලියන 8.467ක් දක්වා පහළ යන ලදී.** ඒ අනුව, ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2019 වසරේ වාර්තා වූ මිලියන 7.832 සිට, 2020 වසරේ මිලියන 8.273ක් දක්වා ඉහළ යන ලදී. ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයේ සැලකිය යුතු වර්ධනය සඳහා රැකියා අහිමි වූ පුද්ගලයන්ට රැකියාවක නියුතු වීමට ඇති අවස්ථා හෝ රැකියා අවස්ථා සක්‍රීය වශයෙන් සෙවීමට ඇති අවස්ථා තාවකාලිකව අහිමි වීම හේතු විය. රැකියාවක නියුතු වීමට දක්වූ උනන්දුවක් නොමැති ස්වභාවය සඳහා, කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා පැන වූ සංචරණ සීමා, නව රැකියා අවස්ථා අඩුවීම හේතුවෙන් ඇති වූ අධෛර්යමත් වීම් සහ වසංගතය පැතිරීමත් සමඟ ඇති වූ සෞඛ්‍යමය අවදානම බොහෝ දුරට හේතු විය.

6 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය, එනම් සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

2

**2.16 සංඛ්‍යා සටහන**

**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2019 | 2020 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික (ඇ) |
| **කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000** | **16,424** | **16,690** | **16,793** | **16,562** | **16,913** | **16,739** |
| **ශ්‍රම බලකාය පුද්ගලයන් '000** | **8,592** | **8,504** | **8,435** | **8,454** | **8,473** | **8,467** |
| සේවා නියුක්ත | 8,181 | 8,020 | 7,977 | 7,968 | 8,031 | 7,999 |
| සේවා වියුක්ත | 411 | 483 | 458 | 487 | 442 | 468 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)** | **52.3** | **51.0** | **50.2** | **51.0** | **50.1** | **50.6** |
| පුරුෂ | 73.0 | 72.4 | 71.7 | 72.5 | 70.9 | 71.9 |
| ස්ත්‍රී | 34.5 | 32.5 | 31.6 | 32.4 | 31.7 | 32.1 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) තාවකාලික
(ඇ) 2020 කාර්තු හතරෙහි සාමාන්‍යය
(ඈ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ශ්‍රම බලකායේ පහළ යෑම සහ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයේ ඉහළ යෑම අනුව, ශ්‍රම බලකාය සහ කුටුම්භ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2019 වසරේ පැවති සියයට 52.3හි සිට 2020 වසරේ දී සියයට 50.6ක් දක්වා අඩු විය.** මේ අනුව, 2019 වසරේ දී පිළිවෙළින් සියයට 73.0ක් සහ සියයට 34.5ක් ලෙස වාර්තා වූ පුරුෂ සහ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික 2020 වසරේ දී පිළිවෙළින් සියයට 71.9ක් සහ සියයට 32.1ක් දක්වා අඩු විය. ශ්‍රම බලකායේ දිගුකාලීනව පැවත එන ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඇති අසමතුලිතතාවයන් වසංගත තත්ත්වය හමුවේ තවදුරටත් වර්ධනය වූ අතර, 2019 වසරේ දී සියයට 38.5ක් ලෙස වාර්තා වූ ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව පරතරය, 2020 වසරේ දී සියයට 39.8ක් දක්වා වර්ධනය විය.

## සේවා නියුක්තිය

**සේවා නියුක්ත ජනගහනය,[7] 2019 වසරේ වාර්තා වූ මිලියන 8.181 සිට 2020 වසරේ දී මිලියන 7.999ක් දක්වා පහළ ගියේය.** මේ සඳහා කර්මාන්ත සහ සේවා අංශවල බොහෝ දුරට තාවකාලික හා අනියම් සේවා නියුක්තියේ සිදු වූ පහළ යෑම හේතු විය. කෙසේ වුවද, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්තිකයන්ගේ වර්ධනයක් දක්නට ලැබුණු අතර, කොවිඩ්-19 වසංගතය හමුවේ පැනවූ ආනයන සීමා සහ ගෝලීය ආහාර සැපයුම් ජාල සඳහා ඇති වූ බාධා මධ්‍යයේ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම අරමුණු කොටගෙන රට වසා දැමූ කාලපරිච්ඡේදයේ දී කෘෂිකර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගෙන යාමට ලබා දෙන ලද සහන මේ සඳහා බොහෝ දුරට හේතු විය. ඒ අනුව, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්ත ජනගහනය 2019 වසරේ පැවති සියයට 25.3හි සිට 2020 වසරේ දී සියයට 27.1ක් දක්වා වර්ධනය විය. මේ අතර, කර්මාන්ත අංශයේ සහ ආර්ථිකයේ රැකියා අවස්ථා උත්පාදනය කරන ප්‍රමුඛතම අංශ වන සේවා අංශයේ සේවා නියුක්තිය, 2019 වසරේ පිළිවෙළින් පැවති සියයට 27.6 සහ සියයට 47.1 සිට 2020 වසරේ දී පිළිවෙළින් සියයට 26.9 සහ සියයට 46.0 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, වසංගත කාලපරිච්ඡේදයේ දී ඇති වූ නව ඉල්ලුම හේතුවෙන්, පෞද්ගලික ආරක්ෂණ උපාංග නිෂ්පාදනය කරන්නන් සහ භාණ්ඩ ප්‍රවාහකයන් වැනි නව රැකියා අවස්ථා බිහි විය. මේ අතර, සමස්ත සේවා නියුක්තියෙන් සියයට 42.7ක ඉහළම දායකත්වයක් දක්වමින් පෞද්ගලික අංශය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රැකියා උත්පාදන අංශය ලෙස 2020 වසරේ දී ද අඛණ්ඩව රැඳී සිටි අතර, තමාගේම වැඩ කටයුතු කරන්නන් ද සමස්ත සේවා නියුක්තියට සියයට 33.2ක දායකත්වයක් දක්වන ලදී.

**මහ බැංකුව විසින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයට අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2019 වසරේ වාර්තා වූ මිලියන 1.467 සිට 2020 වසරේ දී මිලියන 1.528ක් දක්වා වර්ධනය විය.** අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් මෙම සමීක්ෂණයට ඇතුළත්ය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ දක්නට ලැබුණු වර්ධනය සඳහා රජය විසින් රැකියා විරහිත උපාධිධාරීන් 60,000කට සහ අඩු ආදායම්ලාභී පුද්ගලයන් 100,000කට රැකියා ලබා දීම හේතු විය.

**2.17 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2019 (අ) | 2020 (ආ) | ප්‍රතිශත වෙනස 2020/2019 (ආ) |
|---|---|---|---|
| රාජ්‍ය (ඇ) | 1,221,735 | 1,290,370 | 5.6 |
| අර්ධ රාජ්‍ය (ඈ) | 245,273 | 237,951 | -3.0 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,467,008** | **1,528,321** | **4.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන සහ පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

7 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේව්‍යයන්, තමාගේම වැඩකටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට අදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

**විශේෂ සටහන 3**

## කොවිඩ්-19 තුළින් බලගැන්වුණු නිවසේ සිට රැකියාවේ නිරත වීම

**හැඳින්වීම**

කොවිඩ්-19 වසංගතය මගින් ශ්‍රම වෙළඳපොළ කෙරෙහි පෙර නොවූ ආකාරයේ බලපෑමක් ඇති කරන ලදී. වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග යටතේ සුපුරුදු රැකියා පරිශ්‍රයන් තුළ සිට රැකියාවේ නිරත වීමට සීමා පැනවුණු බැවින් සම්මත රැකියා චර්යා හා පිළිවෙත් විශාල වෙනසකට බඳුන් විය. ඒ අනුව, වසංගත තත්ත්වය පැවති කාලසීමාවේ දී, නිවසේ සිට රැකියාවේ නිරත වීම (work from home), නම්‍යශීලී පැය ක්‍රමයට සේවයේ යෙදීම සහ සේවා මුර ක්‍රමය අනුව සේවයේ යෙදීම වැනි ක්‍රමවලට ආයතන යොමු විය. මෙම වසංගතයට පෙර සිටම ඇතැම් කර්මාන්ත හා වෘත්තීන් විසින් නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය ක්‍රියාත්මක කළ ද, වසංගත තත්ත්වය යටතේ ව්‍යාපාර හා සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑමේ තාවකාලික පියවරක් ලෙස එම ක්‍රමය වඩාත් ජනප්‍රිය විය. එමෙන්ම, කොවිඩ්-19 වසංගතය, සේවා නියුක්තිකයන් සේවා ස්ථානයට පැමිණීම, භෞතික වශයෙන් සමීපව සේවයේ යෙදීම මෙන්ම, කාර්යාල පරිශ්‍ර සැලසුම් කිරීම යන කරුණුවල වැදගත්කම පිළිබඳව, බොහෝ ආයතනවලට නැවත සිතා බැලීමට පෙර නොවූ අන්දමේ අවස්ථාවක් සලසා දෙන ලදී. නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය සම්බන්ධයෙන් පවතින අභියෝග අනුව, එය පුළුල් වශයෙන් දිගුකාලීනව ක්‍රියාත්මක කිරීමේ දී සේවායෝජකයා සහ සේවාදායකයා අතර ඇති හවුල් වගකීම, කැපවීම සහ අන්‍යෝන්‍ය අවබෝධය ඇතුළු බොහෝ සාධක මත එහි සාර්ථකත්වය රඳා පවත්නා බව පෙනී යයි.

**නිවසේ සිට රැකියාවේ නිරත වීමේ වාසි, අවාසි සහ අභියෝග**

නිවසේ සිට රැකියාවේ නිරත වීම මගින් සේවා නියුක්තිකයන්ට මෙන්ම සේවායෝජයන්ට ද බොහෝ ප්‍රතිලාභ සැලසෙයි. සේවා නියුක්තිකයා සම්බන්ධයෙන් ගත් කල, ගමනාගමන කාලය හා වියදම් අඩුවීම, රැකියාවේ නිරත වන ස්ථානයට හා කාලසීමාවට අදාළව වැඩි පහසුවක් තිබීම, බාධා අවම වීම සහ රැකියාව හා පෞද්ගලික ජීවිතය අතර වැඩි සමබරතාවක් පවත්වාගත හැකිවීම ආදිය මෙමගින් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ වේ. සේවායෝජකයා සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ජලය, විදුලිය වැනි උපයෝගිතා සඳහා පිරිවැය අඩුවීම, කාර්යාල පරිශ්‍රවලට අදාළ මෙහෙයුම් වියදම් අඩුවීම, අතිකාල හා ප්‍රවාහන දීමනා වැනි කාර්යමණ්ඩල වියදම් අඩුවීම, සේවා නියුක්තිකයන්ගේ ඵලදායිතාව වැඩිදියුණු වීම, සේවා බැඳීම හා සේවා තෘප්තිය වැඩිදියුණු වීම සහ සේවයෙන් ඉවත්ව යෑම් අඩුවීම යනාදිය ප්‍රධාන ප්‍රතිලාභ වශයෙන් දැක්විය හැකිය. මීට අමතරව, දිගු කලක් පුරා පහළ මට්ටමක පවත්නා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය සුදුසු විසඳුමක් බව අඛණ්ඩව පෙන්වා දී ඇත. එබැවින්, නිවසේ සිට රැකියාවේ නිරත වීම, රටේ ශ්‍රම සම්පත් භාවිතයට ගැනීමේ හැකියාව පුළුල් කිරීමේ ක්‍රමවේදයක් වන අතර, එමගින් දිගුකාලීනව රටේ ආර්ථික වර්ධනය ඉහළ නංවනු ඇත. එමෙන්ම, වාහන ගමනාගමනය අවම වීමේ ප්‍රතිඵලයක් ලෙස කාබන් විමෝචනය අඩුවීම තුළින් වායු දූෂණය අඩුවීම, රථ වාහන තදබදය අඩුවීම හා ඛනිජ තෙල් ආනයනය අඩුවීම, සහ නාගරීකරණය අඩුවීම ද, නිවසේ සිට රැකියාවේ නිරත වීම ඔස්සේ රටක් වශයෙන් අත්කරගත හැකි අනෙකුත් ප්‍රතිලාභයන්ය.

එසේ වුවද, නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් සීමා හා අභියෝගවලට මුහුණ දීමට සිදු වේ. මූලික වශයෙන්, සියලුම කර්මාන්ත, වෘත්තීන් හා රැකියා කාර්යයන් සඳහා මෙම ක්‍රමය යොදාගත නොහැකිය. වසංගත කාලසීමාව තුළ විද්‍යුත් තැපැල හරහා සන්නිවේදනය විධිමත් කර තිබුණ ද, විශේෂයෙන්ම, රාජ්‍ය අංශයේ ලිපිලේඛන හා කාර්යපටිපාටීන් තවමත් පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය වී නොමැති හෙයින්, රැකියා පරිශ්‍රයෙන් බැහැරව රැකියා කටයුතුවල නිරත වීමේදී ඇතිවන අතපසුවීම් හා අකාර්යක්ෂමතා සාපේක්ෂ වශයෙන් ඉහළ යා හැකිය. උදාහරණයක් ලෙස, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම්, සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව සම්බන්ධයෙන් පවතින ගැටලු සහ ස්වයංක්‍රීය නොවන ක්‍රියාවලි සහ කාර්යපටිපාටි බහුලව පැවතීම ආදිය හේතුවෙන්, කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ පියවරක් වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කරන ලද නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය පූර්ණ වශයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා දීමට සමත් නොවුණි. මීට අමතරව, රාජ්‍ය අංශය තුළ දැනට පවත්නා ඩිජිටල්කරණ තත්ත්වය අනුව, සාමාන්‍ය ජනතාවට සපයනු ලබන සේවා සේවකයෙකු නිරත වීමෙන්ම සිදු කළ යුතු බැවින්, රාජ්‍ය අංශයේ බොහෝ රාජකාරි සඳහා නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය සුදුසු නොවේ. මේ අනුව, මෙම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම්, නිවසේ සිට රැකියාවේ නිරත විය හැකි කර්මාන්ත,

වෘත්තීන් සහ රැකියා කාර්යයන් පැහැදිලිව හඳුනාගෙන, ඒ පිළිබඳව තක්සේරුවක් කොට ඒ සඳහා අවශ්‍ය නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් නීති සම්පාදනය කළ යුතුය. තවද, සේවකයන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතා මට්ටම, සේවකයන් සඳහා අවශ්‍ය අධීක්ෂණ මට්ටම, භෞතික යටිතල පහසුකම් මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් හා උපකරණවල ප්‍රමාණවත්බව හා ගුණාත්මකබව, සේවකයන්ගේ නිවෙස්වල පවත්නා වාතාවරණය සහ අනෙකුත් පෞද්ගලික වගකීම් අනුව රැකියා පරිශ්‍රයෙන් පරිබාහිරව රැකියාවේ නිරතවීමට ඇති හැකියාව සෑම සේවකයෙක් සඳහාම වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ යුතුය (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2020). විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව සියයට 30.8ක් හා ඩිජිටල් සාක්ෂරතාව සියයට 46.0ක් වශයෙන් අඩු මට්ටම්වල පැවතීම (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020) සහ පරිගණක දත්ත ආරක්ෂණය සම්බන්ධයෙන් පවතින ගැටලු සහගත තත්ත්වයන් මෙහිදී සැලකිය යුතු ප්‍රධාන කරුණු අතර වේ. එම නිසා, නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය දිගුකාලීනව පවත්වාගෙන යෑම සඳහා සන්නිවේදන ජාල ආවරණය පුළුල් කිරීම සහ පරිගණක හා ඩිජිටල් සාක්ෂරතාව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, දුරස්ථ සේවා නියුක්තියේ දී අවශ්‍ය වන සන්නිවේදන ජාල යටිතල පහසුකම් සහ සයිබර් ආරක්ෂාව වැඩිදියුණු කිරීම මෙන්ම, ලිපි ලේඛන කටයුතු සහ අනුමත කිරීමේ ක්‍රියාපටිපාටි ඩිජිටල්කරණය කිරීම හරහා මාර්ගගත (online) සේවා පරිසරයක් කරා පරිවර්තනය වීම ද වැදගත් වේ.

නිවසේ සිට රැකියාවේ නිරත වීම වැනි ක්‍රම විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්‍ෂණය භාවිතයෙන් රාජකාරි කිරීම, සන්නිවේදනය කිරීම හා අන්තර් සබඳතා පවත්වා ගැනීම පිළිබඳව නිසි පුහුණුවක් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම, මෙම ක්‍රමය ක්‍රියාවට නංවන මූලික අවස්ථාවේ දී ම රැකියාවේ නිරත විය යුතු ස්ථානය හා නිවසේ සිට රැකියාවේ නිරත වීමට අදාළ කාලසටහන (පූර්ණ හෝ අර්ධ) සහ කාලය (නිශ්චිත කාලයක් සහිත හෝ රහිත) සම්බන්ධයෙන් සේවා ගිවිසුමේ සඳහන් නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම හෝ එම කරුණු සම්බන්ධයෙන් ආයතන ප්‍රතිපත්තිවල පැහැදිලි මාර්ගෝපදේශ ඇතුළත් කිරීම ඉතා අත්‍යවශ්‍ය වේ (කේරි, 2020). තවද, බැඳියාවන් අතර ගැටුම් අවම කොට ප්‍රශස්ත ඵලදායිතා මට්ටමක් ළඟා කර ගැනීම සඳහා, සේවා ගිවිසුමට ඇතුළත් නියමයන් හා කොන්දේසි මගින් හෝ ආයතන ප්‍රතිපත්තිවලට අදාළ මාර්ගෝපදේශ මගින්, භෞතික යටිතල පහසුකම් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම ඇතුළු ඊට අදාළ වියදම්වල වගකීම් දරන පාර්ශ්වය, නිශ්චිත සන්නිවේදන පහසුකම් සහ රටේ නීතියට අනුකූලව සේවා කාලසීමාව සහ විවේක කාලය පිළිබඳ විධිවිධාන ද ස්ථාපිත කළ යුතුය (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2020).

නිවසේ සිට රැකියාවේ නිරත වීමේ දී ඇතිවන බාධා හේතුවෙන් රැකියා කටයුතු පිළිබඳ අවධානය, උනන්දුව හා ඵලදායිතාව අඩුවීම, රැකියාවේ වගකීම් සහ පවුලේ වගකීම් සම්බන්ධයෙන් පැනනැගෙන අර්බුද, ගුණාත්මකබව අඩු යටිතල පහසුකම් හා සන්නිවේදන ජාල පහසුකම් සහ සේවකයන් සෘජු අධීක්ෂණයකට ලක් නොවීම යනාදිය නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමයේ පවත්නා අවාසිසහගත තත්ත්වයන් වේ. ඒ අනුව, සේව්‍ය-සේවක සම්බන්ධතාවයේ ඇති වන විශාල වෙනස සැලකිල්ලට ගනිමින් සේවකයන්ගේ අභිප්‍රේරණ මට්ටම් සහ කාර්යසාධනය ඉහළ මට්ටමක පවත්වා ගෙන යෑම සඳහා සේවක සහභාගිත්වය තහවුරු කිරීම, කළමනාකරණය, පාලනය සහ කාර්යසාධනය මැනීම සම්බන්ධයෙන් නව ක්‍රමවේදයන් ද ස්ථාපිත කළ යුතුය. මෙහිදී, සාම්ප්‍රදායික විධාන සහ කළමනාකරණ ක්‍රමවලින් බැහැරව ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණය (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2020) සහ නිරන්තර සන්නිවේදනය හා පරීක්ෂා කිරීම් වැනි ක්‍රම කෙරෙහි යොමු විය හැකිය. මීට අමතරව, ආයතන සංස්කෘතිය සහ කණ්ඩායම් බැඳීම පවත්වා ගැනීම සඳහා මෙන්ම, සේවකයන්ගේ මානසික ආතතිය අවම කිරීම සඳහා නව සන්නිවේදන හා අන්තර් සබඳතා පවත්වා ගැනීමේ ක්‍රම ස්ථාපිත කළ යුතුය. මේ අතර, නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය දිගු කාලීනව යොදා ගන්නේ නම් අධික ලෙස රාජකාරිවල නිරත වීමෙන් සේවකයන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට ඇති විය හැකි දිගු කාලීන බලපෑම් වළක්වා ගැනීමට මෙන්ම රැකියාවේ වගකීම් සහ පවුලේ වගකීම් අතර ඇති විය හැකි අසමතුලිතතා වළක්වා ගැනීමට සහ දිගුකාලීනව ප්‍රශස්ත ඵලදායිතා මට්ටමක් පවත්වා ගැනීම සඳහා, සේවා කාල වේලාවන් නිශ්චිතව වෙන්කොට හඳුනා ගැනීමට ප්‍රමුඛතාව ලබා දිය යුතුය.

සේවකයන් විසින් ද ප්‍රශස්ත ඵලදායිතා මට්ටමක් පවත්වා ගැනීමේ දී පෞද්ගලික ජීවිතය තුළින් ඇති විය හැකි බාධා අවම කිරීම සඳහා යැපෙන්නන්ගේ රැකවරණය තහවුරු කිරීම ඇතුළු කුටුම්බ වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිසි සැලසුම් යෙදීම තුළින් සිය රාජකාරි වගකීම් හා කුටුම්බ වගකීම් අතර පැහැදිලි සීමාවන් තබා ගත යුතුය. ඊට අමතරව, සේවා කණ්ඩායම සමඟ නිරන්තරයෙන්

සන්නිවේදනයේ නිරතවීම හා අන්තර් සබඳතා පවත්වා ගැනීම මගින් මානසික හා ශාරීරික සෞඛ්‍යය මනාව පවත්වා ගැනීම මෙන්ම, නිසි භෞතික යටිතල පහසුකම් භාවිත කිරීම ද, නිවසේ සිට රැකියාවේ නිරත වීම මගින් දිගු කාලීන ප්‍රශස්ත ඵලදායිතා මට්ටමක් අත්කර ගැනීම සඳහා ඉවහල් වේ.

**ඉදිරි දැක්ම**

කොවිඩ්-19 වසංගතය මගින්, නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය පුළුල් වශයෙන් භාවිතයට ගැනීම පිළිබඳව විමසා බැලීම සඳහා අවස්ථාව උදා වූ අතර, මෙම සාධනීය පරිවර්තනය වසංගත කාලයෙන් පසුවත් පවත්වාගෙන යෑම තුළින් ශ්‍රම බලකා සහභාගිත්වය හා ඉතුරුම් ඉහළ නැංවීම හරහා මැදි හා දිගු කාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් අත්කරගත හැකිවනු ඇත. කෙසේ වෙතත්, නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය වඩා සාර්ථක කරගැනීමට සහ එමගින් අපේක්ෂිත උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන දුෂ්කරතා, අභියෝග සහ අවාසි සහගත තත්ත්වයන්ට පිළියම් යෙදීම අත්‍යවශ්‍ය වේ. තවද, රාජ්‍ය අංශය විසින් නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය ඵලදායීව යොදා ගැනීමට නම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම්, ඩිජිටල් පද්ධති සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව සම්බන්ධව විශාල තාක්ෂණික වෙනස්කම් සිදු කළ යුතුය. බොහෝ සේවායෝජකයන්ට එතරම් විශ්වාසයක් නොතිබූ ඩිජිටල් ක්‍රමවේද කාර්යාල සේවා කටයුතු සඳහා යොදා ගැනීම කොවිඩ්-19 වසංගතයට සමගාමීව ඇරඹුණු අතර, එය වැඩිදියුණු කර අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑම, සේවා නියුක්තිකයන්ගේ රාජකාරි හා පෞද්ගලික ජීවිතයේ සමබරතාව සහ තෘප්තිය වැඩිදියුණු කිරීමට මෙන්ම, ආර්ථිකය ඉහළ වර්ධන මාවතක් කරා යොමු කිරීමටත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත් ඉවහල් වන තිරසාර විසඳුමක් වනු ඇත.

මූලාශ්‍ර

1. Carey (2020), Details of new Telework Law approved by Congress, accessed 03 March 2021 <https://www.carey.cl/en/details-of-new-telework-law-approved-by-congress/>
2. Department of Census and Statistics, Computer Literacy Statistics - 2020 (First six months), accessed 03 March 2021 <http://www.statistics.gov.lk/PressReleases/ComputerLiteracystatistics-2020-Firstsixmonths>
3. International Labour Organization (2020), An employers' guide on working from home in response to the outbreak of COVID 19, accessed 03 March 2021<https://www.ilo.org/wcmsp5/groups/public/---ed_dialogue/--act_emp/documents/publication/wems_745024.pdf>


මුල්බැසගත් අවදානම් තත්ත්වයන් ඉස්මතු කරමින්, අවිධිමත් අංශයේ රැකියාවන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමකට ලක් විය. කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග සමඟ අවිධිමත් අංශයේ සේවකයන්ගේ ජීවනෝපාය අවස්ථාවන්ට දැඩි බාධා පැනනැගීම හේතුවෙන් මෙම අංශය විශාල බලපෑමකට ලක් විය. අවිධිමත් අංශයේ සේවකයන් කිසිදු සමාජ ආරක්ෂණ වැඩසටහනක් තුළින් ආවරණය නොවන බැවින් ඔවුන් ආපදා අවස්ථාවන්හි දී දරිද්‍රතා මට්ටමෙන් පහළට වැටීමට වඩාත්ම අවදානමක් ඇති නිසා, මෙවැනි අවස්ථාවල දී ඔවුන් තාවකාලික ආදායම් සහායක් අවශ්‍ය කණ්ඩායමක් බවට පත්ව ඇත. ඒ අනුව, විශාල සේවක ප්‍රමාණයක් ඇතුළත් වන අවිධිමත් අංශයේ සේවකයන්ගේ සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් ඉලක්ක කරගත් සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ගවල දැඩි අවශ්‍යතාවක් පවතී.

## සේවා වියුක්තිය

2019 වසරේ සියයට 4.8ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ති අනුපාතිකය, 2020 වසරේ දී සියයට 5.5 දක්වා ඉහළ යන ලද අතර, මේ සඳහා කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම මූලික වශයෙන් හේතු විය. ඒ අනුව, සේවා වියුක්ත ජනගහනය,[8] 2019 වසරේ වාර්තා වූ මිලියන 0.411ට සාපේක්ෂව 2020 වසරේ දී මිලියන 0.468ක් දක්වා ඉහළ යන ලදී. වසංගත සමයේ දී සේවා වියුක්ති අනුපාතිකය බලාපොරොත්තු

8 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාර ගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

**2.12 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (%)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


වූ තරම් ඉහළ යෑමක් දක්නට නොලැබුණි. මේ සඳහා, රැකියා අහිමි වූ පුද්ගලයන්, පැවති වාතාවරණය යටතේ තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් රැකියා අවස්ථා සෙවීම නතර කිරීම සහ නව රැකියා අවස්ථාවල නොයෙදීම නිසා සේවා නියුක්ත ජනගහනයේ මුළු අඩුවීම සේවා වියුක්ත ජනගහනයට පරිවර්තනය නොවීම හේතු විය. කෙසේ වුවද, 2020 වසරේ දී ඌන සේවා නියුක්තිය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, වැඩ කරන ලද මුළු පැය ගණන සැලකිය යුතු ලෙස අඩුවීම තුළින් පෙන්නුම් කළ පරිදි ශ්‍රම බලකායේ ඵලදායී ධාරිතාව නිසි ලෙස උපයෝගී කර නොගැනීම මේ සඳහා හේතු වී ඇත.

**සේවා නියුක්ත කාණ්ඩවල ඇති අසමානතාවයන් තවදුරටත් තීව්‍ර කරමින්, ස්ත්‍රී, තරුණ සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික 2020 වසරේ දී ද සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මේ අනුව, 2019 වසරේ සියයට 7.4ක් වූ ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ දී සියයට 8.4ක් දක්වා වර්ධනය විය. මේ අතර, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය ද 2019 වසරේ දී වාර්තා වූ සියයට 3.3හි සිට 2020 වසරේ දී සියයට 4.0ක් දක්වා වර්ධනය විය. ස්ත්‍රී ශ්‍රම බලකායේ සේවා නියුක්ති නිපුණතාවල දීර්ඝකාලීනව පවත්නා ගැටලු සහ සේවා නියුක්තිය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඇති නොගැලපීම්, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය මෙන් දෙගුණයකටත් වඩා ඉහළ මට්ටමක පැවතීමට හේතු විය.

## විදේශ සේවා නියුක්තිය

**කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමග 2019 වසරේ 203,087ක් ලෙස වාර්තා වූ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් 2020 වසරේ දී 53,713ක් දක්වා සියයට 73.6කින් තියුණු ලෙස පහළ යන ලදී.** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ලියාපදිංචි කරන ලද සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ පිටත්ව යෑම් සඳහා පැනවූ තාවකාලික තහනම, ශ්‍රී ලංකාවෙන් ශ්‍රමය ලබා ගන්නා රටවල් විසින් පැන වූ සංචරණ සීමා, විදේශ ශ්‍රමිකයන් බඳවා ගැනීම් නවතා දැමීම සහ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුම පහළ යෑම මේ සඳහා හේතු විය. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී පුරුෂ සහ කාන්තා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් පිළිවෙළින් සියයට 73.5කින් සහ සියයට 73.7කින් පහළ යන ලදී. විදේශ රැකියා සඳහා වූ මුළු පිටත්ව යෑම්වල පහත වැටීමට සමගාමීව, වෘත්තීය, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන සියලු නිපුණතා කාණ්ඩ යටතේ පිටත්ව යෑම් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී පහළ යන ලදී. මේ අතර, 2020 වසරේ දී සමස්ත විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වලින් සියයට 82.0කට දායක වෙමින්, මැදපෙරදිග කලාපය තවදුරටත් රැකියා සඳහා විදෙස්ගතවීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතම ස්ථානයේ පැවතිණි. එසේ වුවද, මැදපෙරදිග කලාපයේ රැකියා සඳහා පිටත්ව යෑම් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 74.5කින් පහත වැටුණි.

**2.13 රූප සටහන**
**නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**




මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**ශ්‍රී ලංකාවෙන් ශ්‍රමය ලබා ගන්නා රටවල් තුළ කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් දැඩි බලපෑමකට ලක් විය.** කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල යුරෝපා කලාපය තුළ ව්‍යාප්ත වීමත් සමග නොසන්සුන් වූ ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්, 2020 වසර ආරම්භයේ දී ඉතාලිය, දකුණු කොරියාව සහ අනෙකුත් යුරෝපීය රටවල සිට බහුලව ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන ලදී. කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා පැමිණෙන වාණිජ ගුවන් යානා සඳහා ගුවන් තොටුපළ වසා දැමීමත් සමග සැලකිය යුතු සංක්‍රමණික ශ්‍රමිකයන් පිරිසක් නැවත මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් පසු වූ අතර, වසංගතය පැතිරීමත් සමග ඇති වූ සෞඛ්‍ය අවදානම සහ ආර්ථික මන්දගාමී තත්ත්ව හේතුවෙන් කොන්ත්‍රාත් කාලසීමා අවසන් වීම්, රැකියා අහිමිවීම් හා වේතන කප්පාදු හමුවේ සංක්‍රමණික ශ්‍රමිකයන්ට මෙරටට පැමිණීමේ අවශ්‍යතාව වඩාත් තීව්‍ර විය. කොවිඩ්-19 වසංගතයේ බලපෑම හමුවේ දේශීය ශ්‍රම වෙළඳපොළ පත්ව ඇති අවදානම් තත්ත්වය හේතුවෙන්, නැවත මෙරටට පැමිණි සංක්‍රමණික ශ්‍රමිකයන්ට සහ මෙම අවදානම් තත්ත්වය

**2.18 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2018 (අ) | | 2019 (අ) | | 2020 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **211,211** | **100.0** | **203,087** | **100.0** | **53,713** | **100.0** |
| **මූලයන් අනුව** | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 66,703 | 31.6 | 69,278 | 34.1 | 18,304 | 34.1 |
| වෙනත් | 144,508 | 68.4 | 133,809 | 65.9 | 35,409 | 65.9 |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 129,712 | 61.4 | 122,257 | 60.2 | 32,453 | 60.4 |
| ස්ත්‍රී | 81,499 | 38.6 | 80,830 | 39.8 | 21,260 | 39.6 |
| **ශ්‍රම කාණ්ඩය අනුව** | | | | | | |
| වෘත්තීය | 9,005 | 4.3 | 9,861 | 4.9 | 2,929 | 5.5 |
| මධ්‍යම මට්ටම | 6,530 | 3.1 | 5,725 | 2.8 | 1,480 | 2.8 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 9,434 | 4.5 | 9,163 | 4.5 | 2,484 | 4.6 |
| පුහුණු ශ්‍රමික | 67,013 | 31.7 | 62,711 | 30.9 | 16,690 | 31.1 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 2,769 | 1.3 | 2,950 | 1.5 | 748 | 1.4 |
| නුපුහුණු ශ්‍රමික | 51,703 | 24.5 | 51,188 | 25.2 | 13,994 | 26.1 |
| ගෘහ සේවිකා | 64,757 | 30.7 | 61,489 | 30.3 | 15,388 | 28.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

යටතේ රටින් පිටත්ව යෑම් වැළැක්වීම නිසා විදේශ රැකියා අවස්ථා අහිමි වූ පුද්ගලයන්ට නව විදේශ රැකියා අවස්ථා පිළිබඳව නිරන්තරයෙන් සොයා බැලීමෙන් නැවත සේවයේ යෙදවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම, අනාගතයේ දී විදේශ රැකියා වෙළඳපොළ තුළ ඇතිවිය හැකි මෙවන් ආපදාවන්ට මුහුණ දීමට සුදුසු සමාජ ආරක්ෂණ පියවර ද ස්ථාපිත කළ යුතුය.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

**2020 වසරේ දී වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පහළ ගිය අතර, මේ සඳහා කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමට පැවති සීමා බොහෝ දුරට හේතු විය.** ඒ අනුව, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන සියයට 59.7කින් පහළ ගිය අතර, මේ සඳහා වැවිලි අංශයේ සහ වෙනත් පෞද්ගලික ආයතනවලට අදාළව සිදු වූ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණනේ සැලකිය යුතු පහළ යෑම හේතු විය. මීට අමතරව, වෙනත් පෞද්ගලික ආයතනවල වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සේවකයන්ගේ අඩුවීම හේතුවෙන් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සේවකයන්ගේ සියයට 19.5ක අඩුවීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව ඉහළ ගිය අතර, මේ සඳහා වැවිලි අංශයෙන් වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව ඉහළ යෑම හේතු විය.

**කාර්මික සමගිය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශය[9] විසින් 2020 වසරේ දී පියවර කිහිපයක් ගන්නා ලදී.** ඒ අනුව, මෙම අභියෝගාත්මක කාලසීමාව තුළ ඇති වූ කම්කරු ගැටලු විසඳීම සඳහා සේවක සංගම් සහ සේව්‍යයන් ඇතුළත් කාර්යසාධක බලකායක් කම්කරු අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලදී. මේ හරහා, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ අත්හිටුවන ලද ආයතනවල සේවකයන් රඳවා ගැනීම සම්බන්ධයෙන් සහ සියලුම සේවකයන් සේවයට කැඳවිය නොහැකි අවස්ථාවල දී, සේවකයන් සියලු දෙනාට සමානුපාතිකව මාසික වැඩ ලබා දීම සඳහා සේවාමුර ක්‍රමයක් හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එකඟතාවන්ට එළැඹෙන ලදී. තවද, 2020 මැයි සහ ජූනි මාසවල පැවරීමට ප්‍රමාණවත් වැඩ නොමැතිවීම හේතුවෙන් සේවකයන් නිවසේ රඳවා තිබූ අවස්ථාවල දී, මාසිකව අවසන් වරට සේවකයන්ට ගෙවන ලද මුළු වැටුපට අදාළ මූලික වැටුපෙන් සියයට 50ක ප්‍රතිශතයක් හෝ රුපියල් 14,500ක් යන දෙකෙන් සේවකයන්ට වඩාත් වාසිදායක විකල්පයට අනුව වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ද එකඟතාවයන්ට එළැඹෙන ලදී. මෙම එකඟතාවය, පළමුව 2020 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කළ අතර, ඉන් අනතුරුව නැවතත් 2020 දෙසැම්බර්

9 නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ නම 2020 අගෝස්තු 09 දින සිට බලපැවැත්වෙන පරිදි කම්කරු අමාත්‍යාංශය වශයෙන් වෙනස් කරන ලදී.

2

**2.19 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2017 | 12 | 1,885 | 5,643 | 21 | 9,027 | 54,436 | 33 | 10,912 | 60,079 |
| 2018 | 29 | 6,545 | 33,212 | 22 | 5,610 | 16,406 | 51 | 12,155 | 49,618 |
| **2019 (ආ)** | **9** | **1,981** | **28,363** | **16** | **5,630** | **27,689** | **25** | **7,611** | **56,052** |
| පළමු කාර්තුව | 4 | 807 | 2,521 | 9 | 4,748 | 26,197 | 13 | 5,555 | 28,718 |
| දෙවන කාර්තුව | 2 | 939 | 24,393 | 3 | 218 | 420 | 5 | 1,157 | 24,813 |
| තෙවන කාර්තුව | 2 | 206 | 1,304 | 2 | 151 | 302 | 4 | 357 | 1,606 |
| සිව්වන කාර්තුව | 1 | 29 | 145 | 2 | 513 | 770 | 3 | 542 | 915 |
| **2020 (ඇ)** | **13** | **1,936** | **9,375** | **15** | **4,189** | **13,215** | **28** | **6,125** | **22,590** |
| පළමු කාර්තුව | 1 | 298 | 596 | 4 | 189 | 884 | 5 | 487 | 1,480 |
| දෙවන කාර්තුව | 7 | 862 | 3,174 | 3 | 899 | 899 | 10 | 1,761 | 4,073 |
| තෙවන කාර්තුව | 4 | 682 | 5,323 | 7 | 3,052 | 11,236 | 11 | 3,734 | 16,559 |
| සිව්වන කාර්තුව | 1 | 94 | 282 | 1 | 49 | 196 | 2 | 143 | 478 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

31 දක්වා දීර්ඝ කරන ලද අතර, එලෙස දීර්ඝ කිරීම සඳහා සංචාරක අංශය හැර අනෙකුත් සියලුම අංශ සඳහා කම්කරු කොමසාරිස්වරයාගෙන් අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය කෙරිණි. මේ අතර, අනිවාර්ය අධ්‍යාපනය ලැබිය යුතු වයස් මට්ටම ඉහළ දැමීමට සමගාමීව, 1927 අංක 27 දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවා හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත, 1942 අංක 45 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යන පනත්හි සඳහන් වී ඇති සේවා නියුක්තිය සඳහා බලපාන අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ දමන ලදී. තවද, කම්කරු නීති යටතේ ඇති නඩු 16,000ක් විභාග කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ සහ කම්කරු විනිශ්චය සභාවලට අධිකරණ බලතල පැවරීම සඳහා විශේෂ ප්‍රතිපාදන පනතක් හඳුන්වා දීමට කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, තවත් පනත් කිහිපයක් සංශෝධනය කිරීම සඳහා කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා ගත් අතර, ඒ අනුව, නියෝග බලාත්මක කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා බලගැන්වීම, යම් සේවකයෙක් තමාගේ සේවය අත්හිටුවීම සම්බන්ධයෙන් අයදුම් කරන අවස්ථාවේ දී එම සේවකයා වෙනුවෙන් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර ලබා දීම, කම්කරු කොමසාරිස්වරයා විසින් සිදු කරන පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතු පාර්ශව වෙනුවෙන් නීතිඥවරයෙකුට පෙනී සිටීමට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කරමින්, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමට නියමිතව ඇත. තවද, සේවකයන්ගේ ජාතික අවම වේතනය මසකට රුපියල් 10,000 සිට මසකට රුපියල් 12,500ක් දක්වා ඉහළ දැමීම සඳහා නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කරමින් 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත ද, අලුතින් බඳවා ගත් සේවකයන් පිළිබඳ තොරතුරු යම් නිශ්චිත කාල පරාසයක් තුළ කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දීම අනිවාර්ය කෙරෙන ප්‍රතිපාදන ඇතුළත් කරමින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත ද සංශෝධනය කිරීමට නියමිතය. එමෙන්ම, වයස අවුරුදු 18ට අඩු තරුණ තරුණියන් සඳහා වන අන්තරාදායක රැකියාවන් ලැයිස්තුව යාවත්කාලීන කිරීමට 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත ද, සංශෝධනය කිරීමට නියමිතය. මීට අමතරව, වන්දි ගෙවීමේ සූත්‍රයට අනුකූල වූ උපරිම වන්දි මුදල රුපියල් මිලියන 1.2හි සිට රුපියල් මිලියන 2.5 දක්වා ඉහළ දමමින් 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ සේවකයන් වෙනුවෙන් ලබා දෙන උපරිම වන්දි මුදල රුපියල් මිලියන 0.5හි සිට රුපියල් මිලියන 2.0 දක්වා ඉහළ දමමින් 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත සංශෝධනය කිරීමට ද නියමිතය.

## ශ්‍රම ඵලදායිතාව

වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2019 වසරේ වාර්තා වූ රුපියල් 513.17හි සිට, 2020 වසරේ දී රුපියල් 577.17ක් දක්වා සියයට 12.5කින් ඉහළ යන ලදී. ශ්‍රම ඵලදායිතාවේ දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනයට, පිළිවෙළින් කර්මාන්ත සහ සේවා අංශවල දක්නට ලැබුණු සියයට 13.2ක සහ සියයට 22.4ක වර්ධනයන් හේතු විය. මේ අනුව, කර්මාන්ත සහ සේවා අංශවල ශ්‍රම ඵලදායිතාවයන් පිළිවෙළින් 2019 වසරේ වාර්තා වූ වැඩ කළ පැයකට රුපියල් 540.70 සහ රුපියල් 624.33 සිට 2020 වසරේ දී පිළිවෙළින් රුපියල් 611.89 සහ රුපියල් 764.29ක් දක්වා වර්ධනය විය. මෙම ඉහළ යෑම සඳහා, වැඩ කරන ලද පැයකට එකතු කළ අගයෙහි දක්නට ලැබුණු සාපේක්ෂව සුළු අඩුවීම මධ්‍යයේ වුවද කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමට පනවන ලද සීමා හේතුවෙන් වැඩ කරන ලද පැය ගණනේ දක්නට ලැබුණු සැලකිය යුතු අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෘෂිකර්මාන්ත අංශයෙහි ශ්‍රම ඵලදායිතාවෙහි දක්නට ලැබුණු ක්‍රමානුකූල ඉහළ යෑම වෙනස් කරමින්, මෙම අංශයේ 2019 වසරේ වැඩ කරන ලද පැයකට රුපියල් 192.46ක් ලෙස වාර්තා වූ ශ්‍රම ඵලදායිතාව 2020 වසරේ දී වැඩ කරන ලද පැයකට රුපියල් 177.54ක් දක්වා සියයට 7.8කින් පහළ යන ලද අතර, මේ සඳහා කෘෂිකර්මාන්ත අංශයේ ආකියාවන්හි නියුතු පුද්ගලයන් සංඛ්‍යාව වර්ධනය වීම මධ්‍යයේ වැඩ කරන ලද මුළු පැය ගණන ඉහළ යෑම සහ වැඩ කරන ලද පැයකට එකතු කළ අගයේ සිදු වූ පහළ යෑම හේතු විය. ශ්‍රම ඵලදායිතා මට්ටම අනුව, සේවා අංශය, ශ්‍රම සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කර ඇති අංශය වශයෙන් වාර්තා වූ අතර, කර්මාන්ත අංශය දෙවන ඉහළම ශ්‍රම ඵලදායිතා මට්ටම වාර්තා කළ අංශය ලෙසත්, කෘෂිකර්මාන්ත අංශය අවම ශ්‍රම ඵලදායිතා මට්ටම වාර්තා කළ අංශය ලෙසත් වාර්තා විය.

### 2.20 සංඛ්‍යා සටහන
### ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| ස්ථාවර (2010) මිල අනුව දළ එකතු කළ අගය (රුපියල් මිලියන) | **8,973,108** | **8,693,114** |
| කෘෂිකර්මාන්ත | 686,412 | 669,802 |
| කර්මාන්ත | 2,608,211 | 2,427,844 |
| සේවා | 5,678,485 | 5,595,469 |
| ශ්‍රම ඵලදයිතාව, වැඩ කරන ලද පැයක් සඳහා රුපියල් | **513.17** | **577.17** (ඇ) |
| කෘෂිකර්මාන්ත | 192.46 | 177.54 (ඇ) |
| කර්මාන්ත | 540.70 | 611.89 (ඇ) |
| සේවා | 624.33 | 764.29 (ඇ) |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වාර්ෂික වැඩ කරන ලද පැය ගණන, 2020 කාර්තු හතරෙහි එකතුව මත පදනම් වේ

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

2